

# එකම විසඳුම මෙයයි

ජේ. ආර්. ජයවර්ධන

භක්තිය, කරුණාව, හැඟීම කවරේද යත්ත අපට පියවි ඇසට පෙනෙන තරමට වඩා අසංඛෙය්‍ය වාරයක් වැඩි බවට ඇති සාක්කි ප්‍රමාණය ද අසංඛෙය්‍ය බව – නැතිනම් නිමක් නොමැති බව – අවධාරණයෙන් පැවසිය යුතුය.

## ශාසනයට නැකම්

අපිස් බවට හෙවත් අල්පේච්ඡතාවට ප්‍රතිඥ දී, ඇලුම් කරන සියලු දේ හැර දමා ප්‍රියයන්ගෙන් ඉවත් ව සසුන්ගත වන පැවිදි උතුමන් ගෙදරට වඩින කල, පෙරගමන් කොට ඉතිරෙන භක්ති ප්‍රේමයෙන් උත්වහන්සේලා පිළිගෙන, පා දෙවා ගෙතුළට වැඩම කරවා පිරුවට ඇතිරූ අසුන් මත වැඩ හිඳුවීමේ උතුම සිරිත ලෝකයටම පිළිබිඹු කරන බොදුනුවන් විසින් කළ හැකි වටිනාම පිංකම සාසනයට නැකම් කිව හැකි වන පරිදි දරුවෙකු හෝ ඥතියෙකු සසුනට පූජා කිරීම බව දන්නා ජේ. ආර්. ජයවර්ධන උතුමාණන් කවර අත්දමේ බෞද්ධයෙක්ද යන්න ඔප්පු කිරීමට ඇති ප්‍රධානතම නිදසුන එතුමාගේම බාල සොහොයුරා සසුන්ගත කිරීමයි.

අවුරුදු දෙදහස් පන්සියයකට අධික කාලයක් මේ රට පාලනය කළ රජවරු සිටියහ. වෙනත් පාලකයෝ සිටියහ. එහෙත් ශාසනයට නැකම කිව හැකි එකම රාජ්‍ය නායකයා අපේ මේ ජනාධිපති උතුමාණෝම ය. එනිසා එතුමන් පැවිදි උතුමන් ඉදිරියට ගොස් අනුගමනය කරන ඒ බොදුනු ක්‍රියාමාර්ගය ගැන අමුතුවෙන් කිවයුතු නොවේ. ඒ ක්‍රියාමාර්ගය වැරදි යයි යමෙක් පවසත් ද ? ඒ ක්‍රියාමාර්ගයෙන් රටට, ජනතාවට, ශාසනයට හානියක් වෙතැයි පැවසිය හැකි දිවක් සහිත ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ වේද ඔවුන් කර ගත්තේ ආනන්තරිය කර්මයට නොදෙවෙනි පාප කර්මයකි.

අනුන් ලවා පින් කරවා ගැනීම, අනුන් ලවා දන්දීම වැනි දෑ ජනාධිපති උතුමාණන්ට නුහුරුය. එතුමාණන් දනයෙහි ආනිශංස දනිති. නැත්නාට දීමේ උතුම් ගුණය බොදු මහෝපාසිකා තම මෑණියන්ගෙන් උරුමකොටගත් එතුමාණෝ මානෙල් වත්ත සඟසතුකොට පූජා කිරීමෙන් මහා සංඝරත්නය රැකුණොත් පමණක් ශාසනය රැකෙන බව අවබෝධ කොටැගෙන ඒ අනුව ක්‍රියාකිරීමෙන් දී ඇත්තේ විශිෂ්ඨ ආදර්ශයකි.

පුලත්තෙකුට තම ධනය වැය කොට කන්න කටක් නොදුන්, මහා සංඝ රත්නයට දන් පිඟානක් නොපිළිගැන්වූ ඇතැම උදවිය මහා සංඝරත්නය ඉදිරියේ නියම කරුණු වසන් කොට, අසත්‍ය වාටු බස් කතාවෙන් උන්වහන්සේලාගේ ගැලවුම්කාරයන් – ගැලවුම්කාරියන් වීමට ඉදිරිපත්ව

ජනාධිපති උතුමාණන්ගේ බෞද්ධ බැතිය, ශාසන ලැදියාව, භික්ෂු ගරුත්වය සුළුකොට තැකීමට තැත් කරන මුත්, ජනාධිපතිතුමාණන් වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම සැදැහැවත් බෞද්ධයෙකු බව පිළිගත්තා අපේ මහා සංඝරත්නය, එතුමාණන් අතින් රටට, දැයට, සමයට හෝ හානිකර කිසිදු ක්‍රියාවක් සිදු නොවන බව අවබෝධ කර ගෙන සිටීම ජනාධිපති උතුමාණන්ට තමා අදහස් කරන ක්‍රියාමාර්ගය සපුරා ගැනීමට මහා රුකුලක්ව ඇත.

## අහිංසා මාර්ගය

ජෝන් ද සිල්වා සමරුහලේ දී මහා සංඝරත්නය ඉදිරියේ තමා අදහස් කරන ක්‍රියාමාර්ගය පිළිබඳ අවංක විස්තරයක් කළ ජනාධිපතිතුමාණෝ තමන් ඉදිරියේ ඇති ත්‍රස්තවාදය අහෝසි කර දැමීම සඳහා ඇත්තේ ක්‍රම දෙකක් බවත්, ඉන් එකක් යුද්ධමය ක්‍රියාමාර්ගය වන අතර අනෙක අහිංසා මාර්ගයෙන් කැරෙන විසඳුමක් බවත් පවසා සිටියහ. තෝරා ගැනීමට ඇති ක්‍රියාමාර්ග දෙකකට සීමාවූ මොහොතක, වඩා යහපත්, වඩා හොඳ, ලෝක ජනතාව අනුගමනය කරන ක්‍රියාමාර්ගය තෝරාගැනීම බුද්ධිමතාගේ පිළිවෙතය. තමා මේ මාර්ග දෙක අතුරෙන් තෝරා ගත්තේ " අහිංසා මාර්ගය " යයි මහා සංඝ රත්නය ඉදිරියේ පවසා සිටිවිට එයට විරුද්ධ වන බුද්ධ පුත්‍රයාණ කෙනෙක් සිටිය නොහැකිය. ලෝකයේ අහිංසාවාදය දෙසූ ලොකුම අහිංසාවාදියා තුන්ලෝකාග්‍ර බුදු පියාණෝය. බුදු පියාණන් දෙසූ මගට පිළිපන් බුද්ධ පුත්‍රයන් වහන්සේලා අහිංසාවාදී මාර්ගයෙන් පිට අන් මාර්ගයක් අනුගමනය අනුමෝදන්නා බව ජනාධිපතිතුමාණෝ අවබෝධ කරගෙන සිටිති.

ඒ අහිංසාවාදී ක්‍රියාමාර්ගය ක්‍රියාත්මක කිරීමට තමා තෝරාගෙන ඇති මඟ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධනයක් කර එමගින් විසඳුමක් ලබාගැනීම විනා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බාහිරව නොවන බව ජනාධිපති උතුමාණෝ මහා සංඝරත්නයට පැහැදිලි කර දුන්හ. රට බෙදීමක් ගැන කියමින් සිහින ලෝකයක ජීවත්වන්නවුන් කොතරම් කෑගැසුවත්, මෙ ජනනායකයාණන් අතින් තම එවැන්නක් සිදුනොවන බව දැන් සනාථ වී අවසානයි.

ප්‍රශ්නයට විසඳීමක් පමාකිරීම රජයේ – ඒ කියන්නේ රාජ්‍ය නායකයාණන්ගේ – අදහස නොවේ. විසඳුම පමාවූ තරමට ඉන් අත්වන ප්‍රතිඵල ද භයානක වනු ඇත. මේ අවස්ථාව පැහැර හැරියොත්, උද්ගත විය හැකි තත්ත්වය ගැන ජනතාවට දැන් දැන් සෑහෙන අවබෝධයක් ලැබී තිබේ. යෝජිත පළාත් සභා පිහිටුවීමෙන් රට කැඩෙනු ඇත යන්න සම්පූර්ණ මිථ්‍යාවකි. දැනුදු මේ රට පාලනය කිරීම සඳහා පළාත් නවයකට බෙදා තිබෙන බව අමතක කරන ඇතැම් කණ්ඩායම රට බෙදීමක් ගැන දොඩවති.

යෝජිත ක්‍රමයෙන් අදහස් කරන්නේ දැනට වඩා වැඩි බලතල කොටසක් ඒ ඒ පළාත්වල මහජනයා විසින් තෝරාගනු ලබන නියෝජිතයන්ට පැවරීම යි.

බලතල පුළුල් වශයෙන් බෙදා දුන් තරමට මහ ආණ්ඩුවේ ශක්තිය වඩාත් තහවුරු වන බව පමණක් නොව ඒකීය ආණ්ඩුක්‍රමය ද දසත මුල් විහිදී ගිය මහා රුක්ෂයක් ශක්තිමත්ව කෙළින් සිටින අයුරෙන්ම ඍජුව සිටින බව පෙන්නා දිය යුතුව ඇත.

## අලුත්ම ප්‍රශ්නය

විසඳාලිය යුතු ප්‍රශ්නය කිසිවකුට අසාධාරණයක් නොවන අයුරින් විසඳාලීම රාජ්‍ය නායකයාණන්ගේ අධිෂ්ඨානය බව මහා සංඝරත්නය ඉදිරියේ පවසා සිටීමෙන් පසු දැන් එය ක්‍රියාත්මක වන බවට සැකයක් නැත. ඇරත් මහා මැතිවරණයට පෙර ජනතාව ඉදිරියේ දුන් ප්‍රතිඥාවක් ගැන ද ජනාධිපති උතුමාණෝ මහා සංඝරත්නය ඉදිරියේ පවසා සිටියහ. ඒ ප්‍රතිඥාව වූයේ කුමක් ද ? ද්‍රවිඩ ජනතාවට ඇති ඇතැම් ප්‍රශ්න සාකච්ඡා මාර්ගයෙන්ම විසඳන බවයි. මහජනයා මේ රජය හයෙන් පහක බලයක් සහිතව බලයට පත් කරන විට ඒ ප්‍රතිඥාව නොසලකා හැරියා විය නොහැකිය. එහෙත් තහන්නට ප්‍රශ්නයක් නැති නිසාදෝ ඇතැම් පක්ෂයක්, මේ ප්‍රශ්නය අවුල් කිරීමක් වශයෙන් අළුතෙන් ප්‍රශ්නයක් මතුකර සිටිති.

සිංහල පළාත් හත, කිසිදු ඉල්ලීමක් නොකර තිබියදී ඒ පළාත් හතටත් පළාත් සභා ක්‍රමය පවරන්නේ මන්ද ?" යනු එකී ප්‍රශ්නයයි. යෝජිත පළාත් සභා ක්‍රමයෙහි දක්නට ඇති විශේෂතම ලක්ෂණය එයයි.

රටේ කිසිම කොටසකට ජාති වශයෙන් හෝ ආගම් වශයෙන් හෝ වෙන අත්කිසි හේතුවක් නිසා හෝ කිසිදු වෙනස්කමක්, මදි පුංචිකමක් සිදු නොවන පරිද්දෙන් බලය සමසේ භුක්ති විඳිය හැකි පරිද්දෙන් තුලනාත්මකව බෙදා හැර තිබීම නිසා පළාත් සභා ක්‍රමය කෙරේ කිසිදු බියක් ඇතිකර ගැනීමට හේතුවක් නොපෙනේ. යම් අයුරකින් යෝජිත පළාත් සභා ක්‍රමය උතුරු හා නැගෙනහිර පළාත්වල පමණක් ක්‍රියාත්මක විය යුතුය යන්න පදනම් කොට ගෙන විසඳුමක් සකස් කරන ලද නම් යෝජිත පළාත් සභා ක්‍රමයට විරුද්ධ වන්නන් ගායනා කරන්නේ වෙනමම තාලයක් ද ?

## පාඩුව මහජාතියටමයි

කැලණිය ටයර් සංස්ථාවේ ජාතික සේවක සංගමය ඉදිරියේ කථාවක් කළ ජනාධිපති උතුමාණෝ යෝජිත පළාත් සභා පනතට විරෝධය වන්නන් වූවමනාවෙන්ම වසන් කරන්නට තැත් කරන ඉතා වැදගත්

# මහා සංඝරත්නයෙන් අවසර!

| | |
|---|---|
| පරි. අංක | 6663<br>~~6521~~ |
| වර්ග අංකය | ~~923~~ 808.5 |
| දිනය | |

# පෙරවදන

නායකත්වයේ විශිෂ්ඨතම ලක්ෂණය අනුගාමිකයන්ගේ විශ්වාසය දිනා ගැනීමයි. අනුගාමිකයෝ තම නායකයා කෙරේ විශ්වාසය තබති. " විශ්වාසා පරමා ඥාති " යනුවෙන් විශ්වාසයෙහි අගය දක්වූ තුන්ලෝ නා බුදුහිමිපාණෝ එයින් ගොඩනැගෙන අසීමිත බලවේගයෙහි උතුම් බව වදාළහ.

ඔවුනොවුන් කෙරේ දක්වන විශ්වාසය නමැති ඒ බලය උපයෝගී කොටගත් ආදියේ සිටියෝ මහා විස්කම් වැඩ කර පෙන්වූහ. වර්තමානයෙහි වූවෝ ඒ බලය ලෝකයාට කියාපාති. අනාගතයේ දී ද ඒ බලය ඒ වූ පරිද්දෙන්ම සමාජයේ අභිවෘද්ධිය පිහිට කොට ගත හැකි බව ජනතාවට උගන්වා තබති.

**අපේ ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන උතුමාණෝ මේ සිද්ධාන්තය ගුරුකොට ගෙන නායකත්වයට පත් රාජ්‍ය තාන්ත්‍රිකයෙකි. ප්‍රශ්නයක් පැන නැගුණ විට, ඒ ප්‍රශ්නය දෙස අග සිට මුලට බලා — හෙවත් අනුලෝම — ප්‍රතිලෝම වශයෙන් විමසා බලා — තීරණයක් ගැනීම සඳහා පෙර කළ පිනෙත් මෙන්ම ජන්මයෙන් ලද දයාදයෙන් ද වරම් ලද නායකයාණ කෙනෙකි. සිතත් කයත් බුද්ධියත් කාලයත් ජනතා සේවය සඳහාම කැප කළ මේ මහතාණන් අද තමා ඉදිරියේ ඇති ප්‍රශ්නයට පිළියම් සොයා ඒ පිළියමෙහි අගය තමා කෙරේ විශ්වාසය තැබූ ජනතාවට තේරුම්ගත හැකි පරිදි — අවබෝධ කරගත හැකි පරිදි — සිත්හි ධාරණය කරගත හැකි පරිදි විස්තර කරදීමේ උදාර වගකීම ඉටු කිරීමට ඉදිරිපත් වී සිටිති.**

ප්‍රශ්නය කුමක් ද ? යන්නට විස්තර අවශ්‍ය නැත. ප්‍රශ්න උද්ගත වීම ලෝක ස්වභාවයකි. ශිෂ්ටාචාරයේ ආරම්භයට පෙරත් ඉන් පසුවත් ලෝකයේ ප්‍රශ්න ඇති විය. බුද්ධිමත්හු ඒවා විසඳූහ. බලවත්හු හෙවත් ශක්තිමත්හු අව්බලයෙන් ඇතැම් ප්‍රශ්න විසඳා ගත්හ. තවත් කොටසක් ප්‍රශ්නයත් සමගම වැනසී ගියහ.

එහෙත් ජනසම්මතවාදය යටතේ ජනසම්මතයෙන් නායකත්වයට පැමිණ සිටින ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන උතුමාණන් රට කරවන කලත් මහා ප්‍රශ්නයක් පහළ වූයේ ඇයි ? යනු ඇතැමුන්ට ප්‍රහේළිකාවකි. එසේ වූයේ මන්දැයි ප්‍රශ්න කරති. ප්‍රශ්න ඇතිවීම ලෝක ස්වභාවයකි යන සිද්ධාන්තය යටතේ අප රටේ ද ප්‍රශ්නයක් — එනම්, " ත්‍රස්තවාදය " නැමැති ප්‍රශ්නයක් ඇතිවීමේ හේතුව ඇතැමුන්ට තේරුම් ගැනීම දුෂ්කර කරුණක් වනු නොබැරිය. විවිධ හේතූන් නිසා කාලයක් පැසවමින් පැවැති තුවාලයක් ඔඩු දුවන්නාසේ දැන් එය ඔඩු දුවන තත්ත්වයට පැමිණ ඇත.

එහෙත් ස්වභාව ධර්මය අනුව ඇතිවූ ඒ තත්ත්වය මේ මොහොතෙහි මෙතරම් උග්‍ර වූයේ ඇයි ?

එයට නියම ප්‍රතිකාරය ලබාදිය හැකි ජීවකයා — වෛද්‍යවරයා — පහළව සිටින බව සොබාදම් මාතාව දන්නා නිසාය.

ඒ ජීවකයා අපේ ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන උතුමාණෝය.

තමා ඉදිරියට පත් කරනු ලැබ සිටින රෝගියාගේ රෝග නිදානයත් රෝගයත් මෙයයි යන්න එතුමාණෝ මැනවින් වටහාගෙන සිටිති. එයට දිය යුතු ප්‍රතිකාරය මෙයයි, තීරණය කර ඇති එතුමාණෝ ඒ ප්‍රතිකාරය සාර්ථක ප්‍රතිඵල ගෙන දෙන්නක් බව නිසැකව අවබෝධ කරගෙන ඇතිවා පමණක් නොව, ඒ ප්‍රතිකාරය කර තම රටත්, ජනතාවත් ආරක්ෂා කර ගැනීම තමා කෙරේ පැවරී ඇති භාරදූර කාර්යය යන අවබෝධයෙන් ඒ කරුණු තමා කෙරේ විශ්වාසය තැබූ භාග්‍යමත් ජනතාවට වටහා දීමේ අරමුණින් දැන් ජනතාව ඉදිරියට ගොස් සිටිති.

කුලදේවතාවුන් වහන්සේලා යන දයාබර නමින් හඳුන්වනු ලබන අපේ මහා සංඝරත්නයට තම අදහසත් ක්‍රියාමාර්ගයත් විස්තර කර දෙනු වස් පැවැති මහා මංගල හමුවේදී එතුමාණන් බොදුනු උවසකුසේ මහා සංඝරත්නය ඉදිරියේ කළ විස්තරයත් එපරිද්දෙන්ම මහජන රැස්වීම් හතරකදී කළ දෙසුම් හතරත් මේ පොත් පිංචෙන් ඔබ ඉදිරියේ තබා ඇත.

බුදු සසුන ආරක්ෂා කර ගැනීමෙ යෙදී සිටින අපේ සුපේශල ශික්ෂාකාමී මහා සංඝරත්නය කෙරේ භක්ත්‍යාදරය දක්වන බොදුනුවන් අතර, බොදු උපාසකයන් අතර අපේ ජනාධිපති උතුමාණන් මූලිකස්ථානයේ සිටින බව මම ප්‍රත්‍යක්ෂයෙන් දනිමි. ත්‍රිවිධ රත්නය කෙරේ ජනාධිපති උතුමාණන් දක්වන

භක්තිය, කරුණාව, හැඟීම කවරේද යන්න අපට පියවි ඇසට පෙනෙන තරමට වඩා අසංඛෙය්‍ය වාරයක් වැඩි බවට ඇති සාක්කි ප්‍රමාණය ද අසංඛ්‍යෙය බව — නැතිනම් තිමක් නොමැති බව — අවධාරණයෙන් පැවසිය යුතුය.

## ශාසනයට නැකම්

අපිස් බවට හෙවත් අල්පේච්ඡතාවට ප්‍රතිඥා දී, ඇලුම් කරන සියලු දේ හැර දමා ප්‍රියයන්ගෙන් ඉවත් ව සසුන්ගත වන පැවිදි උතුමන් ගෙදරට වඩින කල, පෙරගමන් කොට ඉතිරෙන භක්ති ප්‍රේමයෙන් උන්වහන්සේලා පිළිගෙන, පා දෙවා ගෙතුලට වැඩම කරවා පිරුවට ඇතිරූ අසුන් මත වැඩ හිඳුවීමේ උතුම් සිරිත ලෝකයටම පිළිබිඹු කරන බොදුනුවන් විසින් කළ හැකි වටිනාම පිංකම සාසනයට නැකම් කිව හැකි වන පරිදි දරුවෙකු හෝ ඥාතියෙකු සසුනට පූජා කිරීම බව දන්නා ජේ. ආර්. ජයවර්ධන උතුමාණන් කවර අන්දමේ බෞද්ධයෙක්ද යන්න ඔප්පු කිරීමට ඇති ප්‍රධානම නිදසුන එතුමාගේම බාල සොහොයුරා සසුන්ගත කිරීමයි.

අවුරුදු දෙදහස් පන්සියයකට අධික කාලයක් මේ රට පාලනය කළ රජවරු සිටියහ. වෙනත් පාලකයෝ සිටියහ. එහෙත් ශාසනයට නැකම් කිව හැකි එකම රාජ්‍ය නායකයා අපේ මේ ජනාධිපති උතුමාණෝම ය. එනිසා එතුමන් පැවිදි උතුමන් ඉදිරියට ගොස් අනුගමනය කරන ඒ බොදුනු ක්‍රියාමාර්ගය ගැන අමුතුවෙන් කිවයුතු නොවේ. ඒ ක්‍රියාමාර්ගය වැරදි යයි යමෙක් පවසත් ද ? ඒ ක්‍රියාමාර්ගයෙන් රටට, ජනතාවට, ශාසනයට හානියක් වෙතැයි පැවසිය හැකි දිවක් සහිත ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ වේද ඔවුන් කර ගන්නේ ආනන්තරිය කර්මයට නොදෙවෙනි පාප කර්මයකි.

අනුන් ලවා පින් කරවා ගැනීම, අනුන් ලවා දන්දීම වැනි ද ජනාධිපති උතුමාණන්ට නුහුරුය. එතුමාණන් දනයෙහි ආනිශංස දනිති. නැත්තාට දීමේ උතුම් ගුණය බොදු මහෝපාසිකා තම මෑණියන්ගෙන් උරුමකොටගත් එතුමාණෝ මාතෙල් වත්ත සහසතුකොට පූජා කිරීමෙන් මහා සංඝරත්නය රැකුණොත් පමණක් ශාසනය රැකෙන බව අවබෝධ කොටැගෙන ඒ අනුව ක්‍රියාකිරීමෙන් දී ඇත්තේ විශිෂ්ඨ ආදර්ශයකි.

පුලන්නෙකුට තම ධනය වැය කොට කන්න කටක් නොදුන්, මහා සංඝ රත්නයට දන් පිඟානක් නොපිළිගැන්වූ ඇතැම් උදවිය මහා සංඝරත්නය ඉදිරියේ නියම කරුණු වසන් කොට, අසත්‍ය වාටු බස් කතාවෙන් උන්වහන්සේලාගේ ගැලවුම්කාරයන් — ගැලවුම්කාරියන් වීමට ඉදිරිපත්ව

ජනාධිපති උතුමාණන්ගේ බෞද්ධ බැතිය, ශාසන ලැදියාව, භික්ෂු ගරුත්වය සුළුකොට තැකීමට තැත් කරන මුත්, ජනාධිපතිතුමාණන් වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම සැදැහැවත් බෞද්ධයකු බව පිළිගන්නා අපේ මහා සංඝරත්නය, එතුමාණන් අතින් රටට, දැයට, සමයට හෝ හානිකර කිසිදු ක්‍රියාවක් සිදු නොවන බව අවබෝධ කර ගෙන සිටීම ජනාධිපති උතුමාණන්ට තමා අදහස් කරන ක්‍රියාමාර්ගය සපුරා ගැනීමට මහා රුකුලක්ව ඇත.

## අහිංසා මාර්ගය

ජෝන් ද සිල්වා සමරු හලේ දී මහා සංඝරත්නය ඉදිරියේ තමා අදහස් කරන ක්‍රියාමාර්ගය පිළිබඳ අවංක විස්තරයක් කළ ජනාධිපතිතුමාණෝ තමන් ඉදිරියේ ඇති ත්‍රස්තවාදය අහෝසි කර දැමීම සඳහා ඇත්තේ ක්‍රම දෙකක් බවත්, ඉන් එකක් යුද්ධමය ක්‍රියාමාර්ගය වන අතර අනෙක අහිංසා මාර්ගයෙන් කැරෙන විසඳුමක් බවත් පවසා සිටියහ. තෝරා ගැනීමට ඇති ක්‍රියාමාර්ග දෙකකට සීමාවූ මොහොතක, වඩා යහපත්, වඩා හොඳ, ලෝක ජනතාව අනුගමනය කරන ක්‍රියාමාර්ගය තෝරාගැනීම බුද්ධිමතාගේ පිළිවෙතය. තමා මේ මාර්ග දෙක අතුරෙන් තෝරා ගත්තේ " අහිංසා මාර්ගය " යයි මහා සංඝ රත්නය ඉදිරියේ පවසා සිටිවිට එයට විරුද්ධ වන බුද්ධ පුත්‍රයාණ කෙනෙක් සිටිය නොහැකිය. ලෝකයේ අහිංසාවාදය දෙසූ ලොකුම අහිංසාවාදියා තුන්ලෝකාග්‍ර බුදු පියාණෝය. බුදු පියාණන් දෙසූ මගට පිළිපන් බුද්ධ පුත්‍රයන් වහන්සේලා අහිංසාවාදී මාර්ගයෙන් පිට අන් මාර්ගයක් අනුගමනය අනුමෝදන්නා බව ජනාධිපතිතුමාණෝ අවබෝධ කරගෙන සිටිති.

ඒ අහිංසාවාදී ක්‍රියාමාර්ගය ක්‍රියාත්මක කිරීමට තමා තෝරාගෙන ඇති මග ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධනයක් කර එමගින් විසඳුමක් ලබාගැනීම විනා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බාහිරව නොවන බව ජනාධිපති උතුමාණෝ මහා සංඝරත්නයට පැහැදිලි කර දුන්හ. රට බෙදීමක් ගැන කියමින් සිහින ලෝකයක ජීවත්වන්නවුන් කොතරම් කෑගැසුවත්, මෙ ජනනායකයාණන් අතින් තම එවැන්නක් සිදුනොවන බව දූත් සනාථ වී අවසානයි.

ප්‍රශ්නයට විසඳීමක් පමාකිරීම රජයේ — ඒ කියන්නේ රාජ්‍ය නායකයාණන්ගේ — අදහස නොවේ. විසඳුම පමාවූ තරමට ඉන් අන්වන ප්‍රතිඵල ද භයානක වනු ඇත. මේ අවස්ථාව පැහැර හැරියොත්, උද්ගත විය හැකි තත්ත්වය ගැන ජනතාවට දූත් දූත් සැහෙන අවබෝධයක් ලැබී තිබේ. යෝජිත පළාත් සභා පිහිටුවීමෙන් රට කැඩෙනු ඇත යන්න සම්පූර්ණ මිථ්‍යාවකි. දැනුදු මේ රට පාලනය කිරීම සඳහා පළාත් නවයකට බෙදා තිබෙන බව අමතක කරන ඇතැම් කණ්ඩායම රට බෙදීමක් ගැන දොඩවති.

යෝජිත ක්‍රමයෙන් අදහස් කරන්නේ දනට වඩා වැඩි බලතල කොටසක් ඒ ඒ පළාත්වල මහජනයා විසින් තෝරාගනු ලබන නියෝජිතයන්ට පැවරීම යි.

බලතල පුළුල් වශයෙන් බෙද දුන් තරමට මහ ආණ්ඩුවේ ශක්තිය වඩාත් තහවුරු වන බව පමණක් නොව ඒකීය ආණ්ඩුක්‍රමය ද දසත මුල් විහිදී ගිය මහා රුක්ෂයක් ශක්තිමත්ව කෙළින් සිටින අයුරෙන්ම ඍජුව සිටින බව පෙන්නා දිය යුතුව ඇත.

## අලුත්ම ප්‍රශ්නය

විසඳාලිය යුතු ප්‍රශ්නය කිසිවකුට අසාධාරණයක් නොවන අයුරින් විසඳාලීම රාජ්‍ය නායකයාණන්ගේ අධිෂ්ඨානය බව මහා සංඝරත්නය ඉදිරියේ පවසා සිටීමෙන් පසු දුන් එය ක්‍රියාත්මක වන බවට සැකයක් නැත. ඇරත් මහා මැතිවරණයට පෙර ජනතාව ඉදිරියේ දුන් ප්‍රතිඥවක් ගැන ද ජනාධිපති උතුමාණෝ මහා සංඝරත්නය ඉදිරියේ පවසා සිටියහ. ඒ ප්‍රතිඥව වූයේ කුමක් ද ? ද්‍රවිඩ ජනතාවට ඇති ඇතැම් ප්‍රශ්න සාකච්ඡා මාර්ගයෙන්ම විසඳන බවයි. මහජනයා මේ රජය හයෙන් පහක බලයක් සහිතව බලයට පත් කරන විට ඒ ප්‍රතිඥව නොසලකා හැරියා විය නොහැකිය. එහෙත් තහන්නට ප්‍රශ්නයක් නැති නිසාදෝ ඇතැම් පක්ෂයක්. මේ ප්‍රශ්නය අවුල් කිරීමක් වශයෙන් අළුතෙන් ප්‍රශ්නයක් මතුකර සිටිති.

සිංහල පළාත් හත, කිසිදු ඉල්ලීමක් නොකර තිබියදී ඒ පළාත් හතටත් පළාත් සභා ක්‍රමය පවරන්නේ මන්ද ?" යනු එකී ප්‍රශ්නයයි. යෝජිත පළාත් සභා ක්‍රමයෙහි දක්නට ඇති විශේෂතම ලක්ෂණය එයයි.

රටේ කිසිම කොටසකට ජාති වශයෙන් හෝ ආගම් වශයෙන් හෝ වෙන අන්කිසි හේතුවක් නිසා හෝ කිසිදු වෙනස්කමක්, මදි පුංචිකමක් සිදු නොවන පරිද්දෙන් බලය සමසේ භුක්ති විඳිය හැකි පරිද්දෙන් තුලනාත්මකව බෙද හැර තිබීම නිසා පළාත් සභා ක්‍රමය කෙරේ කිසිදු බියක් ඇතිකර ගැනීමට හේතුවක් නොපෙනේ. යම් අයුරකින් යෝජිත පළාත් සභා ක්‍රමය උතුරු හා නැගෙනහිර පළාත්වල පමණක් ක්‍රියාත්මක විය යුතුය යන්න පදනම් කොට ගෙන විසඳුමක් සකස් කරන ලද නම් යෝජිත පළාත් සභා ක්‍රමයට විරුද්ධ වන්නන් ගායනා කරන්නේ වෙනමම නාලයක් ද ?

## පාඩුව මහජාතියටමයි

කැලණිය ටයර් සංස්ථාවේ ජාතික සේවක සංගමය ඉදිරියේ කථාවක් පැවැත්වූ ජනාධිපති උතුමාණෝ යෝජිත පළාත් සභා පනතට විරෝධය දක්වන්නන් වුවමනාවෙන්ම වසන් කරන්නට තැත් කරන ඉතා වැදගත්

කරුණක් පෙන්වා දුන්හ. රට ඉදිරියේ ඇති ප්‍රශ්නය විසඳීම ඉක්මන් කළ තරමට ඉන් ප්‍රයෝජනය ලැබෙන්නේ සියයට හැත්තෑ තුන් දෙනෙකු සිටින සිංහල ජාතියටය යන්න එකී කරුණයි. එවැනි සත්‍යයක් මෑතකදී කිසිදු ජනනායකයකුගෙන් නොපැවසුණු බව අවධාරණයෙන් කිවයුතුව ඇත. එයට සාක්කි වශයෙන් එතුමාණන් ඉදිරිපත් කළේ කුමක්ද ? 1983 කෝලාහලය නිසා වැඩියෙන් පාඩුව සිදුව ඇත්තේ මහජාතිය වන සිංහලයන්ට බවයි. ද්‍රවිඩයන්ගේ ගෙවල් ගිනිබත් කළ කර්මාන්ත ශාලා විනාශ කළ, මිනිසුන් අමු අමුවේ මරා දමූ ඊනියා " වීරයන් " කළ ව්‍යසනය නිසා අද මේ ප්‍රශ්නය කෙරේ මුළු ලෝකයම වපරැසින් බලන තත්ත්වයක් ඇතිවූ බව ඇතැම් පිරිස් අභවති.

එයින් අපට ඇතිවූ අපකීර්තිය නැතිකර ගැනීමට එද සිට අද දක්වා අපේ ජනාධිපතිතුමාණන් දරූ උත්සාහය ප්‍රමාණාත්‍රිකාත්තය. එතුමාණෝ බැණුම ඇසූහ. විවේචනයට ලක්වූහ. නොවිඳිනා තින්ද විත්දහ. එහෙත් එතුමාණන්ගේ දූරදර්ශී චින්තනයත්, ඉවසීමේ උතුම් ගුණයත් විපතේදී මහසයුර මැද නොසැළී සිටින ගල් පර්වතයක් බඳු ස්ථිරසාර නොසෙල්වන ගුණයත් නිසා දැන් යහපත් පරිසරයක් උදාවී ඇත. මෙතෙක් අප දෙස වපරැසින් බැලූවෝ සිය අදහස් වෙනස් කරගෙන සිටිති. ඉදිරිපත් කර ඇති පළාත් සභා ක්‍රමයේ ඇති සාධාරණත්වය වටහා ගත් ලෝ බලවත්තු අපේ ජනාධිපති උතුමාණන් ප්‍රශ්නය විසඳීමට ගන්නා උත්සාහය අවංක එකක් බව පිළිගනිති. ඉන්දියා අගමැති රජීව් ගාන්ධි මහතා මෙ ප්‍රශ්නය අවසාන කර විනා ආපසු නොබලන බවට ප්‍රතිඥ දෙති. මේ හැම කරුණකින්ම පිළිබිඹු වන්නේ කුමක්ද ? උදාවූ අවස්ථාවෙන් ප්‍රයෝජන ගෙන යෝජිත පළාත් සභා ක්‍රමයෙන් ප්‍රශ්නය විසඳා රටේ ඒකීය භාවය පමණක් නොව විවිධ ජාතීන් ඔවුනොවුන් කෙරේ සැකයෙන් බලන ප්‍රතිපත්තියක් අහෝසිකර දැමීමට සුදුසු මොහොත එළඹ ඇති බවයි.

## තවද කරුණක්

යෝජිත පළාත් සභා ක්‍රමය හැර අන් කිසියම් මාර්ගයක් ඇත්නම් ඉදිරිපත් කරන්නැයි රාජ්‍ය නායකයන් කිහිප විටක්ම ඉල්ලා සිටියත් එබඳු විසඳුමක් ඉදිරිපත් කිරීම තබා සිතීමවත් කළ හැකි කෙනෙක් අද මේ රටෙහි නැත.

යෝජිත පළාත් සභා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට පෙර මහා මැතිවරණයක් පැවැත්විය යුතු යැයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායිකා බණ්ඩාරනායක මහත්මිය ඝෝෂා කරනත් මහ මැතිවරණයක් පැවැත්වීමට සුදුසු පරිසරයක් නොමැති කමත්, එසේම සාමයක් නොමැති අවදියක මහ මැතිවරණයක් පැවැත්වීම ත්‍රස්තවාදීන්ට රුකුල් දීමක් වන බවත් බුද්ධිමත් ජනතාව පිළිගෙන තිබීම අද

ජනාධිපතිතුමාණන් පෙන්වන මහ හැර වෙන මඟක් නොමැති බව ජනතාවට ජත්තු ගත්වන ප්‍රධාන හේතුව වී ඇත. එය රටේ භාග්‍යය නිසා සිදු වූවක් හැටියට නිගමනය කළ හැකිය.

ජනාධිපති උතුමාණෝ මෙහිදී ඉතා වැදගත් ප්‍රකාශයක් කළහ. වඩා යහපත් විසඳුම් ක්‍රමයක් නොමැති නම්, යෝජිත පළාත් සභා ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් විසඳුමක් ලබාගෙන යුද කටයුතු සඳහා පමණක් වර්ෂයකට වැය කරනු ලබන කෝටි නවසියයකට අධික මුදල් ප්‍රමාණයක් රටේ සංවර්ධන කටයුතු සඳහා යෙදවීම තම අදහස බවත්, එයට විරුද්ධ වන්නන් ඇතොත් ලබන මහ මැතිවරණය එළඹි විට — එය මැතිවරණයට ඉදිරිපත් කර — වෙනත් රජයක් තෝරා ගැනීමට හැකි බවත් ජනාධිපති උතුමාණන් පැහැදිලිවම ප්‍රකාශ කර ඇත.

ත්‍රස්තවාදය විසඳීමට ජනාධිපති උතුමාණන් ඉදිරිපත් කර ඇති පළාත් සභා ක්‍රමයෙන් බාහිර ක්‍රමයක් නැත්තා සේම මහ මැතිවරණයක් අවශ්‍ය යැයි ඝෝෂා කරන පිරිස්වලටද ලබන මහා මැතිවරණය එළඹෙන තුරු සිටිනු විනා කළ හැකි අන් ක්‍රියාමාර්ගයක් නැති බව අවබෝධ වී ගෙන යන සැටිය මැනැවින් පිළිබිඹු වී ඇත.

## ශ්‍රී ලංකා නිදහස් පක්ෂ නායිකාවගේ රහස් විසඳුම

ජනතාව ඉදිරියේ තැබිය යුතු සියලු විස්තර බුලත්සිංහල ජනහමුවක් ඉදිරියේදී ජනතාව ඉදිරියේ තැබූ ජනාධිපති උතුමාණෝ ශ්‍රී. ලං. නි. ප. නායිකා සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය අනුගමනය කරන ක්‍රියාමාර්ගය ගැන සඳහන් කරමින් ඒ මහත්මිය සිත් තුළ — හෘදය තුළ — විසඳුමක් ඇතැයි ද බලයට පැමිණියොත් ඒ විසඳුම ඉදිරිපත් කරන්නේ යයි ද පවසන බව අනාවරණය කළහ.

මහ මැතිවරණයක් හෝ ජනමත විචාරණයක් හෝ පැවැත්විය යුතු යැයි ශ්‍රී. ලං. නි. ප. නායිකාව කරන උද්ඝෝෂණයට දිය හැකි හොඳම පිළිතුර ජනාධිපති උතුමාණන් විසින් දුන් දී ඇත. එනිසා දෝ මහජනයා තම මේ මොහොතේ මැතිවරණයක් ඉල්ලීමට සූදානම් නැති බව ඔවුන් කරන කියන කතා බහෙන් ඔප්පුවනු පමණක් නොව, මහ මැතිවරණයක් පැවැත්වීමට සුදුසු වාතාවරණයක් දැන් නොමැති බව බහුතර ජනතාව අවධාරණයෙන් ප්‍රකාශ කර සිටිති.

මේ තත්ත්වයන් අනුව රජයටත්, රාජ්‍ය නායකයන්ටත් සැහීමට පත්විය හැකි ප්‍රධානම කරුණක් වෙයි. එනම්, රාජ්‍ය නායකයාණන්ගේ හා රජයේ සෙසු නායකයන්ගේ ඉල්ලීම පරිදි රටේ ජනතාව විශේෂයෙන් සිංහල ජනතාව රටේ

සාමය කඩවන කිසිදු ක්‍රියාවක නොයෙදී සිටිමයි. මේ තත්ත්වය නිසා ත්‍රස්තවාදී ප්‍රශ්නයට විසඳුමක් සෙවීම පහසු වී ඇත. සිංහල වේවා, ද්‍රවිඩ වේවා වෙන අන් කිසි ජාතියකට අයත් කෙනෙක් වේවා, ඒ කාටත් දැන් අවශ්‍යව ඇත්තේ සාමයයි. කවුරුත් රටේ සාමය අපේක්ෂා කරති. ඉක්මනින් සාමය උදාවේවායි ප්‍රාර්ථනය කරති. ජනතාව ඒ කරන ප්‍රාර්ථනය හද පත්ලෙන් එන්නකි.

ජනාධිපති උතුමාණන් මහා සංඝරත්නය ඉදිරියට පැමිණ – ජනතාව ඉදිරියට පැමිණ කළ ආයාචනයට පිළිතුරු වශයෙන් බුද්ධිමත් ජනයා මේ අයුරින් ක්‍රියා කිරීමට – එනම් ඉක්මනින් සාමය උදාවේවා ! යි ප්‍රාර්ථනා කිරීමට සැදී පැහැදී සිටිති. දිවයිනේ ඇතැම් ස්ථානවල සාමාන්‍ය ජන ජීවිතය අද මුළුමනින්ම කඩාකප්පල් වී ඇත. සීඝ්‍ර ලෙස ඉදිරියට මෙහෙයවනු ලැබූ සංවර්ධන වේගය දැන් පසුබා සිටී. අපේ වටිනාම වස්තුව වන දරු පරපුර සිංහල වේවා, ද්‍රවිඩ වේවා, මුස්ලිම් වේවා, ඒ හැම දරුවකුගේ ම අධ්‍යාපනයට සැහෙන බාධා පැමිණ ඇති බව නොපිළිගන්නා කෙනෙක් නැතිමය.

මේ අප ජනිත භූමියයි. එය රැක ගැනීම අප සතු යුතුකමයි. ජේ. ආර්. ජයවර්ධන ජනාධිපති උතුමාණෝ ඒ වැයමට කරදී සිටින ප්‍රධාන යෝධයා වෙයි. අපි එතුමාණන් පෙන්වා දෙන මාර්ගය පිළිගනිමු. එය ඔස්සේ ගමන් කරමු. මේ මොහොතෙහි ජනාධිපති උතුමාණන්ට රට මුදා ගැනීමට සහාය දෙන්නෝ උත්පත්තියෙහි ඵල ලැබූවාහු වෙති.

ඩී. එච්. අභයසිංහ
සභාපති, ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය
ලංකාදීප, ශ්‍රී ලංකාදීප ප්‍රධාන ටයිම්ස් ආයතනයේ
සිංහල ප්‍රකාශනවල හිටපු ප්‍රධාන කර්තෘ.

1986.08.30.
බම්බලපිටිය.

# පටුන


1. ජෝන් ද සිල්වා සමරු රඟහලේ පැවැති යෝජිත පළාත් පාලන සභා ක්‍රමය පිළිබඳව භික්ෂූන් වහන්සේලාට කරුණු පැහැදිලි කිරීමේ රැස්වීමේදී අතිගරු ජනාධිපතිතුමා කළ දේශනය . . . . . . . . . .15

2. කැලණිය ටයර් සංස්ථාවේ ජාතික සේවක සංගමයේ වාර්ෂික මහා සභාව අමතා අතිගරු ජනාධිපතිතුමා කළ දේශනය . . . . . . .29

3. පළාත් සභා පිළිබඳව කරුණු පැහැදිලි කිරීමට බුලත්සිංහලදී පැවැති ජනහමුවේදී කළ කතාව . . . . . . . . . . . .45

4. බුලත්සිංහල මධ්‍ය මහා විද්‍යාලයේදී මහජනතාව විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් අතිගරු ජනාධිපතිතුමා කළ කතාව. .53

විනාශවෙන ජීවිත බේරාගත හැකි එක ම මග
පළාත් පාලනය විමධ්‍යගත කිරීමයි.......

## 1986.08.07 වැනි දින ජෝන් ද සිල්වා සමරු රඟහලේ පැවති යෝජිත පලාත් සභා ක්‍රමය පිළිබඳව භික්ෂූන් වහන්සේලාට කරුණු පැහැදිලි කිරීමේ රැස්වීමේ දී අතිගරු ජනාධිපතිතුමා විසින් කරන ලද කතාව

ගරුතර මහානායක ස්වාමීන් වහන්සේගෙන් අවසරයි.
නායක ස්වාමීන් වහන්සේලාගෙන් අවසරයි.
මහා සංඝරත්නයෙන් අවසරයි.
ඇමතිවරුනි. මන්ත්‍රීවරුනි. මිත්‍රවරුනි.

මම මේ ආරාධනාව ඉතාමත්ම සන්තෝෂයෙන් පිළිගත්තා. අද උතුරු නැගෙනහිර පලාත් දෙකේ දිනපතා ඇතිවන සිද්ධීන් ගැන අප කවුරුත් දන්නවා. අද කතා කල ස්වාමීන් වහන්සේලාත් නොයෙකුත් අදහස් ප්‍රකාශ කලා. මේ තත්ත්වය නිසා අප අයවැය ලේඛනයෙන් විශාල මුදලක් වෙන් කරනව යුද්ධ කටයුතු සඳහා උවමනා කරන ආම්පන්න ගන්න. යුද්ධ හමුදාව පුහුණු කරන්න. එම කටයුතුවලට මේ අවුරුද්දෙ අප වෙන් කරල තියෙනව රුපියල් කෝටි නවසීයක්. අපිට පුළුවනි ඒ රුපියල් කෝටි නවසීයෙන් අද ආහාර මුද්දර ලබන පිරිස වගේ හතර ගුණයකට ආහාර මුද්දර ලබාදෙන්න. අපට තව නොයෙක් සංවර්ධන වැඩවලට ඒ මුදල වියදම් කරන්න පුළුවනි, ඉතාමත් දුප්පත් මහජනයාගෙ ප්‍රයෝජනයට. අප බලයට පත්වෙන කොට 1977 දී, මගේ කල්පනාවක් තිබුණා. ඒ කාලෙ යුද්ධායුදවලට වෙන්කරන මුදල් අඩු කරන්න. ඒවත් සංවර්ධන වැඩවලට යොදන්න. නමුත් ක්‍රම ක්‍රමයෙන් ත්‍රස්තවාදී වැඩකටයුතු උග්‍රවෙන්න පටන් ගත්ත.

1983 දී යුද්ධ භටයන් 13 දෙනෙක් බිම් බෝම්බයකින් මැරුණාම රටපුරා සිංහල ද්‍රවිඩ කෝලාහල ඇතිවුණා. මේ සිද්ධියෙන් ලංකාවෙ සිංහල ජාතිය ගැන ලෝකයා තුළ තිබුණු හැඟීම වෙනස් වුණා. අප මිනීමරණ ජාතියක්, ද්‍රවිඩ උදවිය නැති කරන ජාතියක්, ජාතිවාදය උඩ සුළු පිරිසක් නැති කරන ආණ්ඩුවක් කියල ලෝකය පුරා මතයක් ඇතිවුණා. අපිට දැන් තමයි ඒ මුහුණුවර වෙනස් කරන්න අවස්ථාවක් ලැබුණෙ, සාම සාකච්ඡා නිසා. අපට දෙන සංවර්ධන ආධාර අඩු කරනව කියල කතාවක් තිබුණා. නොයෙක් නොයෙක් විදියෙන් ශ්‍රී ලංකාව ගැන තිබුණ හොඳ රූපය මැකුණා.

මේ ත්‍රස්තවාදී ව්‍යාපාරය පටන් ගත්තේ 1983 දී නොවෙයි. 1976 දී. අප එතකොට විපක්ෂෙ. මාත් යාපනේට ගිහිල්ලා කතාවක් පවත්වල ආව විතරයි. දුරෙයිඅප්පා නගරාධිපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂෙ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. 1976 දී ඒ මහත්මයට වෙඩි තියල මැරුව. ඊට ටික කාලයකට පස්සෙ අපේ ආණ්ඩුව පත් වුණහම අපේ පැත්තට එක්වුණු මන්ත්‍රීවරයෙකුව මරණයට පත් කරන්න උත්සාහ ගත්තා. නමුත් ඒ මහත්මයා එවෙලේ බේරුණා. ඊට පස්සේ ඒ තුවාලවලින්ම මන්ත්‍රීතුමා මරණයට පත්වුණා. එහෙම මරණයට පත් වුණේ පද්මනාදන් මැතිතියගේ සහෝදරයා. ඔය වාගෙ ක්‍රම ක්‍රමයෙන් සොරකම් කරමින් හිංසා මාර්ගවලින් ත්‍රස්තවාදී ව්‍යාපාරය වර්ධනය වුණා. අප මේ තත්ත්වයට සූදානම් වෙලා හිටපු නැති නිසා, යුද්ධායුධ ගන්න, යුද්ධ සෙබළු පුහුණු කරන්න, කල්ගත වුණා. අද අපට වුවමනා යුද්ධායුද අප ළඟ තියෙනවා. තවත් ගන්න පුළුවනි. ඒ වගේම ත්‍රස්තවාදී ව්‍යාපාරයත් උග්‍රවෙලා තියෙනවා. උතුරු නැගෙනහිර පළාත්වලදී හුඟාක් දුරට ඒ උදවියට පුළුවන් ඕන වේලාවක ගිහිල්ලා ආරක්ෂාවක් නැති තැනකදී යුද්ධායුද පාවිච්චි කරමින් පහරක් ගහන්න, මරන්න. **මේක අපේ නායක ස්වාමින් වහන්සේලා කිව්වා වාගේ ලංකාවෙ නොවෙයි ලෝකෙම තියෙන වසංගතයක්.**

එංගලන්තය අවුරුදු සියක් සටන් කරල තියෙනවා ත්‍රස්තවාදීන් සමග. අවුරුදු කීපයකට ප්‍රථම එංගලන්තයේ අගමැතිතිය මරන්න එතුමිය හිටපු හෝටලයක බෝම්බයක් අටවල තිබුණා. ජනාධිපති රේගන් මරන්න වෙඩි තියල උත්සාහ ගත්තා. ගාන්ධි මැතිතිය වෙඩි තියල මැරුවා. අද ඉන්දියාවෙ හැම පළාතෙම ත්‍රස්තවාදී ව්‍යාපාර තියෙනවා. දත් සුමාන දෙකකට ප්‍රථම නවදිල්ලියෙ විශාල කෝලාහලයක් ඇතිවුණා. ප්‍රංශ රටේ පැරිස් නගරෙ තැනින් තැන බෝම්බ පුපුරවනවා. මහජනයා රැස්වෙලා ඉන්න තැන්, මහජනයා භෝජන සංග්‍රහවලට රැස්වෙලා ඉන්න තැන් වාගේ ප්‍රසිද්ධ ස්ථානවලට බෝම්බ දමනවා. ත්‍රස්තවාදී කටයුතු ජර්මනියේ, ඉතාලියේ තියෙනවා. ස්පාඤ්ඤ රටේ බාස්ක් කියල ගරිල්ලා ව්‍යාපාරයක් තියෙනවා. කොච්චර නිදහස දුන්නත් ඒ ත්‍රස්තවාදී ව්‍යාපාරය නවත්වන්න බැහැ. ත්‍රස්තවාදී ව්‍යාපාරය කියන එක ලංකාවට පමණක් අයිති දෙයක් නොවෙයි. ලෝකෙ වසංගතයක්. අප උත්සාහ අරන් තියෙනවා මේක විසඳන්න. දෙවිදියකින්. එකක් හමුදා බලය පාවිච්චි කිරීමයි. අනික් මාර්ගය සාමයෙන් සාකච්ඡා කරලා විසඳීමක් ඇති කිරීමයි.


අද මා කතා කරන්නෙ ඒ අහිංසා මාර්ගයෙන් ලබන දේශපාලන විසඳීමක් සම්බන්ධවයි. අප හුඟක් දුරට දැන් ඒ මාර්ගයේ ගමන් කරල තියෙනව. මුළු ලෝකය අප දිහා බලන් ඉන්නවා. අප අහිංසා මාර්ගයෙන් දේශපාලන විසඳීමකට එනව නම් සම්පූර්ණ ආධාර දෙනව කියල. ඉන්දියාව පොරොන්දු

වෙලා තියෙනවා. ද්‍රවිඩ එක්සත් පෙරමුණ, අප එක්ක සාකච්ඡා කරනවා. ඒ සාකච්ඡා කරන කරුණු ගැන මම වචන ස්වල්පයක් කතා කරන්න සතුටුයි. ප්‍රථමයෙන්ම අප සොයා බලන්න ඕනෙ යුද්ධායුද පාවිච්චි නොකරන ද්‍රවිඩ පිරිසට තියෙන කරදර. තියෙන සැකය මොකක්ද කියල. එක්සත් ජාතික පක්ෂයේ 1977 මැතිවරණ ප්‍රකාශනයෙත් අප ඇතැම් කරුණු ප්‍රකාශ කළා. එනම් විශ්වවිද්‍යාලයට ඇතුල්වීම ගැන. ජාතිවාදයක් නොබලා සියෙන් විසිපහක් ඉන්න සුළු ජාතීන්ට ඒ අනුපාතය අනුව ඇතුල්වීමට අවසර දෙන්ට කියල අපි කීවා.

රක්ෂාවල් ජනගහන අනුපාත ක්‍රමය අනුව ලබා දෙනවා කියලා අපේ මැතිවරණ ප්‍රකාශනයේ සඳහන් වෙලා තිබුණා. ඉඩකඩම් බෙදන කොට ඒ ජනපද අයිතිය අනුව බෙදදිය යුතුයි කියලා අපි සඳහන් කරල තිබෙනවා. තමන්ගෙ පළාතෙ තමන්ම පාලනය කිරීම පිළිබඳව දිසා මණ්ඩල ඇති කරමින් දිසා මන්ත්‍රීවරු ඇති කරමින් තමන්ගේ ගම, තමන්ගෙ පළාත පාලනය කිරීමට බලය දෙනවා කියලා අපි පොරොන්දු වුණා. ඒ අනුව අප ක්‍රියාකරන්න පටන් ගත්තා. දිසා මණ්ඩල ඇති කළා. දිසා ඇමතිවරු පත් කළා. නුමුත් ඒ ක්‍රමයට අහිංසා මාර්ගයෙන් ගමන් කරන්න සාමාන්‍ය ද්‍රවිඩ උදවිය කැමති වුණත් ත්‍රස්තවාදීන් කැමති වුණේ නැහැ. දිසා මණ්ඩල තෝරන්න මැතිවරණ පැවැත්වූවාම, ඒ මන්ත්‍රී තරග කඩාකප්පල් කළා. සභාවකට ගිහිල්ලා පොලිස් නිලධාරීන් තුන් දෙනෙකුට වෙඩි තියලා මැරුවා. අප කොච්චර උත්සාහ ගත්තත් සාමාන්‍ය ද්‍රවිඩ උදවිය උත්සාහ ගත්තත් ත්‍රස්තවාදීන් යහපත් ප්‍රතිඵල ලබා ගැනීමට ඉඩ දුන්නෙ නැහැ. ඊට පස්සේ ද්‍රවිඩ එක්සත් පෙරමුණේ නායකයො දිසා මණ්ඩල ඇත්හැරලා. මා හිතන්නෙ ත්‍රස්තවාදීන්ට බය හින්ද වෙන්න ඇති. ලංකාවෙනුත් පිටවෙලා ගියා.

අවුරුදු තුනක් හතරක් අප උත්සාහ ගත්තා මේ ප්‍රශ්නය විසඳන්න. ඊට උදව් වෙන්න ඉන්දියාවේ පර්තසාරති මහත්මයා ලංකාවට ආවා. ඊට පස්සෙ සර්ව පාක්ෂික සම්මේලනයක් කැඳෙව්වා. ඉන් පස්සෙ මම ඉන්දියාවට ගියා. ඊට පස්සෙ අපේ නියෝජිත පිරිසක් තිම්පු නගරයට ගිහිල්ලා හිංසා මාර්ගයේ ගමන් කරන ද්‍රවිඩ නායකයන් පිරිය හමුවී සාකච්ඡා කළ නුමුත් ප්‍රශ්නය විසඳීමට බැරිවුනා.

මා හිතන්නෙ මෙ වතාවේ ඉන්දිය රජය බලකරලා තියෙනවා ද්‍රවිඩ එක්සත් පෙරමුණටත්, ත්‍රස්තවාදීන්ටත් ලංකා රජය එක්ක ගිවිසුමක් ඇතිකර ගත යුතුයි කියලා. ඒ ගිවිසුම මොන විදියේ ගිවිසුමක් ද කියලා තෝරාදෙන්නයි අප මේ සභා පවත්වන්නෙ. අප බලාපොරොත්තු වෙන්නෙ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරමින් විසඳුමක් ලබා දෙන්න. ඒකෙන් පිට නොවෙයි. එහෙම



ජනාධිපතිතුමා ජෝන් ද සිල්වා රඟහලේ රැස්වීම අමතයි



ජෝන් ද සිල්වා රඟහලේ රැස්වීමට සහභාගි වූ සංඝයා වහන්සේලා ගෙන් කොටසක්

සංශෝධනය කරන විසඳුමක්, පනතක්, පාර්ලිමේන්තුවට ගේන්න ඕනැ. පාර්ලිමේන්තුවේ පනතක් හැටියට ගෙනල්ල සාකච්ඡා කරල පළවෙනි කියවීම දෙවැනි කියවීම, තුන්වැනි කියවීම හා කාරක සභා කියවීම අවසන් වුනායින් පස්සේ තුනෙන් දෙකේ ඡන්දය ලබාගෙන ඒක නීතිගත වෙනවා. ඊට ඉස්සෙල්ල උසාවියට යන්න ඕනෙ. උසාවිය සොයා බලන්න ඕනෙ මේ නීතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන එකක්ද ? එහෙම නම් තුනෙන් දෙකක් ඡන්දය වුවමනා කරනවද කියල. තවත් සොයා බලන්න ඕනෙ මේ නීතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම්වලට පටහැනිද කියල. එහෙම නම් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දය ලැබුණත් බැහැ ස්ථිර කරන්න. එවිට ජනමත විචාරණයක් අවශ්‍යය කියල සුප්‍රීම් උසාවිය කියනව.

මොනවද මේ මූලික අයිතිවාසිකම් ? ලංකාවෙ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කරල තියෙන්නෙ ඒකීය රාජ්‍යයක්, එනම් "යුනිටරි" ආණ්ඩුවක්. දෙවනුව ඇති කරල තියෙන්නෙ මහජන ඡන්ද බලයෙන් තෝරාගන්න විධායක බලය පාවිච්චි කරන ජනාධිපතිවරයෙක්. තුන්වෙනුව ඇති කරල තියෙන්නෙ සර්වජන ඡන්දයෙන් පත් කරන පාර්ලිමේන්තුවක්. සම්පූර්ණ ව්‍යවස්ථාදායක බලය තියෙන පාර්ලිමේන්තුවක්. ඒ හැර සර්වජන ඡන්දයෙන් පත් කරන පාර්ලිමේන්තුවකට බලය තියෙනව අධිකරණයක් ඇති කරන්න නීති මාර්ගයෙන්. ඒ ඇති කෙරුවට පස්සෙ ඒ අධිකරණයට අත තියන්න කාටවත් බැහැ. ඒ අධිකරණය නිදහස්, ස්වාධීනයි රජයයි මහජනතාවයි අතරෙ යම් යම් හබයක්, භේදයක් ඇතිවුනොත් උසාවියට ආවොත් මධ්‍යස්ථ තීරණ දෙන්නෙ ස්වාධීන අධිකරණයක් මගින්. ඔය වාගෙ අයිතිවාසිකම් කිහිපයක් අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙ ඇතුල්වෙලා තියෙනවා මහජනයාගෙ ප්‍රයෝජනයට. ඒ එක නීතියක් හරි සංශෝධනය වෙනව නම් වෙනස් වෙනව නම්, අහෝසි වෙනව නම්, උසාවිය කියයි ජනමත විචාරණයක් වුවමනායි කියලා. අප යම් නීතියක් අවශ්‍ය නම්, ඒ නීතිය ගෙන එනවා. ඊට තුනෙන් දෙකේ ඡන්දය වුවමනා වෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරනව නම් ඒ නීතිය ගේන්න ඕනෙ උසාවියෙන්, ජනමත විචාරණයක් ඕනැ නැහැ කියන තීන්දුවක්. අන්න එහෙම නීතියක් තමයි අප ගේන්න බලාපොරොත්තු වෙන්නෙ. එහෙම තීන්දුවකින් ලංකාවෙ ඒකීයභාවය නැති වෙන්නෙ නැහැ. ඒකීයභාවය නැතිවෙනවා කිවුවොත් අපි ඒ සංශෝධනය වෙනස් කරනවා. සංශෝධනය කරනවා නැවත. ආයෙ ඒක ගේන්නෙ නැහැ. මම කැමතියි තේරුම් කරන්න අප ගේන නීතිය ගැන.

ප්‍රථමයෙන්ම ඒ නීතියෙන් බලාපොරොත්තු වෙන්නෙ පළාත් සභා ඇති කිරීමටයි. දැන් හුඟක් දෙනෙක් හිතනව මේ පළාත් සභා ගයානක දෙයක්. රටේ නිදහස නැතිවෙන දෙයක්. රට දෙකට බෙදන දෙයක් කියා. ඒ නිසා විරුද්ධ බව



4 -

සමහරු ප්‍රකාශ කරල තියෙනවා. එය සම්පූර්ණයෙන්ම අසත්‍යයක්. වැරදි හැඟීමක්. ලංකාවේ පළාත් සභා ඇති කිරීමට යෝජනා කරපු පියා හැටියට මා සලකන්නෙ එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහත්මයාවයි. මා එහෙම කියන්නෙ වාසියක් ලබාගන්න නොවෙයි, එය ඇත්තක් නිසා. ඔබවහන්සේලාට කියවන්න මා පොත් දෙකක් තුනක් ගෙනාවා. එකක් බණ්ඩාරනායක මහත්මයගෙ කතාවල්. එතුමා කරපු කතාවක් 1947 මාර්තු මාසේදී. ඒ කථාවෙන් උත්තැහැ කියල තියෙනව, මම ඉංග්‍රීසියෙන් කියන්නම්, එයා කියනවා.

"It is proposed before long to introduce provincial councils functioning over a province or revenue district, whose chief duty will be to supervise co-ordinate and (in variant degrees) to control the work of all local bodies in their area. These bodies will, to some extent correspond to county councils in England. But will have much wider powers, duties in various directions. In fact, it is contemplated that they will, while preserving certain powers of the central government in these matters deal in their provinces and districts with health and sanitation, communications, lighting, housing, water, agriculture, irrigation, etc. It will thus be seen that the policy we are pursuing is of decentralisation as far as is reasonably possible....."

එතුමා මේ කථාව කෙරුවෙ 1947 දී. එතකොට එතුමා පළාත් පාලන ඇමතිතුමා. ඒක පළාත් පාලනය දියුණු වෙන අන්දම ගැන කථාවක්. එහෙම දියුණු වෙනකොට අන්තිම පියවර තමයි පළාත් සභාව. ඉන්දියාවෙ කියන්නෙ ප්‍රාන්ත ආණ්ඩු කියල. ඒ පළාත් සභාවට බලය තියෙනව, අනිත් පළාත් පාලන සභා පාලනය කරන්න. ඒවයෙ වැඩ කටයුතු බලන්න. ඒවා ක්‍රියාත්මක වෙන්නෙ හරියට එංගලන්තෙ "කවුන්ටි කවුන්සිල්ස්" වාගෙ. ඊටත් වඩා බලය තියෙනවා ඒ බලය අප දෙන්න කැමතියි ; පළාතේ සෞඛ්‍යය, විදුලි බලය, පළාතේ නිවාස ක්‍රමය, ජල සම්පාදනය, පළාතේ කෘෂිකර්මය සහ පළාතේ වාරිමාර්ග වැඩ කටයුතු ආදියත් පාලනය කරන්න. එතකොට අප කරන්නෙ බලය විමධ්‍යගත කිරීමක් හැටියට මධ්‍යම ආණ්ඩුවෙ බලතල පළාත් සභාවලට පවරා දීමයි. ඒක 1947 දී. ඊට ඉස්සෙල්ල මේ සම්බන්ධව කථා කරපු කෙනෙකු මට සොයාගන්න බැරිවුනා. එතකොට අනික් කථාව 1952 දී සමස්ථ ලංකා ගම්සභා සම්මේලනයේදී, කරපු කථාවක්. එතකොට එතුමා එක්සත් ජාතික පක්ෂයෙන් අයින්වෙලා. මා හිතන්නෙ සිංහල මහා සභාව එහෙම නැත්නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂෙ ආරම්භ වුනු කාලෙ.

"regarding the work done during the last year (before my resignation) I regret to state that three important proposals of mine that would have ensured the efficient and satisfactory working of all local bodies were rejected by the government. The first was the rejection of my proposals for establishment of provincial councils shortly before the dissolution and that it was also approved by the present government as it is appeared in the two speeches of the governor general in the opening sessions of Parliament. As declared policy of the government I am driven to the conclusion that the rejection of these proposals eventually, was chiefly due to personal reasons......"

එක්සත් ජාතික පක්ෂයෙන් අයින්වුණු එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරම්භ කරල මේ ගම්සභා සම්මේලනයේ දී මෙන්න මෙහෙම ප්‍රකාශ කළා.

" මේ ගිය අවුරුද්දෙ කරපු වැඩ ගැන මට කණගාටුයි මතක් කරන්න. මම යෝජනා කරපු වැදගත් යෝජනා තුනක් ඉෂ්ඨ වෙලා නැහැ කියල. එද තිබුණු ආණ්ඩුව ඒව ප්‍රතික්ෂේප කෙරුවා. ප්‍රථම යෝජනාව තමයි පළාත් සභා ඇති කිරීම. ඒ යෝජනාව ප්‍රතික්ෂේප වුණා. මේ යෝජනාව මා ප්‍රථමයෙන්ම ගෙනාවෙ රාජ්‍ය මන්ත්‍රණ සභාවේදී. ඊට පස්සේ දැන් තියෙන ආණ්ඩුව මේක පිළිඅරගෙන ආණ්ඩුකාරතුමාගෙ කථාවල් දෙකකින් ක්‍රියා කරන්න බලාපොරොත්තු වෙනවා කියල නිතිරීති ගේනව කියල ආණ්ඩුවෙ ප්‍රතිපත්තියක් හැටියට ප්‍රකාශ කළා. නමුත් අද වනතුරු ඒ අනුව ක්‍රියා කරල නැහැ. මම හිතනව මගේ මේ යෝජනාව ප්‍රතික්ෂේප කෙරුවෙ පුද්ගලික කාරණාවක් නිසාවත් ද ? කියල ".....

එතුමාගේ යෝජනා දෙක. මෙ ගැසට් පත්‍රයේ තිබෙනවා. එතුමා ඒක ඉදිරිපත් කලේ 1951 මැයි මාසේ 17 වැනිද. එනකොට අපට නිදහස ලැබිලා. 1957 දී හැම පලාතෙම පලාත් සභා ඇති කිරීමට මුල් පියවර ගැණුනා. යම් කෙනෙකුට වුවමනා නම් මට ඒ ගැසට් පත්‍රය පෙන්වන්න පුළුවනි. හැම පලාතෙම පලාත් සභාවලට දෙන බලතල මේකෙ ඔක්කොම සටහන් වෙලා තියෙනවා. එහෙම නම් එතුමා මෙය යෝජනා කෙරුවෙ ලංකාවට පමණක් සීමාවෙච්ච කාරණාවක් හැටියට නොවෙයි. ලෝකෙ හැම රටකම වාගෙ තියෙනවා පලාත් සභා. එංගලන්තෙ තියෙනව. " බරෝ කවුන්සිල්ස් " කියලා. ඒ ගුහාක් බලය තියෙන සභා. ඒවාට පොලිස් බලය තියෙනවා. නිවාස සෑදීමට බලය තියෙනවා. පලාත් පාලනය කිරීමට බලය තියෙනවා. ඊයෙ පෙරේද දීපු බලයක් නොවෙයි.

එංගලන්තය පුරාණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තියෙන රටක්. අවුරුදු හාරසීයක් තිස්සේ පැවති බලයක්. ඒ බරෝ කවුන්සිල්ස්වලට තියෙනවා. එනකොට ප්‍රංශ රටේ තියෙනවා. 'ප්‍රොවින්ෂල් කවුන්සිල්ස්' කියල නැපෝලියන්ගේ කාලෙ ඉඳලම පළාත් පාලනය කරන සභා. ප්‍රංශයත් ඒකීය රාජ්‍යයක්. ෆෙඩරල් රාජ්‍යයක් නොවෙයි. ලංකාවෙ වාගෙ ඒකීය රාජ්‍යවල පළාත් සභාවලට නොයෙක් විදියෙ බලතල පවරල තියෙනවා. ෆෙඩරල් ආණ්ඩු මීට සම්පූර්ණයෙන්ම වෙනස්. ෆෙඩරල් ආණ්ඩු තමයි ඉන්දියාවෙ තියෙන්නේ ඇමෙරිකාවෙ තියෙන්නෙ. කැනඩාවෙත්, ඔස්ට්‍රේලියාවෙත් තියෙන්නෙ. ඒ රටවල්වලත් පළාත් සභා තියෙනවා. නමුත් පළාත් සභාවලට ඒ තරම් බලය නැහැ. ඒ රටවල ආණ්ඩුක්‍රම නොයෙක් නොයෙක් විදියෙන් බිහිවුන ඒවා.

අපි දැන් ඇමරිකාවේ පවතින ක්‍රමය ගැන බලමු. ඒ රටේ ප්‍රාන්ත රාජ්‍ය තමන්ගෙ බලතල ස්වල්පයක් විතරයි, මධ්‍යම ආණ්ඩුවට දීල තියෙන්නෙ. නුමුත් තමන්ගෙ මායිම් ඇතුලෙ සම්පූර්ණ බලය තියෙනවා අවශ්‍ය නීතිරීති පනවන්න. මහ ආණ්ඩුවට බැහැ ඒ පළාත් සභා නැති කරන්න. ඒකට තියෙන්නෙ ෆෙඩරල් ආණ්ඩුක්‍රමයක්. කැනඩාවෙත් එහෙමයි. කැනඩාවෙත් ජාතීන් දෙකක් හිටිය. ප්‍රංශ ජාතියත්, ඉංග්‍රීසි ජාතියත්. ඒ දෙගොල්ලෝ යුද්ධයක් කළා. යුද්දෙන් දිණුවට පස්සෙ ඉංග්‍රීසි ආණ්ඩුව ඒ සැම දෙනාම කැමතිවෙන විදියට ආණ්ඩුක්‍රමයක් සකස් කළා. එක එක පළාතට නිදහස දීල, නුමුත් මධ්‍යම ආණ්ඩුවක් පත් කරල. ඒ මධ්‍යම ආණ්ඩුවට විදේශ කටයුතු සම්බන්ධව, ආරක්ෂක කටයුතු සම්බන්ධව බලතල දීල ෆෙඩරල් ආණ්ඩුවක් ඇතිකලා කැනඩාවෙ. ඉන්දියාවෙත් එහෙමයි. තවත් හුඟාක් තියෙනවා මතක් කරන්න. නමුත් ඉන්දියාව ගැන පමණක් මම මතක් කරන්නම්. ඉන්දියාවෙත් ඉංග්‍රීසි ආණ්ඩුව පළාත් රාශියක් ඇති කෙරුව. ඒ ඇති කෙරුවෙ ජාතිවාදය උඩ. තමිල්නාඩුව ඇතිකෙරුව ද්‍රවිඩ මිනිසුන්ට ඉන්න. තවත් පිරිසකට ඉන්න බිහාර් ආදී ප්‍රාන්ත රාජ්‍ය ඇතිකලා. ඉන්දියාවට නිදහස ලැබුණාට පස්සේ නේරුතුමා අලුත් ආණ්ඩු ක්‍රමයක් ඇති කලා. මේ හැම ප්‍රාන්තයකටම හුඟාක් දුරට නිදහස දීලා තියෙනවා.

දැන් තමිල්නාඩුව ගැන අප කල්පනා කර බැලුවොත් එහේ ද්‍රවිඩ උදවිය ඉන්නව හය කෝටියක්. ඒ තමිල්නාඩුව සම්පූර්ණයෙන්ම නිදහස් තමන්ගෙ අභ්‍යන්තර පාලන කටයුතු සම්බන්ධව. වාරිමාර්ග ගැන, පාරවල් ගැන, අධ්‍යාපනය ගැන. යුද්ධ කටයුතු මධ්‍යම ආණ්ඩුවට අයිතියි. තමන්ගේ අභ්‍යන්තර වෙළෙඳ කටයුතු, තමන්ගේ පොලිසිය ගැන ඔවුන්ට බලය තියෙනවා. ඔය වාගෙ ප්‍රාන්ත රාජ්‍ය කිහිපයක් ඇති කෙරුවා. මධ්‍යම ප්‍රදේශ්, උත්තර ප්‍රදේශ්, කාෂ්මීරය, ඇසැම්, පන්ජාබ් ආදී පළාත් ඇතිකරල මධ්‍යම ආණ්ඩුව යටතේ ෆෙඩරල් ආණ්ඩුක්‍රමයක් ඉන්දියාවට ලබා දුන්නා. මධ්‍යම ආණ්ඩුවට

බැහැ මේ පළාත් සභා විසුරුවා හැරල පළාත් සභාවලට තිකිරිති ගේන්න. නුමුත් විදේශ ප්‍රතිපත්තිය ආදිය ගැන මධ්‍යම ආණ්ඩුවට සම්පූර්ණ බලය තියෙනවා. ඒකත් පෙඩරල් ක්‍රමයක්. අප එහෙම ක්‍රමයක් ඇති කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. **අපේ පළාත් සභා මධ්‍යම ආණ්ඩුවට යටත්, මධ්‍යම ආණ්ඩුවට පුළුවනි තුනෙන් දෙකක් ඡන්දය දීල ඒව අහෝසි කරන්න.** නමුත් බලතල රාශියක් අප පවරා දෙන්න බලාපොරොත්තු වෙනව පළාත් සභාවලට. ලෝකෙ හුඟක් රටවල මධ්‍යම ආණ්ඩු දියුණු වෙන්න. දියුණු වෙන්න. කල්පනා කළා අප අපේ බලතල ක්‍රම ක්‍රමයෙන් දෙන්න ඕන කියල පළාත්වලට. ඒක ලෝකෙ සිරිතක් අද. අපත් එහෙම කරල තියෙනවා. ඉස්සෙල්ලම පටන් ගත්තේ ගමසභාවලින්. ඊට පස්සේ සුළු නගර සභා බලතල. ඊට පස්සෙ මහ නගර සභා බලතල. දැන් අපේ කොළඹ නගර සභාව අවුරුදු එකසිය විස්සක් විතර පැරණියි. ඊට ඉස්සෙල්ල කොළඹ නගර සභාවක් තිබුණේ නැහැ. මහ ආණ්ඩුවෙන් තමයි හැම පළාතක්ම පාලනය කළේ.

අද කොළඹ නාගරික මන්ත්‍රීවරුන් රාශියක් මෙතැන ඉන්නවා. ඒ අයට විශාල බලයක් තියෙනවා. මහා ආණ්ඩුව ඒ අයව පාලනය කරන්නෙ නැහැ. කොළඹ පාලනය කරන්නෙ නගරාධිපති සහ නගර සභාවෙ මන්ත්‍රීවරු. පසු කාලයේදී අප ඇතිකලා දිසා මණ්ඩල. දැන් දිසා කිහිපයක් එකතු වෙලා බලාපොරොත්තු වෙනවා පළාත් සභා ඇති කරන්න. ලංකාවෙ තියෙනව පළාත් නවයක්. පළාත් නවයක් හැමදම තිබුනෙ නැහැ. ඉංග්‍රීසින් යටතේ පාලනය ප්‍රථමයෙන්ම පටන් ගත්තාම පළාත් පහක් හයක් තිබුනා. උතුරු පළාතට ඒ කාලෙ අනුරාධපුරයත් ඇතුළු වුනා. නමුත් ග්‍රෙගරි ආණ්ඩුකාරතුමා උතුරු බටහිර ප්‍රදේශ හා රජරට උතුරු පළාතෙන් වෙන් කෙරුවා. දැන් පළාත් නවයක් තියෙනවා. මේ නවයේ මායිම් අප වෙනස් කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ද්‍රවිඩ පෙරමුණ ඉල්ලනව උතුරයි නැගෙනහිර පළාතයි එක සභාවක් කරන්න කියල. අප ඒකට එකඟ නැහැ. ඇයි, නැගෙනහිර පළාත කැමති නැහැ උතුරු පළාත එක්ක වැඩ කරන්න. නැගෙනහිර පළාතේ වැඩි දෙනෙක් එක්සත් ජාතික පක්ෂයට ඡන්දය දීලා තියෙන්නෙ. අපේ මන්ත්‍රීවරු දහ දෙනෙක් ද එකොළොස් දෙනෙක් ද ඉන්නව ඒ පළාතෙන්. දෙමළ පෙරමුණේ ඉන්නෙ දෙන්නෙක් ද තුන්දෙනෙක් ද පමණයි. මා හිතන්නෙ උතුරු පළාතට සම්බන්ධ වෙනවාට නැගෙනහිර හුඟ දෙනෙක් විරුද්ධයි. මුස්ලිම් සිංහල කවුරුත් මෙකට විරුද්ධයි. දේවනායගම් මහත්මයා වැනි ද්‍රවිඩ නායකයනුත් විරුද්ධයි. උතුරු නැගෙනහිර පළාතෙ සීයෙන් හැත්තෑපහක් විතර ඊලාම් රාජ්‍යයකට සහ උතුරත් නැගෙනහිරත් සම්බන්ධවීමට විරුද්ධයි. ඒ විරුද්ධත්වයට ඉන්දියාවත් එකඟයි. නැගෙනහිර පළාත උතුරු පළාතට සම්බන්ධ කිරීමට අප ඉඩ දෙන්නෙ නැහැ.

උතුරු පළාතේ, විශේෂයෙන් යාපනේ සිටින ජනගහනයෙන් සීයෙට අසූවක් විතර ද්‍රවිඩ උදවිය. වව්නියා, මුලතිව්, මන්නාරම හා කිලිනොච්චිවල සිංහල මිනිස්සුත් ඉන්නවා. මුස්ලිම් උදවියත් ඉන්නවා. නමුත් සම්පූර්ණ උතුරු පළාත ගත්තොත් සීයෙන් හැත්තෑවක් හැත්තෑ පහක් විතර ද්‍රවිඩ පිරිසයි ඉන්නේ. අනිත් පළාත් හත සිංහල ප්‍රදේශ. ඒවායේ වැඩිහරිය සිංහල පිරිස් ඉන්නේ. මුස්ලිම් උදවියත් ඉන්නවා. දෙමළ උදවියත් ඉන්නවා. වැඩිපුර සිංහල. එහෙනම් අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙ සංශෝධනයක් කරල තුනෙන් දෙකේ ඡන්ද බලයක් ලබාගෙන අපේ ඒකීය රාජ්‍ය නැති නොවන විදියට මෙ පළාත් හතට පළාත් සභා ඇති කළොත් මොකක්ද තියෙන වැරැද්ද ? මේ පළාත් අටට මේ පළාත් සභා බලය දීමේ ඇති වැරැද්ද මොකක්ද ? බණ්ඩාරනායක මහත්මයා අවුරුදු හතළිහකට ඉස්සෙල්ලා යෝජනා කෙරුවා නම් ලෝකයේ මෙක පිළිගත්ත පාලන ක්‍රමයක් නම්, බලතල විමධ්‍යගත වීමේ ක්‍රමයක් නම්, මොකක්ද ඒකේ වැරැද්ද ? දූත් කොළඹ ප්‍රදේශයේ දිසා ඇමති, අපේ මල්ලිමාරච්චි මහත්මයා ආදී මහත්වරු ඉන්නවා. මුළු කොළඹ පළාතට තියෙනවා දිසා තුනක්, ගම්පහ දිසාව, කොළඹ දිසාව, කළුතර දිසාව, ඔය තුනේ විශාල මහජන සංඛ්‍යාවක් ඉන්නව, ඒ මුළු බටහිර පළාතට (වෙස්ටන් ප්‍රොවින්ස්) කියල කියන්නේ. ඒ පළාතේ උදවියට තමන්ගෙ වැඩකටයුතු පාලනය කිරීමට බලය දෙනවා නම් මහජනයාගේ ඡන්දයෙන් පත් කරන මන්ත්‍රීවරුන් අතුරෙන් ප්‍රධාන ඇමතිවරයෙක් සහ මන්ත්‍රී මණ්ඩලයක් පත් කරනවා නම් මොකක්ද ඒකෙ තියෙන වැරැද්ද, මට තේරුම ගන්න බැහැ, එහෙම නම් සිංහල පළාත්වල සභා හතක් ගැන ප්‍රශ්නයක් නැහැ. නැගෙනහිර ප්‍රදේශය ගැනත් ප්‍රශ්නයක් නැහැ. ඡන්දයක් තිබ්බොත්, මම හිතන්නෙ සිංහල උදවියත්, මුස්ලිම් උදවියත් එකතුවෙලා ඡන්දය දුන්නොත් නැගෙනහිර පළාතෙත් බලය ලැබෙන්නෙ රිලාම් සහ අමිර්තලිංගම් මහත්මයාගෙ පක්ෂයට නොවෙයි. මා කියපු එක්කාසුවෙලා වැඩ කරන සිංහල හා මුස්ලිම් පක්ෂයටයි. එතකොට අපිට ඉතුරු උතුරු පළාත විතරයි.

උතුරු පළාතත් ඒකීය රාජ්‍යයක් යටතේ වැඩ කළයුතුයි. මධ්‍යම ආණ්ඩුව ආණ්ඩුකාරතුමෙක් පත් කරනවා හැම පළාතකටම. එතුමාට සම්පූර්ණ බලතල තියෙනවා එතුමා ඉදිරියේ තමයි ප්‍රධාන ඇමතිතුමා දිවුරුම් දෙන්නෙ. එතුමා තමයි ප්‍රධාන ඇමතිවරු ඡන්දයෙන් පැරදුනොත් අස්වෙන්න නියම කරන්නේ. එතුමා තමයි ඒ පළාත් සභාව විසුරුවා හරින්නෙ. එතුමා තමයි ඒ පළාත් සභාව නැවත කැඳවන්නෙ. එතුමා තමයි ජනාධිපතිතුමාට හැම කරුණක්ම වාර්තා කරන්නෙ. එතුමා තමයි ජනාධිපතිතුමාගෙ නියෝජිතයා. එහෙම ආණ්ඩුකාරවරුන් 9 දෙනෙක් පත් කරනවා.

ප්‍රධාන ඇමතිවරයෙක් පත් කරන්නෙ පලාතෙ මහජනයාගෙ වැඩි කැමැත්ත අනුවයි. තත්ත්වය එහෙම නම් මට තේරෙන්නෙ නැහැ මොන හේතුවක් නිසාද සමහරු මේ පලාත් සභාවලට විරුද්ධ වන්නෙ කියල. මේ පලාත් සභා ක්‍රමය පිළිගන්නය කියල ද්‍රවිඩ පිරිසට ඉන්දියාවෙ ආණ්ඩුවත් කරුණු පැහැදිලි කරල දීල තියෙනවා. එහෙම පිළිගත්තොත් මේ අද මැරෙන සිය ගණන් උදවිය මරණෙන් බේරෙනවා. අප විඳින පාඩුවලින් නිදහස් වෙනවා. අප වියදම් කරන කෝටි නවසියය රට සංවර්ධනයට ඉතුරුවෙනවා. එවිට අපට පුළුවනි අපේ රට ලෝකෙ පිළිගන්න බැබලෙන රටක් හැටියට ක්‍රියා කරන්න.

අප අද සටන් කරන්නේ නතියෙන්. නමුත් වැඩි කාලයක් යන්නට ඉස්සෙල්ලා මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන් වෙයි. ත්‍රස්තවාදීන් සමාව ඉල්ලන්න පුළුවන්. අන්න ඒ නිසා තමයි අපේ රජය කල්පනා කරල තියෙන්නෙ, පලාත් සභා ක්‍රමය අනුව මේ ප්‍රශ්නය විසඳන්න, මේ ලේ වැගිරීම නවත්වන්න, මේ නාස්තිවන මුදල් වියදම් කිරීම නවත්වන්න, අපේ රටේ සාමයට කැමති මහජනතාවගේ යුතුකමක් තියෙනවා සාමය ඇති කිරීම සඳහා රජයට උදව් දෙන්න. මම හිතුව ඔබවහන්සේලාටත් එම කරුණ මතක් කිරීම මගේ යුතුකමක් කියල. මට බොහොම සන්තෝසයි මට අවස්ථාවක් ලැබීම ගැන ඔබවහන්සේලාට මේ කාරණාව ගැන පැහැදිලි කරන්න.

විසඳීම පමාවූනොත් පාඩුව

අපටමයි. . . .

## කැලණිය ටයර් සංස්ථාවේ ජාතික සේවක සංගමයේ වාර්ෂික මහා සභාව අමතා අතිගරු ජනාධිපතිතුමා විසින් 1986.07.26 වෙනි දින කරනු ලැබූ කථාව

ප්‍රශ්න ඇහීමෙන් සහ මීට ප්‍රථම ඇමතිවරුන්ගේ කථාවලින් අද තියෙන ජාතික ප්‍රශ්න ගැන හුඟක් දුරට තමුන්නාන්සේලාට උත්තර ලැබෙන්න ඇති. පැහැදිලි වෙන්න ඇති. ඒ නිසා මගේ කථාව මා සීමා කරනවා. මක්නිසාද් අප සාම සාකච්ඡාවක් ඇති කරලා තියෙන්නේ. මක්නිසාද රජය අද තියෙන මේ ජාතික ප්‍රශ්නයට පුළුවන් ඉක්මනට විසඳීමක් බලාපොරොත්තු වෙන්නෙ කියලා. තෝරා දීමට.

මේ සභාවේ ඉන්න භාග වෙලාවට වැඩි දෙනෙක් — විශාල පිරිසක් —සියයට අනූපහක් අනූහයක් විතර සිංහල. අප යම් විසඳීමක් මේ ප්‍රශ්නයට දෙනව නම්, පිළිගන්නවා නම්, ඒ විසඳීමෙන් ප්‍රයෝජන ලැබෙන්නේ ලංකාවේ ඉන්න සිංහල සියයට හැත්තෑතුන් දෙනාටයි. සුළු ජාතීන් ඉන්නවා. සියයට විසිහතක්. අද මේ ප්‍රශ්නය විසඳුවේ නැත්නම්, කරදරය, භාතිය බුක්ති විඳින්නේ සියයෙන් හැත්තෑතුන් දෙනෙකු වෙන සිංහලයනුයි. කරදර ලැබෙන සියයෙන් විසිහතක් ද්‍රවිඩ. ඒ නිසා යම් කෙනෙක් මේ ප්‍රශ්නය විසඳන්න බලාපොරොත්තු වෙනවානම් ඒ විසඳන්න බලාපොරොත්තු වෙන්නේ මහජාතියට ප්‍රයෝජනයක් ලැබෙන විදියටයි. මහජාතිය අද සියයට හැත්තෑ තුනක් නිසා. මගේ කථාවේදි මම ඒක පැහැදිලි කරලා දෙන්නම්. අද ලංකාව ලෝකයේ තනියෙම ගමන් කරන ජීවත්වෙන රටක් හැටියට පිළිගන්න බැහැ. ඉස්සර කොහොම වුණත් අද එහෙම නෙවෙයි. රජය බැඳිලා තියෙන්නේ මහජනයාගේ තත්ත්වය ආර්ථික අතින් උසස් කරන්නයි.

ඒ උසස් කිරීමට රක්ෂාවල් උවමනා කරනවා. පඩි නියම විදියට ලැබෙන්නට උවමනා කරනවා. ගෙවල් උවමනා කරනවා. ඉස්කෝල උවමනා කරනවා. සංවර්ධන වැඩවලට අයිති සියලු දේ උවමනා කරනවා. ගෙයක් නැතුව ප්‍රයෝජනයක් නැහැ යම් කෙනෙකුට. අප හුඟක් දෙනෙක් ගෙවල්වල ඉන්න උදවිය. නමුත් ගෙවල් නැති උදවිය ඉන්නව. ආදායමක් නැති උදවිය ඉන්නව. රක්ෂාවක් නැති උදවිය ඉන්නව. අප මේ ප්‍රශ්නය විසඳන්න ප්‍රමාද වෙන්න ප්‍රමාද වෙන්න ඒ අහිංසක මනුෂ්‍යයන්ටයි පාඩු වෙන්නෙ. පාඩුව මේ කලිසම් ඇඳගෙන, කෝට් ඇඳගෙන, පුටු උඩ වාඩිවෙලා ගෙවල්වල හීතල කාමරවලට වෙලා ඉන්න මේ සංස්ථාවල සභාපතිවරු ආදි

උදව්යට නොවෙයි. අපට මේ රට දියුණු කරන්න බැරි වුණොත් ඒ පාඩුව විඳින්නේ මහජනයයි. මම මහජන නායකයෙක්. අවුරුදු හතළිස් ගණනක් මාව පත්කෙරුවෙ මහජනයයි. මම මන්ත්‍රී තරඟ පහළොවකට විතර ඉදිරිපත් වෙලා තියෙනව. මෙ ඡන්ද කොට්ඨාශයේ ගමක් ගානේ ගිහිල්ල තියෙනව. ඇවිදල තියෙනව. ජනාධිපතිතුමා හැටියට මා පත්වුණේ ලංකාවෙ හැටලක්ෂයක් ඡන්ද දායකයන්ගෙ ඉල්ලීම අනුවයි. සීයෙන් පනස්තුනක් ඡන්ද ලැබිල තියෙනව. මේ ලංකාවෙ අවුරුදු දෙදහස් පන්සීයක ඉතිහාසයේ වෙන කිසි පුද්ගලයෙක් මෙහෙම නායකත්වයට පත් වෙලා නැහැ. අනාගතයේදී එන්න පුළුවන් වෙයි. එන්න ඕනෙ.

එහෙමයි අප මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කරල තියෙන්නෙ. රටේ නායකය මහජනයගෙ නායකය. අවුරුදු දෙදහස් පන්සීයක් තිස්සේ රජවරු හිටිය. අපට හිටිය ආණ්ඩුකාරවරු. අපට හිටිය ගොපල්ලව ජනාධිපතිතුමා. ඒ එක්කෙනෙක්වත් මහජනය පත්කරපු නායකයෝ නොවෙයි, මේ අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මාව පත්වෙනකන්. එහෙනම් පුළුවන් මට කියන්න බයක් නැතුව, කිසි කෙනෙක් විරුද්ධ වෙන්නෙ නැතුව, මේ රටේ කිසිම පුද්ගලයෙක් නැහැ, නායකයෙක් හෝ නායකත්වයක් දරන්නෙ නැති පුද්ගලයෙක් නැහැ මා විතර රට වෙනුවෙන් වැඩ කරපු, වැඩ කරන. කථා කරන්න පුළුවන් එකම නායකය. එහෙනම් මම මේ ප්‍රශ්නෙට විසඳීමක් බලාපොරොත්තු වෙනව නම්, මට බලාපොරොත්තු වෙන්න බැහැ මේ රටේ වැඩි ජාතියට හානි වෙන විදිහට විසඳීමක්. උත්සාහ ගන්නත් බැහැ. කැමති වුණත් බැහැ. යම් තීරණයකට බහිනව නම් ඒ තීරණය වැඩි දෙනාගෙ ප්‍රයෝජනයටයි. ඇයි මා එහෙම කියන්නෙ ? පංගුවක් උදව්ය කියනව අද තියෙන ප්‍රශ්නය, මා ඒක තෝරා දෙන්න ඕනෙ නැහැ, විසඳන්න පුළුවන් කියල යුද්ධ මාර්ගයෙන් පමණක්. මට ඊයෙ පෙරේදත් ලියුමක් ආව, බැනල. මා දන්න කෙනෙක්, තමුන්නාන්සෙ හදනව පළාත් සභා ඇති කරල බලය දෙන්න දෙමළුන්ට. දෙමළුන්ව මරන්නයි තියෙන්නෙ කියල ලියල එවල තියෙනව. මම කියන්නම් ඇයි ඒක අමාරු කියල. පුළුවන් වුණත්, ඇයි එහෙම කරන්න යුතු නැත්තෙ කියල. එහෙම කෙරුවොත් සිංහල ජාතියටයි පාඩු වෙන්නෙ.

## ජනතාවට ලැබුණු කරදර දනිමු

ඒ වාගෙම ලියුම් ලැබෙනව, ජූලි මාසෙ 1983 කෝලාහලෙන් පාඩුව වුණේ සිංහල මනුෂ්‍යයන්ට කියල. ලියුම් ලැබෙනව, අපිට ගෙවල් නැහැ, අපිට රක්ෂාවල් නැතිවුනා. අපි වැඩ කරන ඒව අයිති දෙමළ මිනිස්සුන්ට. අපේ කාර්යාලය පිච්චුව. සිනමා ශාලා පිච්චුව. අපි පාරට බැහැල තියෙනව. කිසි

කෙනෙක් අපි ගැන සොයන්නෙ නැහැ. ලේසියි නායකයන්ට කියන්න සිංහල ජාතියට පාඩු වෙනව කියල. අපිත් සිංහල. අපේ රක්ෂාවල් නැතිවුණා අර කෝලාහලෙන් කියා. ඒ නිසා මේ ලියුම් තමුන්නාන්සේලා ඔක්කොටම නොලැබුණත් මටයි ඇමතිවරුන්ටයි ලැබෙනව. මන්ත්‍රිවරුන්ට ලැබෙනව. අප දන්නව කොයි තරම් කරදරයට පත්වුණාද කියල ජූලි මාසෙ 1983. කෝලහල ප්‍රශ්නෙන්. ඊට පස්සෙ මොකද වුණේ ? ඊට පස්සෙ මුළු ලෝකෙ කල්පනා කෙරුවා මේ රජය සිංහල රජයක්. සුළු ජාතීන් නැති කරනව, විනාශ කරනව. දකුණු අප්‍රිකාවෙ 'අපාතීඩ්' වාගෙ ජාතිවාදී ආණ්ඩුවක් කියල අපව සැලකුව. එක කථිකයෙක් කැනඩාවෙ, මේ ලංකාවට ආව පත්‍ර කතෘවරයෙක්. කැනඩාවෙ විශ්වවිද්‍යාලයට ගිහිල්ල කිව්වලු මෙක "පරය ආණ්ඩුවක්" කියල. ශ්‍රී ලංකාවෙ ආණ්ඩුව පරය ආණ්ඩුවක් කියල. පංගුවක් අය කියනව ඉඩී අමීන් වාගේ නායකත්වය තියෙන ආණ්ඩුවක් කියල. මේව තමයි ඒ කාලේ ජූලි මාසෙ කලබලවලින් පස්සෙ ඇති වුණ අදහස් මුළු ලෝකෙම.

අද අපට පුළුවන්ද ? ලෝකෙ උපකාර නැතුව, මුදල් නැතුව, ආධාර නැතුව, මිත්‍රශාවය නැතුව ජීවත් වෙන්න. ඒක ඔය ප්‍රශ්නය අහපු මහත්වරු කල්පනා කරන්න. හුඟක් දෙනෙක් කල්පනා කරන්නේ නැහැ. අපේ අයවැය ලේඛනයේ තියෙන ඔක්කොම මුදල් පාවිච්චි වෙන්නේ, පඩි ආදිය ගෙවන්න දිනපතා වියදමට. අපේ සංවර්ධන වැඩ ඔක්කොම කෙරෙන්නේ ලෝක බැංකුවෙන්, ලෝකයේ රටවල්වලින්, අපේ මිත්‍රයන්ගෙන් ලැබෙන ආධාරවලින්. පංගුවක් අපට ණය ආධාර දෙනවා, පංගුවක් අපිට තෑගි දෙනව, විශාල කොටසක්. ඊයෙ මුදල් ඇමතිතුමා පාර්ලිමේන්තුවෙදි කිව්ව, කොච්චර කෝටි ගණනක් 1987ටත් ලැබිලා තියෙනව කියල. මහවැලි ගඟ ව්‍යාපාරයට ඔක්කොම මුදල් වියදම් කෙරුවෙ ඒ ආධාරවලින්, නැත්නම තෑගි මුදල්වලින්. සුළු ගණනක් නොවෙයි. කෝටි ගණනක්. ඒ ව්‍යාපාරයෙන් ප්‍රයෝජනයක් ලැබුණද ? අප කල්පනා කෙරුවොත් එකක් ගැන පමණක්. විදුලි බලය ගැන. ඉඩම් ගැන නොවෙයි. විදුලි බලය ගැන. අද අපට ඒ ව්‍යාපාරය නිසා ජල මාර්ගයෙන් විදුලි බලය නොලැබුණා නම් අද අපි ඔක්කොම ඉන්නෙ කරුවලේ. හැබැයි දැන් තමුන්නාන්සේලාගේ පළාතේ විදුලි බලය අඩුපාඩු තියෙනව. අප ඒවත් හදනව. කෝටි ගණන් රුපියල් වියදම් කරනව. ලෝක බැංකුව පොරොන්දුවෙලා තියෙනවා. ආධාර දෙනව කියල. ඒ විදුලි බලය බෙදීමේ තියෙන කරදර අඟක් කරන්න.

අපි බලයට එනකොට සීයට හතළිස් පහක්, පණහක්, අපි ලබා ගන්නේ විදේශ ආදායමින්. තේ විකුණලා. රබර්, පොල් ආදිය විකුණල. ඒ විදේශ ආදායමෙන් තමයි අපිට උවමනා කරන ආහාර ගන්නෙ. රෙදිපිළි ගන්නෙ. පිටින්.



ජනාධිපතිතුමා ටයර් සංස්ථාවේ රැස්වීම් ශාලාව කරා පැමිණෙයි



ටයර් සංස්ථාවේ රැස්වීම් අමතයි

නොයෙක් නොයෙක් බඩුමුට්ටු ගත්තෙ. එතකොට ඔක්කොම කිරි පිටි ගත්තෙ. ඒ ලබාගත්ත විදේශ මුදල්වලින්. සීයට හතළිස් පහක්. සීයට පණහක්. අප පාවිච්චි කෙරුවෙ තෙල් වර්ග ගේන්න. විදුලි බලය නිපදවන්න. ඊට පස්සේ තෙල් මිළ වැඩි වුණා. එහෙම නම් හතළිස් පහ. පණහ. හැට විතර වෙන්න පුළුවනි. අපිට ජල විදුලි බලය නොලැබුණා නම් තෙල් මාර්ගයෙන් විදුලි බලය නිපදවන්න අපේ මාර්ගය වෙනස් වෙන්න ඕනෙ.

ටිකක් කල්පනා කරන්න. අපි හිතමු හැත්තෑ හතේ බණ්ඩාරනායක මහත්මිය දිනුව කියල. දිනුව නම් අප පටන් ගත්ත විවෘත ආර්ථික ව්‍යාපාරය පටන් ගන්නෙ නැහැ. මහවැලි ගඟ ව්‍යාපාරය පටන් ගන්නෙ නැහැ. අපට වුවමනා කරන විදුලි බලය එහෙනම් සීයෙන් පණහක් හැටක් වියදම් කර තෙල් ගෙනල්ල නිපදවන්න සිද්ධ වෙනවා. එහෙනම් එද තියෙන විදුලිබලය වැඩිවෙන්නෙ නැතිව අලුත් කර්මාන්ත ඇති කරන්න බැහැ. මෙ කර්මාන්තශාලාව නමුත්තාත්සේලා තවත් දියුණු කරන්න යනවා. නිදහස් වෙළෙඳ කලාපයෙ කර්මාන්තශාලා රාශියක් ඇතිවෙලා තියෙනවා. සීයයට සීයක් තැත්තම ඊටත් වැඩි ගණනක් අපේ විදුලි බලය පාවිච්චිය වැඩිවෙලා තියෙනවා.

ගිය අවුරුද්දේ පමණක් ගම් තුන්සීය පනහකට අප විදුලි බලය දිල තියෙනව. ඒවා අලුතෙන්. ඒ කාලේ පාවිච්චි කළාට වඩා විදුලි බලය පාවිච්චි කරන විදිහක්. ඒ එකක් හරි කරන්න බැරි වෙනව. අපේ ආදායමෙන් සීයයට හැටක්. හැත්තෑවක්. ඊටත් වැඩිය ගණනක් අපට වියදම් කරන්න වෙනව තෙල් ගෙනල්ල විදුලි බලය නිපදවන්න. අපේ තියෙන ආලෝකය ආරක්ෂා කරන්න. එහෙනම් කොහෙන්ද අප ගේන්නේ පිටි ? කොහෙන්ද අපි ගේන්නෙ අපිට වුවමනා කරන වස්ත්‍ර ? අද ගේන්න වුවමනාවක් නැහැ. අද ඒව හුඟක් අප හදනව. අපට වුවමනා කරන රෙදි ඔක්කොම මේ ලංකාවෙ හදනව. පිටින් ගේන්න තහනම් කරල තියෙනව. පිටින් ගේන හුඟක් ආහාර වර්ග තහනම් කරල තියෙනවා. පිටි ඇර. ඒව පුළුවන් වුණේ මහවැලි ගඟ ව්‍යාපාරයෙන් ඇතිවූ විදුලි බලය. කොත්මලෙන්. වික්ටෝරියාවෙන්. රන්දෙණිගලින්. උල්හිටිය. මාදුරුඔය. ඒවයෙන් ඇති වුණු විදුලි බලයෙන්. එපමණයි. අද අප පාවිච්චි කරන තෙල් ප්‍රමාණය සීයට විස්සක් අඩු කරල තියෙනවා. කලින් සීයට පණහක් හැටක් පාවිච්චි වුණා නම් අපේ විදේශ විනිමය අද සීයයට පහලොවක් විස්සක්වත් පාවිච්චි කෙරෙන්නෙ නැහැ. ක්‍රි. ව. 2000 වෙනකන් අපට ඇති වෙන්න තියෙනව විදුලි බලය. ඊට පස්සෙන් විදුලි බලය ඇති කිරීමට අපි සමනල ගඟ ව්‍යාපාරය ආරම්භ කරනවා. අපි ආරම්භ කරනව රත්වැඹෙ ව්‍යාපාරය. අප කල්පනා කරනව කළු ගඟ ව්‍යාපාරයත් ආරම්භ කරන්න.

ඒවයෙන් අපට. අවුරුදු සීයකට විතර ඇති වන විදුලි බලය ලබාගන්න පුළුවන් කරදරයක් නැතුව. කොහෙන්ද මේව ලැබෙන්නෙ ? මේ සල්ලි ! මේ ලංකාවෙ සල්ලි නොවෙයි. අපට ආධාර දෙන පිරිසගෙන්.

මේ වතාවෙ මුදල් ඇමතිතුමා ප්‍රංශ රටට ගියාම ආධාර ගැන සාකච්ඡා කරන්න ඒ ඔක්කොම ඇහුවෙ තමුන්නාන්සේලාගෙ මේ තියෙන ජාතික ප්‍රශ්නය කවදද විසදන්නෙ කියල. මුදල් ඇමතිතුමා කිව්වලු අප දැන් සාම සාකච්ඡාවක් ඇති කරල තියෙනව කියල. "හැම තිස්සෙම තමුන්නාන්සේ ප්‍රංශ රටට එනකොට සාම සාකච්ජා ඇති කරලයි තියෙන්නෙ, මෙහෙ අප ආධාර දුන්නට පස්සේ සාම සාකච්ජාව නැති කරනවා" කියල. ඒ ගමන කිව්වලු "නෑ නෑ මේ ගමන අපි කොහොමහරි විසදීමක් බලාපොරොත්තු වෙනවා" කියල. අපට වුවමනා මුදල් ඔක්කොම ලැබුණා. එහෙත් ලෝකයේ අපට විරුද්ධව හිටපු සියලූ දෙනාම සාම සාකච්ජාව නිසා අපට පක්ෂවෙලා තියෙනවා රේගන් ජනාධිපතිතුමාගෙන් ලියමනක් ලැබුණා ඊයෙ පෙරේද. එංගලන්ත ආණ්ඩුවත් අපට පක්ෂයි. කැනඩාව අපට සම්පූර්ණයෙන් විරුද්ධ වෙලා හිටිය. දැන් අපට පක්ෂවෙලා තියෙනවා. ඔස්ට්‍රේලියාව, ජපන් රට, ජාත්‍යන්තර විදියට බැලුවහම අද මේ ලංකාවට තිබුණු අමනාපකම් විරුද්ධතාවයන්, සුළු ජාතියක් නැති කරන ආණ්ඩුවක්, පිරිසක්, හැටියට තිබුණු අදහස් මැකිල ගිහිල්ල තියෙනවා. ඒක විශාල ප්‍රයෝජනයක්. විශේෂයෙන් අපට ලැබෙන මුදල් ආධාරවලට. ඒ මුදල් ආධාර නැතිව, මම ඉස්සෙල්ල පෙත්වල දුන්න ප්‍රථම හානිය ලැබෙන්නෙ සිංහල ජාතියට.

## ඉන්දියාවේ මිත්‍රත්වය

අනිත් ප්‍රශ්නෙ අපි ජාත්‍යන්තර විදිහට කල්පනා කෙරුවහම අපේ ලංකාවට අසල තියෙන ලෝකයෙම විශාල රටක් ඉන්දියාව. විශාල රටක් බලවත් රටක්. මා හිතන්නෙ රටවල් හතර පහකින් බලවත්ම රටක්. ජනගහනයෙන් දෙවැනි විදියට සලකන රට. චීන රටට පමණයි දෙවෙනි වෙන්නෙ. ජනගහනය මා හිතන්නෙ කෝටි අසූවක් විතර ඉන්නව. ඉන්දියාවෙ පැත්තක තියෙනව තමිල්නාඩු රාජ්‍යය. තමිල්නාඩු රාජ්‍යයෙ ඉන්නව දෙමළ ජනතාව කෝටි පහක් හයක්. ලංකාවෙ ඉන්නෙ ඔක්කොම එක්කෝටි පණස් ලක්ෂයයි. අපට හතර පස් ගුණයක් විශාල පළාතක් ජනගහනයෙන්. මේ ලංකාවෙ අද තිබෙන ප්‍රශ්නයේ ප්‍රධාන කොටසක් තමයි යාපනේ නැගෙනහිර පළාත්වල ඉන්න ද්‍රවිඩ උදවිය. එහි සිට හැතැප්ම විස්සක් පමණයි තියෙන්නෙ ඉන්දියාවට ගමන් කරන්න බෝට්ටුවකින්. ඒ නිසා මේ ද්‍රවිඩ උදවියට කරදරයක් ඇතිවුනාම දුවන්නෙ නැත්තම් පීනන්නෙ තමිල්නාඩුවට. ලක්ෂයක් විතර ගිහිල්ලා එහි පදිංචිවෙලා

ඉන්නවලු අනාථවෙලා. ඒක ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. අපේ රටේ ත්‍රස්තවාදී පිරිස ඔක්කොම ඉන්නෙ එහෙ. තමිල්නාඩුවෙ හැංගිලා ඉන්නෙ. නොයෙක් නොයෙක් විදියෙ ආධාර ලැබෙනවා. මේ ප්‍රශ්නෙ විසඳන්න ඉතාමත්ම අමාරුයි. විසඳන්න බැහැ තමිල්නාඩුවෙ සහ ඉන්දියාවෙ මහ ආණ්ඩුවෙ ආධාර නැතිව. ඒ උදවිය නිතරම කියන්නේ තුඹලා එක්කායු වෙන්න ඕනෙ. උතුරු පළාතේ ද්‍රවිඩ සෙනග එක්ක. උතුරු පළාතේ ද්‍රවිඩ සෙනග වෙනුවෙන් උතුරු පළාතේ ආසන දහහතරක්ම දිනුවෙ ද්‍රවිඩ එක්සත් පෙරමුණයි. අමිර්තලිංගම මහත්මයගෙ නායකත්වයෙන් වැඩ කරන සෙනගයි. හැම ආසනයක්ම ඒ ගොල්ලෝ දිනුවා උතුරු පළාතේ.

නැගෙනහිර පළාතේ එක්සත් ජාතික පක්‍ෂය වැඩිය දිනුව. ඒ පැත්තෙන් තුනක් ද කොහෙද දිනුවෙ මා හිතන්නෙ. අප දිනුව දහයක්. නමුත් උතුරු පළාතේ දහ හතරක්ම දිනුවෙ ඒගොල්ලො. ඇයි ඒ ගොල්ලො එක්ක එකතු වෙන්නෙ නැත්තෙ ? ඇයි කතා කරන්නෙ නැත්තේ ? ඇයි විසඳන්නෙ නැත්තෙ ? අපට විශාල කැක්කුමක් තියෙනවා ද්‍රවිඩ සෙනග සම්බන්ධව කෝටි පහක් හයක් ද්‍රවිඩ උදවිය ඉන්න නිසා අද මුළු ඉන්දියාවම ඒ පැත්ත අරන් තියෙනවා. ජාතීන් රාශියක් ඉන්නවා. ප්‍රාන්ත රාජ්‍ය රාශියක් තියෙනවා. ඒගොල්ල ඔක්කොම අරන් තියෙනව ඒ පැත්ත. හැමදම ලෝක් සභාවේ මේ ගැන කතා කරනවා. අදත් කථා කරලා තියෙනවා. ඊයේත් කථා කරලා තියෙනවා. මෙහි ඇතිවන සිද්ධීන් එහාට යවනව මේ ත්‍රස්තවාදීන් බොරු ප්‍රචාරය කරල.

යුද හමුදුවෙන් ගැහුවාම ත්‍රස්තවාදී කඳවුරුවලට ඒක ආරංචි කරනවා සාමාන්‍ය මනුෂ්‍යයන් මැරුව කියල. ඒක අපිට වළක්වන්න බොහොම අමාරුයි. කොච්චර කිව්වත් අහන්නෙ නැහැ. ඒ නිසා ජාත්‍යන්තර රටවල්වල ආධාර ජාත්‍යන්තර රටවල්වල පක්‍ෂපාතීකම ඉල්ලනව වාගෙ. ඒ වාගේම වැදගත් ඊටත් වඩා වැදගත්. ඉන්දියාවෙන් තමිල්නාඩුවෙන් ආධාර සහ පක්ෂපාතීකම අපට ලැබෙනව නම්. දැන් මේ සාම සාකච්ඡාවට ඒක ලැබිල තියෙනවා. ඉන්දියාවෙ මහ ආණ්ඩුව පොරොන්දු වෙලා තියෙනව ඇතැම් ඉල්ලීම්. ත්‍රස්තවාදීන්ගෙ සහ ද්‍රවිඩ සංගමයේ ඉල්ලීම්. ඒ ගොල්ලො ප්‍රතික්ෂේප කරනව කියල. අපේ ආණ්ඩුව ඒගොල්ලො එක්ක සාකච්ජා කරල අපට පුළුවන් විදිහට විසඳුමක් ලබාගන්න ඕනෙ කියල. ඉන්දියාවෙ මහ ආණ්ඩුවෙන් සහ තමිල්නාඩුවෙ ආධාර අපට වුවමනායි. අවශ්‍යයි. මෙක විසදන්න. අද ඒ දෙගොල්ලොම අපේ පැත්ත දිහා බලනව. ඒ නිසා මේ සාම සාකච්ජාව වුවමනයි. අප තීරණයකට බහින්න ඕනෙ අපට කරදරයක් නොවන විදිහට. අනික් කොටස තමයි ලංකාවෙ ද්‍රවිඩ. සිංහල. මුස්ලිම්. ජනතාව. ඒගොල්ලන්ගෙන් වැඩි දෙනාගෙ ආධාර උවමනා කරනවා.

යුද්ධ කාලේදී රටේ සාමය අවශ්‍යයි. ආණ්ඩුව ගෙනයනව නම් එක පළාතක යුද්ධයක්. ඒ යුද්දෙ කරන කාලේ අනික් පළාත්වල සාමය තියෙන්න ඕනෙ. නැත්නම් යුද්ධ හමුදාව සම්පූර්ණයෙන් පාවිච්චි කරන්න බැහැ. යුද්ධ කෙරෙන පළාත්වල, අනිත් පළාත්වලත් ඒ ගොල්ලො බෙද හරින්න සිද්ධ වෙනව. අපට අද වෙනතුරු ඒ සාමය ලැබිල තියෙනව. හුඟක් දෙනෙක් හදනව කරදර කරන්න. හුඟක් දෙනෙක් හදනව පෝස්ටර් අලවන්න. ඒ කරන්නේ මහජනයගෙ හිත ආණ්ඩුවට විරුද්ධ කරන්නයි. ඒ නිසා පුළුවන් නම් සෘජු ක්‍රියාවන් ඇති කරන්න. අප ප්‍රජාතන්ත්‍රවාදී නිදහස නැති කරල නැහැ කොච්චර කරදර තිබුණත්. නිදහසේ ලියන්න පුළුවනි, නිදහසේ කතා කරන්න පුළුවනි. නිදහසේ ප්‍රවෘත්ති පත්‍ර අච්චු ගහන්න පුළුවනි. නිදහසේ සභා කැඳවන්න පුළුවනි. නමුත් අප කියන්නෙ වැරදි ක්‍රියා පමණක් කරන්න එපා. මහජනයගේ හිත් පෙරළන්න එපා. මහජනයව අවුස්සන්න එපා. රජයට මේ ප්‍රශ්නය විසදන්න වැදගත් කාරණා රාශියක් කරන්න තියෙනව. යුද්ධ හමුදාව පාවිච්චි වෙනව, අපේ තරුණයො ගිහිල්ල ඒ පැත්තෙ මැරෙනව. මහජනයගෙ හිත මේ ගැන බොහොම කලබල වෙනව. තවත් කලබල කරන්න එපා.

යුද්ධයක් නම් අප ඊට මුහුණ දිය යුතුයි කියල ලංකාවෙ ඉන්න සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් සියලු දෙනාගෙම සහයෝගය, උතුරු නැගෙනහිර පළාතෙ ත්‍රස්තවාදීන් ඇර අප බලාපොරොත්තු වෙනව. මධ්‍යම ලංකාවෙ ඉන්නව ලක්ෂ පහළොවක් විතර ද්‍රවිඩ උදවිය. ඉන්දියාවෙ ද්‍රවිඩ උදවිය. ඒ උදවිය අප තොවෙයි ගෙනාවෙ. ඒ උදවිය තනියෙන් එහෙන් ආවෙත් නැහැ. ඉංග්‍රීසි ආණ්ඩුව ගෙනාව අවුරුදු සීයකට එකසිය පණහකට ප්‍රථම. අද ලාංකිකයො. ඒ ගොල්ලන්ව අවුස්සන්න හුඟක් ත්‍රස්තවාදීන් උත්සාහ කරනව, මම දන්නව ඒක. නිතරම කලබල කරනව.

තොන්ඩමන් මහත්මයගෙ වෘත්තීය සමිතියත්, ගාමිණී දිසානායක මහත්මයාගෙ, එක්සත් ජාතික පක්ෂයෙ මෙහෙයවීමෙන් කෙරෙන වෘත්තීය සමිතියටත් අයිති සියෙන් අතුවක්, ඒ ද්‍රවිඩ සේවකයන්. ඒ දෙක අපට පක්ෂයි. උදව් කරනව. ඒ නිසා අපට පුළුවන් සාමය ආරක්ෂා කරන්න ඒ මැද පළාතෙ. අපි ඒ උදවියන් තල්ලු කරන්නද ත්‍රස්තවාදීන්ගෙ ඔඩොක්කුවට. රජයේ ප්‍රතිපත්තියක් එහෙම නැහැ. රජයේ ප්‍රතිපත්තිය තියෙන්නෙ ඒ උදවියත් අපි එක්ක සාමයෙන් වැඩ කරන්න. මේ ප්‍රශ්නය විසදන්න.

එහෙමනම් ලංකාවේ ජාත්‍යන්තර කාරණාවල් රාශියක් ගැන කල්පනා කරන්න ඔන මේ ප්‍රශ්නය විසදන්න. මම දූත් ඒවා මතක් කෙරුවා. ඒ නිසා අප මේ සාම සාකච්ඡාව ඇතිකරන කොට අපට වැදගත් ආධාර රාශියක් ලැබුණා. එකක් නම් ඔක්කෝම ලියාපදිංචි කරපු දේශපාලන පක්ෂවලට අප

ආරාධනා කළා එන්න අපි මේ ප්‍රශ්නය ගැන සාකච්ඡා කරන්න කියලා. රජයෙත් ඒ උදවියට අවස්ථාව දුන්නා. රජයේ අදහස් සාකච්ඡා කිරීමට. පක්ෂ දෙකක් බැහැ කිව්වා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, මහජන එක්සත් පෙරමුණත්. අනික් ඔක්කොම ඇවිල්ලා තියෙනවා. විශේෂයෙන්ම වෘත්තීය සමිති බල තියෙන පක්ෂ, සමසමාජ පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය, ශ්‍රී ලංකා මහජන පක්ෂය ආදී පක්ෂ ඇවිල්ලා තියෙනවා. සීයෙට අනූවක් විතර සමිති අයිති මේ පක්ෂවලටයි. එක්සත් ජාතික පක්ෂයටයි. ඒක ලොකු වාසියක්. මේ උදවිය ඔක්කොම ඇවිල්ලා සුමානයක් දෙකක් සාකච්ඡා කරලා රජයේ යෝජනා වැඩි කොටසක් පිළිඅරගෙන තවත් යෝජනා රාශියක් ඉදිරිපත් කරලා තියෙනවා. ඒ නිසා අපට මේ ප්‍රශ්නය විසඳීමට එක පක්ෂයක් විසින්ම, එක්සත් ජාතික පක්ෂය නොවෙයි, ආණ්ඩුව නොවෙයි අර පක්ෂ දෙක හැර අනික් ඔක්කොම පක්ෂ දැන් එකතුවෙලා තියෙන්නේ.

තවත් වැඩිදුර සාකච්ඡා කරලා අප බලාපොරොත්තු වෙනවා හැම පක්ෂයක්ම මේ දේශපාලන පක්ෂ සම්මේලනයට සම්බන්ධ කරලා, වැඩි දෙනෙක් කැමති යෝජනා සාකච්ඡා කරලා තීරණයකට බැහැලා නීතිරීති ගේන්න පාර්ලිමේන්තුවට. මේ ප්‍රශ්නය එහෙනම් අප බලාපොරොත්තු වෙන්නේ සාමයෙන් විසඳන්නයි. යුද්ධ හමුදාව එහෙම තියෙන්නේ ඒ පළාතේ නීති කඩන උදවිය එක්ක සටන් කරන්නයි

නීති කඩනවා නම් ඒ ගොල්ලා එක්ක සටන් කරන්න ඕන. ඒක නතර කරන්න බැහැ. අනිත් උදවියට සාකච්ඡා කරලා නීති මාර්ගයෙන් විසඳන්න පුළුවන් නම් මේ රටේ වැඩිපුර දේශපාලන පක්ෂ එකඟ වෙනවා නම් ද්‍රවිඩ සංගමය එකඟ වෙනවා. නම් ආසන 14ක් තියෙන සංගමය, උතුරු පැත්තේ තමිල්නාඩුව එකඟ වෙනවා නම්, ඉංදියාවේ මහ ආණ්ඩුව එකඟ වෙනවා නම්, එතකොට ඔක්කොම ජාත්‍යන්තර රටවල් එකඟ වෙනවා. කොච්චර බලයක්ද ? මේ ප්‍රශ්නය අපට විසඳන්න. සාමය, අහිංසාව, නීතිය, එක එක්කෙනා මරාගන්නේ නැතිව. නීතිය කියන්නේ පාර්ලිමේන්තුවට බලවත් ක්‍රියාවක්. මේ රට ප්‍රජාතන්ත්‍රවාදී රටක් හැටියට පාර්ලිමේන්තුවක් පත්කරන්නේ අවුරුදු හයකටයි. ඒ අවුරුදු හය අතරේ මහජනයාගෙන් අහන්න උවමනාවක් නැහැ. යම් ප්‍රශ්නයක් ගැන, නීතියක් ගැන, ඒ නීතිය පාර්ලිමේන්තුවේ වැඩි දෙනෙක් පිළිගන්නවා නම්, ඇතැම් නීති තුනෙන් දෙකක් ඡන්ද ලැබිලා පිළිගන්නවා නම් ඒවා නීතිගත වෙනවා. නීති පොතට ඇතුල් වෙනවා.

ජනමත විචාරණයක් ගැන මේ ලංකාවේ කිසි කෙනෙක් කල්පනා කළෙත් නැහැ, දන්නෙත් නැහැ, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුල් කරනකම්. ජනමත විචාරණයක් කරන්න පුළුවන් දෙවිදියටයි. යම් නීතියක් ගෙනාවාහම

ඒ නීතිය උසාවියට යනවා. උසාවියට කියන්න පුළුවන් මේක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධයි. ඒ නිසා මහජනයාගේ කැමැත්ත හොයා ගන්න ඕන කියලා. නැත්තම් ජනාධිපතිතුමාට පුළුවන් යම් ප්‍රශ්නයක් විසඳන්න අදහස් දැනගන්න ඕනනම් ජනමත විචාරණයකින් අදහස් දැන ගන්න. වෙන මාර්ගයක් නැහැ. මේ ලෝකයේ රටවල් ස්වල්පයක විතරයි ජනමත විචාරණයේ නීතිරීති තියෙන්නේ. එංගලන්තයේ නැහැ ඒ නීතිරීති. එංගලන්තයේ ප්‍රජාතන්ත්‍රවාදය පාර්ලිමේන්තුවේ අවුරුදු හාරපන්සියයක් තිබිල තියෙනවා. ඒ අවුරුදු හාරපන්සියය අතරේ එක වාතවක් විතරයි ජනමත විචාරණයක් තිබ්බේ. එංගලන්තය යුරෝපීය වෙළඳ මණ්ඩලයට ඇතුල්විය යුතුද නැද්ද කියලා තීරණය කරන්නයි. ඉන්දියාවේ එහෙම ක්‍රමයක් නැහැ. ඇමරිකාවේ ඇතැම් රාජ්‍යවල් අතරේ තියෙනවා. ස්විට්සර්ලන්තයේ නිතරම තියෙනවා. නමුත් බොහෝම ස්වල්පයක් පමණයි ප්‍රජාතන්ත්‍රවාදීව ආණ්ඩුකරන රටවල්වල ජනමත විචාරණයක් තියෙන්නේ. ඇයි ඒ ? අපි මහජනයා තෝරන ආණ්ඩුවට තමන්ගේ කාලය අතරේ ඕන නීතියක් ගේන්න පුළුවන් නිසා. අපයි කිව්වේ පාර්ලිමේන්තුවට යන හැම නීතියක්ම උසාවියට යන්න ඕන. උසාවිය කල්පනා කරලා බලයි මේ නීතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකඟද නැද්ද කියලා. එකඟ නම් අපට ගේන්න පුළුවන්. නැත්තම් තුනෙන් දෙකක ඡන්දය උවමනාද නැත්තම් ජනමත විචාරණයක් තියන්නද කියලා. දැන් මේ ගේන නීතිරීති පළාත් සභා ගැන උසාවියට ඉදිරිපත් කරනවා. උසාවිය කීවොත් දැන් මේක ඒකීය රාජ්‍යයක් තියෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධයි කියලා. එතකොට අපට ඒක අත්හරින්න වෙනවා. නැත්තම් ඒ වගන්ති වෙනස් කරන්න වෙනවා.

අප බලාපොරොත්තු වෙන්නේ නැහැ කිසිම විසඳීමක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධව, ඒකීය රාජ්‍යයට විරුද්ධව ගේන්න. අපට කරන්න බැහැ ඒක. ජනමත විචාරණයක් උවමනා කරනවා. නමුත් උසාවිය කිව්වොත් මේක කිසි කරදරයක් නැහැ. මේක ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකඟයි කියලා එහෙනම් මොකද්ද තියෙන වැරැද්ද ඒක ගෙනාවාට. අපේ ඒකීය රාජ්‍යයට පක්ෂව, ජනාධිපතිතුමාට විධායක බලයක් තියෙන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තියෙන, මහා පාර්ලිමේන්තුවට සම්පූර්ණ බලය තියෙන, ව්‍යවස්ථා අනුව වැඩ කටයුතු කරන්න අධිකරණයට සම්පූර්ණ නිදහස තියෙන අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පළවෙනි වගන්තියේ මේවා ඔක්කෝම මතක් කරලා තියෙනවා. ආගම්වලට පක්ෂපාතව, විශේෂයෙන් බුද්ධාගමට, උඩරට ගිවිසුමට පක්ෂපාතව ඒවා ඔක්කෝම සටහන් කරලා තියෙනවා. මූලික අදහස්වලට විරුද්ධ නොවන විදියට. මේවා ඔක්කෝම කල්පනා කරලා අප ගේනවා මේ ප්‍රශ්නයට විසඳීමක්. නීතිරීති හැම පක්ෂයක් එක්කම සාකච්ඡා කරලා. ඉංදියාවත් එක්කලා සාකච්ඡා කරලා. තමිල්නාඩුවත් එක්කලා සාකච්ඡා කරලා

අපේ ඒකීය රාජ්‍ය ආරක්ෂා කරන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ. එහෙනම් ප්‍රශ්න මොනවාද ? මහජනයාට කථා කරන්න පුළුවන්, මහජනයාට පුළුවන් විරුද්ධ වෙන්න අප පෙත්තුව වාගේ. මහා සංඝයාට පුළුවන්, අනිත් ආගමිකයන්ට පුළුවන්. බණ්ඩාරනායක මැතිනියට පුළුවන්, ඔන කෙනෙකුට විරුද්ධව වෙන්න පුළුවන්. නමුත් අපව ආණ්ඩු පක්ෂයට පත්කරලා තියෙන්නේ 1989 වෙනකම්. එතෙක් පාර්ලිමේන්තුව පිළිගත්ත ඕනෑම නීතියක් ගේන්න පුළුවන්. එහෙම නීති ගෙන ඒමට බල කරනවා නම්, එහෙනම් ප්‍රජාතන්ත්‍රවාදයට පහරක් ඒක. විරුද්ධව පහරක්. එහෙමයි ත්‍රස්තවාදය හැදුනේ 1971 දී. එහෙමයි ඇතැම් උදවිය හදන්නේ මේ වනාවේදීත්. මේ වනාවේ තුවක්කු පාවිච්චි කරන්නේ උතුරු නැගෙනහිර පලාතේ. දකුණු පලාතෙත් එහෙම පාවිච්චි කරන්න බලාපොරොත්තු වෙනවා නම් අපට තියෙන්නේ ඒක මැඩපවත්වන්න. කවුරු උනත්, රජයක් බයවෙන්න උවමනාවක් නැහැ. මහජන මතයට සළකන්න ඕන. මහජන මතයට පුළුවන් රජයට විරුද්ධව ඉදිරිපත් වෙන්න මන්ත්‍රී තරගයක් ඇතිවුනාම. අප ඔක්කෝම පරද්දවන්න පුළුවන්, වෙන පක්ෂයකට බලය දෙන්න පුළුවන්. මේ විසඳීම හොඳ නැ කියලා කියනවා නම් ඒ වෙලාවේ පුළුවන්. දැන් බැහැ. අප විසඳුමකට ඇතුල් වුනාම අප බලාපොරොත්තු වෙනවා යුද්දෙ නවතියි කියලා. ඔක්කොම ත්‍රස්තවාදී ව්‍යාපාර නවතියි කියලා. අප වියදම් කරනවා විශාල මුදලක් යුද්ධ ආයුධ ගන්න, හෙලිකොප්ටර් ගන්න, තුවක්කු ගන්න, බෝට්ටු ගන්න. ඒ මුදල් පුළුවනි අපට පාවිච්චියට ගන්න අපේ ජනතාවට ගෙවල් හදන්න. ඒවයි උවමනා කරන්නේ. මොකක්ද ජනතාවට තියෙන ප්‍රයෝජනය අප ලොකු හෙලිකොප්ටර් ගත්තම, ඒ හෙලිකොප්ටර් ගිහිල්ලා බෝම්බ දාලා මිනිස්සු මරනවා. තුවක්කු අරගෙන, කාලතුවක්කු අරගෙන මිනිස්සු මරනවා. එක හෙලිකොප්ටරයකට වියදම් කරන මුදල්වලින් කැළණියේ ගෙවල් හුඟක් හදන්න පුළුවනි.

මොකක්ද හොඳ ? අපි හෙලිකොප්ටර්වලට සල්ලි වියදම් කරමුද ? නැව් ගන්න සල්ලි වියදම් කරමුද ? උණ්ඩ ගන්න සල්ලි වියදම් කරමුද, තුවක්කු ගන්න සල්ලි වියදම් කරමුද, අපේ තරුණයන් යවා මරණයට පත්කරමුද ?

ත්‍රස්තවාදී ව්‍යාපාර නතර කරන්න අමාරුයි. අප ගිවිසුමකට ඇතුල්වුනත් බාගවේලාවට පංගුවක් උදවිය එහෙම කරන්න පුළුවනි. නමුත්, ඒ උදවියට විරුද්ධව තමිල්නාඩුව, ඉන්දියාවේ ආණ්ඩුව, ජාත්‍යන්තර රටවල් ලංකාවේ සිංහල, දෙමළ, මුස්ලිම් එක්කහු වෙලා සටන් කරන්න පුළුවනි. ඊයේ පෙරේද පැරිස් නගරයේ බෝම්බයක් දාලා පොලිස් කාර්යාලයක කීප දෙනෙක් මැරුණා. එංගලන්තයේ අගමැතිනිය බේරුණා බෝම්බයකින්. ලංකාවේත් එහෙම ඇතිවෙන්න පුළුවනි. මේ ගිවිසුමට ඇතුල් වුනත්, පලාත් සභා ඇතිවුනත් සටන්


ඇති වෙන්න පුළුවනි. නමුත් අපට ඒ ගොල්ල එක්ක සටන් කරන්න පුළුවනි. අර විශාල වියදම් දරන්න උවමනා නැහැ, අපේ සංවර්ධන වැඩ කරන්න පුළුවනි. අපේ මහජනයාගේ, සියයට හැත්තෑ තුනක් සිංහල මහජනයාගේ ප්‍රයෝජනයට වැඩ කරන්න පුළුවනි.

අන්න ඒ නිසා තමයි මේ ආණ්ඩුව තීරණයක් අරන් තියෙන්නේ අපේ ඒකීය භාවය ආරක්ෂා වෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඇතුලත, ඇතුලේ, පිටින් නොවෙයි අප ගිවිසුමකට ඇතුල් විය යුතුය කියා. පාර්ලිමේන්තුවේ කණ්ඩායමෙන් තුනෙන් දෙකක බලය අපට ලබාගන්න පුළුවන්. මේ මන්ත්‍රීවරු මෙහෙ ඉන්නවා, එක්කෙනෙක් විරුද්ධ වෙන්නේ නැහැ, ඇයි ඒ ගොල්ල දන්නවා අපට තව වැඩිදුර මේ විදියට වියදම් කරන්න සිද්ධ වුණොත් අපේ ලංකාවේ ජන්දදායකයන්ට පාඩු වෙනවා, අද මන්ත්‍රීවරු ඔක්කෝම මා එක්ක කථා කරන්නේ කොහොමද මේ ආහාර මුද්දර ලබා දෙන්නේ කියලා. ආහාර මුද්දරවලට රුපියල් කෝටි විස්සක් වියදම් කරනවා අපි. කෝටි විස්සට වැඩියි, කෝටි දෙසීයක් අවුරුද්දකට, අපට ඒක දෙගුණයක් වැඩි කරන්න පුළුවන්, දෙගුණයක්. සියයට පණහක් අපේ ලාංකිකයන් ජීවත් වෙන්නේ ඒ ආහාර මුද්දරවලින්. දෙගුණයක් වැඩි කරන්න පුළුවනි, කාටද ප්‍රයෝජනයක් වෙන්නේ ඒ ආහාර මුද්දර දෙගුණයක් වැඩි වෙනවා නම්. මුදල් ඇමතිත් හා බෙදීමෙන් කාටද ප්‍රයෝජනයක් වෙන්නේ ? සියයට හැත්තෑ තුනක් සිංහලයන්ට බාගද බණ්ඩාරනායක මැතිනියට ඒක නොලැබෙනවා ඇති. ඒ නිසා ඒ කරදරය එයාට තේරෙන්නේ නැහැ. අනුර බණ්ඩාරනායකට ඒක තේරෙන්නේ නැහැ. නුමුත් අප දන්නවා අපේ මන්ත්‍රීවරු ඇවිල්ලා අපව හම්බ වෙනවා නිතරම, ආහාර මුද්දර ගැන.

මහවැලි ගඟ ව්‍යාපාරය වාගේ විශාල ව්‍යාපාරයක් තමයි සමනල වැව ව්‍යාපාරය බලංගොඩ. ඒ වාගේ ව්‍යාපාරයක් තමයි අප විදුලි බලය නිපදවන්න හදන්නේ අඟුරුවලින් ත්‍රිකුණාමලයේ. දැන් ඔක්කොම අත්සන් කරලා ඉවරයි. හෙට අනිද්දා පටන් ගන්නවා වැඩ, ඒත් මහවැලි ගඟට වියදම් කරපු මුදලම ඒකට වියදම් වෙනවා, ඒ දෙගුණයක් වියදම් වෙනවා කළු ගඟ ව්‍යාපාරයට කාටද මේවායේ ප්‍රයෝජන ලැබෙන්නේ, වැඩිපුර කාටද ලැබෙන්නේ, සියයට හැත්තෑ තුනක් ලංකාවේ සිංහලයෝ ඉන්නවා නම් වැඩිපුර ප්‍රයෝජන ලැබෙන්නේ සිංහලයාට නේද, දුප්පත් සිංහලයන්ට නේද ? ඒ නිසා තමයි අපේ ආණ්ඩුව මේ වෙලාවේ තීරණයක් අරන් තියෙන්නේ මීට ඉස්සෙල්ලත් තීරණයක් අරන් තිබුණා නුමුත් කාලය සුදුසුව තිබුණේ නැහැ. දැන් පුළුවන්. අපට දැන් ඉන්දියාවේ ආණ්ඩුව සම්පූර්ණයෙන්ම උදව් දෙනවා සාම ගිවිසුමට සම්පූර්ණයෙන් කියලා තියෙනවා ද්‍රවිඩ සංගමයට ගිහිල්ලා එක්කහු වෙන්න

කියලා අපේ ආණ්ඩුව එක්ක. ත්‍රස්තවාදීන්ටත් එහෙමයි. දැන් එහෙනම් අප ඒ උදවිය බඳවා ගන්නවා. බඳවාගෙන තීරණයකට බහිනවා මේ ලංකාවේ වැඩි දෙනා සිංහලයන්ගේ ප්‍රයෝජනයට. පංගුවක් ඇහැව්වා ත්‍රස්තවාදීන් විරුද්ධ වුණොත්, පංගුවක් විරුද්ධ වෙන්න පුළුවන්, වැඩි දෙනෙක් පක්ෂ වෙන්න පුළුවන්. ත්‍රස්තවාදීන් විරුද්ධ වුණොත් අපට ඉන්දියාවේ ආණ්ඩුව පක්ෂ නම් තමිල්නාඩුව පක්ෂ නම් ඒ ගොල්ලන් මෙල්ල කරන්න පුළුවනි. ඉන්දියාවෙන් යන්න කියන්න පුළුවනි. එතකොට ඒ ව්‍යාපාරය ක්‍රම ක්‍රමයෙන් තුනීවෙලා යයි.

මෙන්න මේ නිසා තමයි අද මේ සාම සාකච්ජාව පටන් ගෙන තියෙන්නෙ. ලංකා සමසමාජ පක්ෂය, ශ්‍රී ලංකා මහජන පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය, නව ලංකා සමසමාජ පක්ෂය. ඒ පක්ෂ හතර අවුරුදු ගණනක් විශේෂයෙන් සමසමාජ, කොමියුනිස්ට් පක්ෂ අවුරුදු ගණනක් – අවුරුදු හතළිහක් පණහක් – රටට වැඩ කරපු පිරිසක්. වැදගත් නායකයෝ. ඒ උදවිය මේ රජයට පක්ෂ නැහැ. නුමුත් ඒ ගොල්ලන්ට ජේතව මේ රජයට පමණක් නොවෙයි, අනාගතයේදී පත් වෙන රජයන්ටත් හානියක් වෙනව නව දුරදිග මේ සටන ගෙන ගියොත් කියලා. විරුද්ධ උදවියට යම් වචනයක් කියන්න මා බලාපොරොත්තු වෙන්නේ නැහැ. කවුරු විරුද්ධ වුණත්, මේ රටේ වැඩි දෙනෙක් ඉන්න සිංහලයන්ගෙ ප්‍රයෝජනයට මේ සාම සාකච්ජා අප ගෙනියනවා අවසන් වෙනකන්. අවසාන වෙන්නෙ ඔක්කොම පක්ෂ එක්කහුවෙලා මේ අද තියෙන උතුරු නැගෙනහිර පළාත්වල ප්‍රශ්නය විසඳල අහිංසා මාර්ගයෙන්, සාම මාර්ගයෙන්, නීති මාර්ගයෙන් කියලා තමුන්නාන්සෙලා ඔක්කොටම මගේ කතාවට ඇහුම්කන් දුන්නට ස්තුති කරමින් කථාව අවසන් කරනවා.



තවත් ජන හමුවකදී. .



ජනාධිපතිතුමා කුඩා දරුවෙකුට කිරි කෝප්පයක් පොවමින්

සාම කතාවලින් තොර
වෙනත් මගක් තිබේද ?

## යෝජිත පළාත් සභා පිළිබඳව කරුණු පැහැදිලි කිරීම සඳහා 1986.08.23 වැනි දින බුලත්සිංහල දී පැවැති ජනහමුවේදී අතිගරු ජනාධිපතිතුමා විසින් කරන ලද කතාව

ඉංග්‍රීසි අධිරාජ්‍යයට 1815 දී අපි යටත්වෙනකොට රට ප්‍රධාන කොටස් තුනකට බෙදී තිබුණා. ත්‍රි සිංහලය කියලා පළාත් තුනක් තිබුණා. රජරට, දැදුරුඔයෙන් උතුරු පළාත, මහවැලි ගඟෙන් උතුරු පළාත, යාපනය, මන්නාරම, අනුරාධපුරය යනුවෙන් එද ඔක්කෝම ඒ පළාත් රජරටට අයිතියි. දැදුරුඔයෙන් දකුණු පළාත, මහවැලි ගඟෙන් දකුණු පළාත, බෙන්තර ගඟ දක්වා මායා රට. තමුන්නාන්සේලා එතකොට අයිති මායා රටට. බෙන්තර ගඟින් දකුණු පළාත රුහුණු ප්‍රදේශය, මාතර හම්බන්තොට නැගෙනහිර පළාත, නැවතත් මහවැලි ගඟට යනකම් රුහුණු පළාත. මේ අනුව ත්‍රි සිංහලය කියා පළාත් තුනක් තිබුණා. ඒ ත්‍රි සිංහලය තුළත් තිබුණා පළාත්. එක පළාතක් ගැන මම කියන්නම්. නිදසුනක් හැටියට ඒ සබරගමු පළාත. අදත් ඒ මායිම් අනුව සබරගමුව කියලා කියනවා.

රජතුමා හිටියේ මහනුවර. රජතුමාට ඒ කාලයේ මෝටර් රථ තිබුණේ නැහැ. හෙලිකොප්ටර් තිබුණේ නැහැ. අහස් යාත්‍රා තිබුණේ නැහැ. මෝටර් සයිකල් තිබුණේ නැහැ. පයින් යන්නත් අමාරුයි. ඒ නිසා සබරගමුවට පත්කළා 'දිසාව' කෙනෙක්. දිසාව යටතේ තවත් දිසාවේවරු පත්කළා, එක එක පළාත්වලට. සබරගමුවට, පත්කළා ඇහැලේපොල. මුළු සබරගමු පළාතම ඇහැලේපොල යටතෙහි තිබුණේ. පොලිස් බලතල, මුලාදෑනීන්ගේ බලතල, ඉඩම් බෙදීම, කාණු කැපීම, ඇලවල් හෑරීම, කෘෂිකර්ම වැඩ, වාරිමාර්ග වැඩ වැනි හැම කටයුත්තක්ම ඒ ඒ දිසාපතිවරුන්ට අයිතිවුණා. ඇහැලේපොල කරදරේට වැටුණම ඒ කාරියට එක්නැලිගොඩ පත් කෙරුණා. ඊට පස්සේ මහවෙලතැන්න වැඩකළා. බණ්ඩාරනායක මැතිනියගේ මව්ගේ පියා. ඇහැලේපොල කරදරේට වැටුණා. රජ්ජුරුවෝ එතුමාට දඬුවම් කරන්න බැරි වුනාම ඔහුගේ ළමයින්ටත් භාර්යාවටත් දඬුවම් කළා. ඒක ඒ නීතියේ හැටියට. ඇහැලේපොල ඉංග්‍රීසි පාලකයන් වෙත ගිහින් ගතු කිව්වා. ඉන්පසුව රජතුමා වැටුණාම, රජ්ජුරුවෝ අසුවුනාම ඔහු සිතුවා රජවෙන්න පුළුවන් කියලා. උඩරට ගිවිසුම අත්සන් කළාට පස්සේ ඇහැලේපොල අශ්වයා පිට උඩ ආවා.

ඒකට ඉංග්‍රීසි පාලකයත් උරණ වුණා. රජ්ජුරුවෝ අල්වාගෙන කොළඹට ආවාම එතුමා ඉංග්‍රීසින්ට ඇහැලේපොල ගැන කීවා. මෙයාව විශ්වාස කරන්න එපාය කියා. ඉංග්‍රීසින් ඇහැලේපොල අල්ලා මුරුසි දූපතට පිටුවහල් කළා. එහිදී ඔහු මියගියා. දැන් අපි බලාපොරොත්තු වන්නේ ඇහැලේපොලලා. මහවෙලතැන්නේලා වෙනුවෙන් මහජනයා පත් කරන එක්කෙනෙකුට ඒ ඒ පළාත් බාර දෙන්නයි. ඉතින් මොකක්ද ඒකෙ තියෙන වැරැද්ද. බාගවෙලාවට මැතිතිය අකමැති වෙන්න ඇති, මේ ක්‍රමයට. එයා කැමති ඇති රදළ ක්‍රමයට නැවතත් මහවෙලතැන්නෙලා පත් කරනව නම්. අපි කැමති නැහැ ඒ පරණ ක්‍රමයට. ඇහැලේපොලලා වෙනුවෙන් මහජනයා පත් කරන ඇමතිවරයෙක් පත් කරන්නයි අපේ බලාපොරොත්තුව. අපි ඒ වැඩ පටන්ගෙන තියෙනවා. අද සබරගමුව ප්‍රදේශය දිසා මණ්ඩල දෙකකට අයිතිවෙනවා. කෑගල්ල දිසා මණ්ඩලය හා රත්නපුර දිසා මණ්ඩලය යනුවෙන්. කෑගල්ලේ ඉන්නවා දිසා ඇමතිවරයෙක්. සෙනෙවිරත්න මන්ත්‍රීතුමා මම පත් කරපු කෙනෙක්. රත්නපුරේ ඉන්නවා නන්ද මැතිව් මහත්මයා. ඒත් මා පත් කරපු කෙනෙක්. දැන් අපි බලාපොරොත්තු වෙන්නේ මේ දිසා දෙක එක් කරලා ඒ පළාත මහජනයා තෝරන පළාත් මණ්ඩලයකට භාරදීලා පාලනය කරන්න. ඒ මණ්ඩලයේ වැඩි ඡන්ද තියෙන පක්ෂ නායකයා ප්‍රධාන ඇමතිතුමා හැටියට පත් කරනවා. සබරගමු පළාත පාලනය කරන්න එතුමාගේ පුංචි ඇමති මණ්ඩලයක් සමග.

අවුරුදු පහකට වතාවක් මන්ත්‍රී තරග පවත්වනවා. දැන් මේ පළාතෙත් එවැනි මණ්ඩල තිබෙනවා. දිසා මණ්ඩල තුනක්, ගම්පහ, කොළඹ, කළුතර. ඒ පළාත් තුනේ ඉන්නවා ඇමතිවරු තුන් දෙනෙක්. දිසා මණ්ඩලවලට තමුන්නාන්සේලා පත් කළ මන්ත්‍රීවරු කීප දෙනෙක්. දිසා මණ්ඩල මාර්ගයෙන් දිසා කොට්ඨාශ මාර්ගයෙන්, මන්ත්‍රීවරු තෝරන්න තමුන්නාන්සේලාට පුළුවන්. ඔය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කැකෝ ගැහැව්වට ඒ ගොල්ලොන් ඡන්දයට ඉදිරිපත් වෙයි. ඒ ගැන සැකයක් නැහැ. දැන් මේ පළාතේ ශ්‍රී ලංකා සාමාජිකයෝ ඉන්නවා නම් ඒ අය ගෙවල්වල ඉන්නේ නැහැ. අපි මන්ත්‍රී තරඟ පවත්වනකොට. ඒ අයත් කැමතිවෙයි පළාතේ ප්‍රධාන ඇමතිවරු වෙන්න. ඉතින් මොකක්ද මේකෙ තියෙන වැරැද්ද. මැතිණිය මෙච්චර කෑගහන්නේ මොකටද ? ගම්වල උගත් උදවිය දන්නවා සිංහල, ඉංග්‍රීසි, භූගෝල ශාස්ත්‍රය, ගණිත, විද්‍යා ශාස්ත්‍රය උගත් අය ගම්වල සිටිනවා. ඉගෙන ගන්නේ මොනවටද, තමන්ගේ ඉගෙනීමෙන් ප්‍රයෝජනයක් ගන්න. අද පාර්ලිමේන්තුවේ ඉන්නේ මන්ත්‍රීවරු 168 දෙනයි. මුළු ලංකාවේ ඒ කියන්නේ එක්කෝටි පණස් ලක්ෂයක් පාලනය කරනු ලබන්නේ එකසිය හැට අට දෙනෙකු විසින්.

අපේ අලුත් ක්‍රමයේ හැටියට සෑම පළාතකටම අපි විසිපස් දෙනෙක්, තිස් දෙනෙක්, හතලිස් දෙනෙක්, පණස් දෙනෙක් වශයෙන් ඡන්දයෙන් පත් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ අයගෙන් පස් දෙනෙක් විතරයි ඇමතිවරු වෙන්නේ. ප්‍රධාන ඇමතිවරු එක්කෙනයි. පළාතෙ කෙනෙක්, රුහුණු ප්‍රදේශයට කොළඹින් යන්න බැහැ. රුහුණෙන් ම පත් කරනව. අද හම්බන්තොටින් එන්න ඕන කොළඹ වැඩ කරන්න. හම්බන්තොටින් එන්න ඕන කොළඹට මන්ත්‍රීවරයෙක් වෙන්න. ඒවගේම ඇමතිවරුන් පත් කරනවා. පළාත ගැන දන්න, දුෂ්කරතා දන්න, මහජනයාගේ දුක දන්න අය පත් කරනවා. අන්න ඒක තමයි විමධ්‍යගතවීම, කියන්නේ. මෙහෙම වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළාම මේ ලේ වැගිරීම නවත්වන්න අපට පුළුවන්. අදවෙනතුරු විශාල පිරිසක් මියගොස් තිබෙනවා. තමුන්නාන්සේලාගෙ තරුණයෝ තරුණියෝ, දෙමළ සිංහල, මුස්ලිම්, අහිංසක උදවිය. ඒ අය වැරැද්දක් කරල නොවේ. බෝම්බයක් පිපිරුණාම ගණනාවක් මැරෙනවා. තව බෝම්බයක් පිපිරුණාම තවත් කීප දෙනෙක් මැරෙනවා. ඊයේ යුද්ධ හමුදාවේ බෝම්බයක් පිපිරිලා, අළුතෙන් විවාහ වුන දෙන්නෙක් මියගියා. මේ සිද්ධීන් ගැන අපි කණගාටු වෙන්න ඕනැ. මේවා නවත්වන්න පුළුවන් සාමකාමී විසඳීමකින් පමණයි.

අද ත්‍රස්තවාදී ප්‍රශ්නය උග්‍රවෙලා තිබෙනවා. ලෝකයේ හැම තැනම ත්‍රස්තවාදය තිබෙනවා. මෙහේ විතරක් නොවෙයි. පන්ජාබ් ප්‍රාන්තයේ තිබෙනවා. මිසෝරාම් නගරයේ තිබෙනවා. කේරළ පළාතේ තිබෙනවා. ඉන්දියාවේ නොයෙක් නොයෙක් පළාත්වල තියෙනවා. ප්‍රංශ රටෙත් තියෙනවා. ජර්මනියෙත් තියෙනවා. මේ රටේ පමණක් නොවෙයි. මේක විසඳන්න පුළුවන් දෙවිධියකින්. යුද්ධයෙන් හෝ සාමයෙන්. අපි කැමතියි සාමයෙන් විසඳන්න. විසඳෙන තැනට ළංවී තිබෙනවා. ඉන්දියාව තමිල්නාඩුව වාගේ අපිට විරුද්ධවෙලා සිටි ලෝකයේ හැම ආණ්ඩුවක්ම දැන් කියනවා මේ විදියට පළාත් සභා ඇති කෙරුවොත් පුළුවන් මේ ප්‍රශ්නය විසඳන්න කියලා. එහෙම කියනවා දෙමළ සංගමයත්, ත්‍රස්තවාදීන් කිහිප දෙනෙකුත්. අපි තව ටික දවසකින් මේ ප්‍රශ්නය විසඳන්න බලාපොරොත්තු වෙනවා. අද අපිට පුළුවන් මෙවගේ සභාවක් තියලා තමුන්නාන්සේලාට මේ විස්තර අවබෝධ කර දෙන්න. අපි බලාපොරොත්තු වෙනවා මාසයක් යන්න ප්‍රථම අපේ එක්සත් ජාතික පක්ෂයේ කණ්ඩායමක් උතුරට, යාපනයට, මඩකලපුවට, ත්‍රිකුණාමලයට යවන්න. යවලා මෙවගේ සභාවකට ගිහිල්ලා මහජනයාට කථා කරන්න. ඒක හොඳ නැද්ද.

මට සාමයෙන් ඇර වෙන විදියක් කල්පනා කරන්න බැහැ. දන්නේත් නැහැ. බණ්ඩාරනායක මැතිණිය දන්නවා ඇති. දැන් කියනවා එයාට පුළුවන්ලු මේ ප්‍රශ්නය විසඳන්න. නමුත් ඒ විසඳීම ප්‍රකාශ කරන්නේ නැතිලු එයා බලයට

එතකම්. මම දන්නේ නැහැ ඒ මැතිණිය මේක විසඳන්න බලාපොරොත්තු වෙන්නේ සිංහල බෙහෙතක් දීලද කියලා. දැන් බණ්ඩාරනායක මැතිණිය ළඟ තියෙන්නේ චූර්ණයක්ද, පත්තුවක්ද, අරිෂ්ඨයක්ද, තෙලක්ද කියලා මම දන්නේ නැහැ. මම හිතන්නේ ඒක ගුලියක්. දැන් ඒ ගුලිය අපිට දෙන්නේ නැහැ. මොන කැදරකමක්ද ගුලියක් තියාගෙන ඉන්නේ රහසින්. බලයට එනකම් ඉන්නවලූ ගුලිය දෙන්න. ඒ අතරේ ලෙඩ්ඩු මැරෙනවා. දහස් ගණන් මැරෙනවා. මම ඉල්ලනවා ප්‍රසිද්ධියේ නමුත්නාන්සේලා ඉදිරියේ දී බණ්ඩාරනායක මැතිණියගෙන් කරුණාකර ඒ ගුලිය මට දෙන්න කියා. මේ පළාත් සභා කිසිදෙයක් වුවමනා කරන්නේ නැහැ. භික්ෂූන් වහන්සේලා වෙහෙස මහන්සි කරන්න වුවමනා නැහැ. දහස් ගණන් මැරෙන්නේ නැහැ. අපේ මුදල් ඇමතිතුමාගේ අයවැය ලේඛනයත් බේරෙනවා. ලංකාවේ සාමය ඇති වෙනවා. අර ගුලිය තමයි වැදගත්. වෙන කිසි දෙයක් නොවෙයි. රහස් ගුලිය. මට එච්චරයි ඒ මැතිණියට කියන්න තියෙන්නෙ. මේ කරදර වෙන්න වුවමනාත් නැහැ. අපි නම් දන්නේ නැහැ වෙන බෙහෙතක්. දැන් මුදල් ඇමතිතුමා හැම කරුණක්ම තෝරා දුන්නා. අප ජනමත විචාරණයකින් සියයෙන් 53ක් ඡන්ද ලබාගෙන රජයේ කාලය තව අවුරුදු 6ක් දීර්ඝ කෙරුවා. 1989 වෙනතුරු අපට බලයේ ඉන්න පුළුවන්. ඊට කලින් මට පුළුවන් පාර්ලිමේන්තුව විසුරුවා හරින්න. මාව පත් කෙළේ 1982 දී. ඒත් අවුරුදු හයකට. ජීවතුන් අතර ඉන්නකම් මමත් ඉන්නවා මෙවගේ කතා කර කර ඒ කාලෙ වෙනකම්. කිසි කෙනෙකුට බැහැ මාව අයින් කරන්න. පාර්ලිමේන්තුවට පුළුවන් මම වැරදි කෙරුවොත්, මම අල්ලස් ගත්තොත්, යෝජනාවක් ගෙනල්ලා තුනෙන් දෙකේ ඡන්දෙ අරගෙන උසාවියට ගිහිල්ලා ආපසු තුනෙන් දෙකේ ඡන්දෙ අරගෙන අස්කරන්න. නමුත් බොහොම අමාරුයි අස් කරන්න මේ ජනාධිපතිතුමාව.

අපි නීතියෙන් තමයි පළාත් සභා පත් කරන්නේ. රහසින් කිසිවක් කරන්නේ නැහැ. නීති සකස් කරනවා. දැන් මේ අමිර්තලිංගම් මහත්මයාත් එක්ක සාකච්ඡා කරනවා. එතුමන්ගේ කණ්ඩායමත් එක්ක සාකච්ඡා කරනවා. ප්‍රවේසමෙන් සාකච්ඡා කරනවා. හරියට පතාවකින් පීරලා වාගේ මේ පනත් සොයා බලලා අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව යම් දෙයක් තියෙනවා නම් ඒවා අහක් කරනවා. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කියා තිබෙනවා අපේ රට ඒකීය රාජ්‍යයක් කියලා. ජනාධිපතිතුමා තමයි විධායක බලය තිබෙන පුද්ගලයා. පාර්ලිමේන්තුව තමයි ව්‍යවස්ථාදායක බලය තියෙන ආයතනය. විනිශ්චයකාරතුමන්ලාට තියෙනවා විනිශ්චය බලය. මේ තුන ආරක්ෂා කරන ඒකීයභාවය වෙනස් නොකර අප විසඳුමක් ලබාගන්න බලාපොරොත්තු වෙනවා.

ප්‍රවෘත්ති පත්‍රවල මේ ගැන බොහෝ දේ ලියා තිබෙනවා. තුනෙන් දෙකේ ඡන්දෙ ලැබුනාම මේ යෝජනා නීතිගත වෙනවා. ඒ අපේ ව්‍යවස්ථාව අනුවයි. මේ කටයුතු වෙන කිසි කෙනෙකුට වළක්වන්න බැහැ. එනකොට ප්‍රජාතන්ත්‍රවාදය ඉවරයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හෝ වෙනත් පක්ෂයන්ට හෝ කණ්ඩායමකට හෝ වළක්වන්න බැහැ. ඒක අපේ ව්‍යවස්ථාව. ඒක අපි අකුරටම ක්‍රියාත්මක කරනවා. ඔය ජනමත විචාරණය කියන වචනය බණ්ඩාරනායක මැතිණිය දන්නේ නැහැ. මමයි මේ ලංකාවට පුරුදු කෙරුවේ. ඉන්දියාවෙ නැහැ ජනමත විචාරණ. එංගලන්තයේ නැහැ ජනමත විචාරණ. එංගලන්තයේ ප්‍රජාතන්ත්‍රවාදය අවුරුදු 500 ක් තිබුණා. එකම වතාවක් එකක් තිබ්බා. රටවල් ස්වල්පයක විතරයි තිබෙන්නේ. එක රටක් මේ ලංකාව. උසාවියට පුළුවන් නියම කරන්න ජනමත විචාරණයක්. මට පුළුවන් නියම කරන්න ජනමත විචාරණයක්. විපක්ෂයට බැහැ. ඒ ගොල්ලන්ට පුළුවන් කතා කරන්න. මම ප්‍රාර්ථනා කරනවා අපේ විසඳීමට කිසි බාධකයක් නොවේවා කියලා. එනකොට මේ ප්‍රශ්නය ඉවරයි. කරදර වෙන්න වුවමනාවක් නැහැ.


දැන් ආහාර මුද්දර ප්‍රශ්නයක් තියෙනවා. ඒවා විසඳන්න පුළුවන්. නමුන්නාන්සේලාගේ කුඹුරුවලට අවශ්‍ය දේවල් මිළදී ගන්න. පුළුවන්. වාරිමාර්ග වැඩ කරන්න පුළුවන්. විදුලි බලය ලබාගන්න පුළුවන්. කෝටි ගණන් එළඳයි වැඩට යොදන්න පුළුවන්. නිකම් නිෂ්ප්‍රයෝජන යුද්ධායුද ගන්න, හෙලිකොප්ටර් ගන්න, ගුවන්යානා ගන්න, නැව් ගන්න, තුවක්කු ගන්න වියදම් කරන්නේ නැතිව. කවුද කැමති මිනිස්සු මරන්න. කිසිකෙනෙක් කැමති නැහැ. සිංහල හෝ දෙමළ හෝ කවිරු උනත්. අන්න ඒකයි අපි කරන්න බලාපොරොත්තු වෙන්නේ. එනකොට අපි මෙහෙම කටයුතු කරනකොට බණ්ඩාරනායක තරුණ මහත්මයා කියනවා එතුමා බැඳිලලු ජේ. වී පී. එකට, ජේ. වී. පී. උදව්ය බන්දවා ගන්න යනවලු. මම දන්නේ නැහැ මොකටද එහෙම කරන්නේ කියල. මම නිදහස් කෙරුවා විජේවීරලා ඔක්කොම. බණ්ඩාරනායක මැතිනියි පුතයි තමයි ඒගොල්ලොව හිරේට ඇරියේ. මම නැත්නම් රෝහණ විජේවීර ජීවිත කාලයම හිරේ ඉන්නවා. මම කල්පනා කෙරුවා මේගොල්ලෝ ජීවිත කාලයම හිරේ ඉන්න වුවමනා නැහැ. මෙගොල්ලො එළියට දැම්මොත් ප්‍රජාතන්ත්‍රවාදය පිළිගන්න පුළුවන් කියල. එළියට දමල අවුරුදු තුන හතරකට පසු මන්ත්‍රී තරඟවලට ආවා. පළාත් තරඟවලට ආවා. පංගුවක් උදව්ය ඉන්නවා. පළාත් සභාවල, දිසා සභාවල, නගර සභාවල. වැඩි දෙනෙක් පැරදුනා. පොලිසියෙන් මට ආරංචි ලැබුණා මේ ගොල්ලො ජනාධිපතිවරණයෙන් පැරදුනාට පස්සේ, ජනමත විචාරණයෙන් පැරදුනාට පස්සේ දැන් හිංසා මාර්ගය පිළිඅරන් කියා. අර පංති පහක් තියලා තරුණයන්ට කියනවලු

දෙමව්පියන් මරන්න, සහෝදරයන් මරන්න, කුඩු ගන්න. ඔන්න ඔය වගේ ක්‍රියාමාර්ගයන්. පොලීසිය කිව්වා මේක භයානක දෙයක්. ක්‍රම ක්‍රමයෙන් ඒගොල්ලන්ගේ කණ්ඩායම වැඩි වෙනවා කියා. මේගොල්ලෝ නීති විරෝධී පක්ෂයක් කරන්න කියලා පොලීසිය උපදෙස් දුන්නා. මම ජනතා විමුක්ති පෙරමුණ නීතිවිරෝධී පක්ෂයක් කළා. දැන් මැතිනියගේ පුතා කියනවා එයාලා ගිහිල්ලා ජේ. වි. පී. එකට බැඳෙනවා කියලා. මම ඇහැව්වා මගේ යහළුවෙකුගෙන් තමන්ගේ කුඹුරේ තිබෙන වී බිස්ස හිස් වුණහම මොකද කරන්නේ කියලා. මම හිතන විදියට බණ්ඩාරනායක මහත්මයාගේ දේශපාලන බිස්ස හිස්වෙලා. දැන් එකට දන්න හඳනට ජේ. වි. පී. කාරයන්ව.

අපේ මේ සාම ව්‍යාපාරයට අනික් ඔක්කෝම දේශපාලන පක්ෂ සම්බන්ධවෙලා තියෙනවා. සමසමාජ පක්ෂයේ හිටපු මන්ත්‍රීවරයෙක් වන කොල්වින් ආර්. ද සිල්වා මහත්මයාගෙන් අදහස් අපි නොපිළිගන්නාට අපි දන්නවා කොල්වින් ආර්. ද සිල්වා මහත්මයා උගතෙක්. මම අවුරුදු පණහක දේශපාලන පුරුදුකමක් තිබෙන නායකයෙක්. කේනමන් මහත්මයා උගතෙක්. අවුරුදු හතලිහක් විතර පුරුද්දක් තිබෙන දේශපාලන නායකයෙක්. කොමියුනිස්ට් පක්ෂය, සමසමාජ පක්ෂය, ශ්‍රී ලංකා මහජන පක්ෂය, විජයකුමාරතුංග මහතාගේ පක්ෂය, තොන්ඩමන් මහත්මයාගේ පක්ෂය හා කලීල් මහතාගේ ලක්ෂ ගණන් කම්කරුවෝ ඉන්න පක්ෂයන් එකට වැඩ කරනවා. විරුද්ධව ඉන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා මහජන එක්සත් පෙරමුණ පමණයි. ඒ ගොල්ලන්ට කිසිම සෘජු ක්‍රියාවක් කරන්න බැහැ. දැන් මෙහිදී ප්‍රශ්න රාශියක් ඇහැව්වා. අපි සම්මන්ත්‍රණයේදී ඒවාට උත්තර දුන්නා. අපි තමන්ගේ අදහස්, මහා සංඝයා වහන්සේලාගේ උපදෙස් ඉල්ලනවා. අපි සභාවල් පවත්වනවා. මහානායක හිමිවරුන් හමුවී තියෙනවා. අපේ වැඩකටයුතු වළක්වන්න අපි ඉඩ දෙන්නේ නැහැ. නීති සංශෝධනය කරලා හෝ සංශෝධනය නොකර හෝ පාර්ලිමේන්තුවට ගෙනල්ලා නීතිගත කරනවා. එතකොට අපේ ප්‍රශ්නය ඉවරයි. අන්න ඒ නිසයි සම්මන්ත්‍රණ පවත්වන්නේ. අප පළාත් තවයටම යනවා. මහජනයාට, මේ ලංකාවෙහි ජීවත්වන එක්කෝටි පණස් ලක්ෂයටම, පුළුවන්නම් මේ කාරණාව අවබෝධ කරනවා, අපි නීතිගත කරන්න ඉස්සෙල්ලා. තමන්ගේ ගම් පළාත්වලින් පිටවෙලා ඉන්න හැම දෙමළ ජාතිකයෙකුම, හැම සිංහලයෙකුම නැවතත් තමන්ගේ ගෙවල්වලට යවනවා. ත්‍රස්තවාදීන් යුද්ධායුද පාවිච්චි කරනවා නම් ඒ යුද්ධායුද රජයට බාරදෙන්න ඕනෑ. ඔවුන්ගේ කඳවුරු හැම එකක්ම වහන්න ඕනෑ. හිංසා මාර්ග අත්හරින්න ඕන. නැවත වරක් අහිංසක පුරවැසියන් හැටියට ක්‍රියා කරනවා නම් මම

කැමතියි ජනාධිපතිතුමා හැටියට ඔවුනට සමාවක් දෙන්න. එහෙම නැත්නම් ඒ උදවිය හිරේ දන්නත් සිද්ධ වෙනවා. ඉන්දියාව මේ වැඩපිළිවෙළට සම්පූර්ණ සහයෝගය දෙනවා. දෙමළ පක්ෂවල සම්පූර්ණ සහයෝගය දෙනවා.

අපි අක්මීමනට ගියාම ඒ පළාතේ ඡන්දදායකයෙක් යුද්ධ හමුදාවේ සිටියදී මරුමුවට පත් තමන්ගේ පුතා ගෙනල්ලා වැළලුවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දහස් ගණන් ගියා මැස්සෝ වාගේ. එතෙන්ට ගිහිල්ලා කිව්වා ආණ්ඩුවට විරුද්ධව ඡන්දය දෙන්න කියල. මොකක්ද ඒ දෙමව්පියෝ කළේ. දෙමව්පියෝ ප්‍රේමදාස අගමැතිතුමාත් මාවත් ඇවිල්ලා හම්බවෙලා " අපේ මළ තරුණ පුතා රට වෙනුවෙන් ජීවිතය පූජා කළා. මෙන්න අනිත් පුතත් අපි යුද හමුදාවට දෙනවා " කියලා. එයාටත් බැඳෙන්න කිව්වා යුද්ධ හමුදාවට. අන්න එහෙමයි සාමාන්‍ය සිංහල මිනිස්සු වැඩ කරන්නේ. මේ උසස් ගෙවල්වලට, රදළ පන්තිවලට, ධනපති පන්තිවලට අයිති ගෑණු පිරිමි වාගේ නොවෙයි සාමාන්‍ය මහජනයා. ඒ ගොල්ලන්ගේ තියෙනවා රට ගැන විශාල කැක්කුමක්. ජීවිතය පූජා කරන්නේ ඒ උදවියයි. මේ අනිත් උදවිය නොවෙයි. අන්න ඒ උදවිය එක්කයි අප ගමන් කරන්නේ. මේ සාමාන්‍ය උදවිය එක්කයි අපි ජීවත් වෙන්නේ. සාමාන්‍ය පුරුෂ ස්ත්‍රී දෙපක්ෂය වෙනුවෙන් තමයි අපි මේ ගිවිසුමකට අත්සන් කරන්නේ. 1989 මන්ත්‍රී තරඟයක් තිබ්බාම මේ ගිවිසුමෙන්, මේ ව්‍යාපාරයෙන් වැරැද්දක් සිද්ධ වුණා නම් අපිව ඉවත් කරන්න. හරියට මෙවර අපි හැම ආසනයේම ඉන්නවා වාගේ ඒ වාරයේත් හැම ආසනයේදීම අපට විරුද්ධව ඡන්දය දෙන්න. දැන් අපට උදව් දෙන්න මේ ගිවිසුම අත්සන් කරන්න. ඒ පමණයි මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලන්නේ. මෙහි පැමිණි විශාල පිරිසට. අපේ භික්ෂූන් වහන්සේලාට, පළාතේ නායකවරුන්ට, අපේ මහජනයාට කාටත් ස්තූති කරමින් මේ රටට, මේ සිංහල ජාතියට ජයවේවා කියලා ප්‍රාර්ථනය කරමින් මාගේ කතාව අවසන් කරනවා.




සමස්ත ලංකා සිංහල බෞද්ධ සංවිධානයේ රැස්වීමක් ඇරඹීමට පෙරාතුව...

අප ඉන්දියාවත් සමග මිත්‍ර භාවයෙන් ඉන්න ඕනෑ

## 1986.08.25 වැනි දින බුලත්සිංහල මධ්‍ය මහා විද්‍යාලයේ පැවති රැස්වීමේදී මහජනතාව විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් අතිගරු ජනාධිපතිතුමා විසින් කරන ලද කතාව

ගරු මහා සංඝයා වහන්සේලාගෙන් අවසරයි.
පළාතේ මන්ත්‍රීවරුනි, ඇමතිවරුනි, මිත්‍රවරුනි,

මේ ප්‍රශ්නවලින් මට පැහැදිලි වෙනව ඒ ප්‍රශ්න අහපු මහත්වරු මේ යෝජනා හොඳට කියවල තියෙන බව. බාගවෙලාවට අපි අච්චු ගහපු පත්‍රිකාවෙන් නොවෙයි වෙන්න පුළුවනි,ගුවන් විදුලියෙන්, රූපවාහිනියෙන්, කථාවලින්, පත්‍ර මාර්ගයෙන්, මේ හුඟක් දෙනෙක් ඒ ගැන දන්න බවයි අපට පේන්නෙ. මගෙන් ප්‍රශ්න කිහිපයක් අහල තියෙනවා, මම කැමතියි එක ප්‍රශ්නයක් අහන්න. කරුණාකරල ඒකට උත්තර දෙන්න. මේ යෝජනා අනුව අද තිබෙන ත්‍රස්තවාදී ජාතිභේදවාදී ප්‍රශ්නය විසඳන්න අපට බැරි වුණොත්, නැත්නම් අප උත්සාහ නොගත්තොත්, තමුන්නාන්සේලා කොහොමද මේ ප්‍රශ්න විසඳන්න බලාපොරොත්තු වෙන්නෙ ?

බණ්ඩාරනායක මැතිනිය කියනව ඒ මැතිනිය දන්නවලු පිළිවෙළක්. නුමුත් ඒක තමන්ගෙ හෘදයෙ හංගගෙන ඉන්නවලු ! තමන්ට බලය ලැබෙන කල්. බලය ලැබුණොත් බාග වෙලාවට ඒක ප්‍රකාශ කරන්න පුළුවනි. නුමුත් බලය නොලැබුණොත් මැතිනිය එක්ක ඒ ගුලියත් නැති වෙනවා. පුරාණ වෙද්දු වැදගත් ගුලියක් තියාගෙන ඉන්නව ලෙඩ්ඩු හොඳ කරන්න. වෙද මැරුණාම ඒ ගුලියත් නැති වෙනව. අද අප ඉන්නෙ නවීන ලෝකෙක. අප දැන ගන්න ඕනෙ විසඳීම මොකක්ද කියල. එය හොඳ නම් අපට පිළිගන්න පුළුවන්. දැන් කරුණාකරල ප්‍රශ්න අහපු මහත්වරු දැන් නැගිටල කියන්න තමන්ගේ විසඳීම. කිසි කෙනෙක් දන්නෙ නැහැ. එහෙනම් අපේ විසඳීමත් අප හදන්න එපායැ ? බලන්න එපායැ ! ඒකෙන් හරි යයිද ? කියල. හැමදාම අපේ සිංහල දරුවො මැරෙනව. හැමදාම ද්‍රවිඩ අහිංසක මනුෂ්‍යයෝ මැරෙනව. පවුල් අනාථ වෙනව. ළමයි අනාථ වෙනව. කෝටි ගණන් වියදම් වෙනව.

අද පොදු ප්‍රශ්නයක් තමයි ආහාර මුද්දර බෙදීම. ආහාර මුද්දර දෙගුණයක් වැඩිපුර මහජනයාට දෙන්න පුළුවනි. දෙගුණයක් ඒ සල්ලි වැඩි කරන්න පුළුවනි. කළු ගඟ ව්‍යාපාරය හෙටම පටන් ගන්න පුළුවනි. මහවැලි ගඟ ව්‍යාපාරය භාගයක් ඉවර කරන්න පුළුවනි. ඒ සල්ලි අප වියදම් කරනව නැව් ගන්න, අහස් යාත්‍රා ගන්න, බෝම්බ ගන්න, තුවක්කු ගන්න, මනුෂ්‍යයන් මරන්න. මනුෂ්‍යයන් හදන්න නොවෙයි, අපේ මනුෂ්‍යයන් මරන්න. නායකයෙක් වුණහම වගකීමක් තියෙනවනෙ. රටේ මහජනය බේරන්න, රටේ මහජනයා ප්‍රවේසම් කරන්න, රටේ මහජනයාට ආහාර ලබාදෙන්න, මොකද අප ආහාර මුද්දර දෙන්නෙ ? අපේ ලංකාවෙ සීයෙන් හතළිහක්, පනහක් පමණ ආහාර මුද්දර ලබාගෙනයි ජීවත් වන්නෙ. ආදායම් නැති නිසා. ළමයින්ට කිරිපිටි ගන්න ඉඩක් නැති නිසා. රක්ෂාවක් නැති නිසා. ඒක අපි වාගේ දියුණුවෙන රටක තත්ත්වයයි. අපට වඩා අමාරුවෙලා තියෙනව ඉන්දියාව, පකිස්ථානය, බංගලිදේශය වගේ රටවල්වලට. මේ මුළු කලාපයෙම හොඳ තත්ත්වයක් තියෙන රටක් තමයි ලංකාව. අප බලයට පැමිණියට පස්සේ තිබුණාට වඩා රට දියුණු වුණා. නුමුත් මේ අවුරුද්දෙ මේ ප්‍රශ්නය විසඳුවේ නැත්තම් අප පහළ වැටෙන්න බලාපොරොත්තු වෙන්න ඕනැ. ආණ්ඩුවක් හැටියට අපි එයට කැමති නැහැ.

අද ඊලාම් දුන්නොත්, මෙ ප්‍රශ්නය ඉවරයි. අප ඊලාම් දෙන්නේ නැහැ. අපට තියෙන්නෙ ඒකීයභාවයක් තියෙන ආණ්ඩුවක්. ඒක වෙනස් කරන්න බැහැ. අප යම් යෝජනාවක් ගෙනාවොත් ඒ යෝජනාව ගෙනෙන්නෙ ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යටතේ. ඒකයි අප මෙච්චර සාකච්ඡා කරන්නෙ. අප සාකච්ඡා කරල තීරණයකට බැස්සම පාර්ලිමේන්තුවට ඒ නීති රීති ගේනව. ඒ නීති උසාවියට යවනව. උසාවිය සොයා බලයි මේක අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි නීතියක්ද කියල. එහෙනම් වුවමනා වෙනව අපට ජනමත විචාරණයක්. නැත්නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන්නත් පුළුවන්. අපේ ඒකීය ක්‍රම නැතිවෙලා පෙඩරල් ක්‍රමයක් අනුව ක්‍රියා කරනවද කියල ආණ්ඩුවට තීරණයක් දෙයි උසාවියෙන් මධ්‍යස්ථ ලෙස. දේශපාලන බලපෑම්වලට යට වෙන්නෙ නැතුව. එහෙම කිව්වොත් මේක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධයි කියල, මෙකෙන් ඒකීයභාවය නැති වෙනව කියල, මෙකෙන් පෙඩරල් ක්‍රමයක් ඇති වෙනව කියල, මෙකෙන් ජනමත විචාරණයක් වුවමනා කරනව කියල. අප අහක් කර ගන්නව ඒ ව්‍යවස්ථාව.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යම් නීතියක් ගේන්න පුළුවන් නම් ඒක පාර්ලිමේන්තුවෙ බලයක්. ඒක ආණ්ඩු බලයක්. අප කිසි කෙනෙකුට අඩන්න වුවමනාවක් නැහැ. ජනමත විචාරණයක් තියන්න වුවමනාවක් නැහැ. මන්ත්‍රී තරගයක් තියන්න වුවමනාවක් නැහැ. පාර්ලිමේන්තුව පත් කරන්නෙ

මහජනයා අවුරුදු හයකට. අප ජනමත විචාරණයකින් ඒක තව දික් කෙරුව. අප නෙවෙයි කෙරුවෙ මහජනයා. බණ්ඩාරනායක මැතිනිය අවුරුදු දෙකක් දික් කෙරුව. අවුරුදු පහකට පත්වුණ ආණ්ඩුව කිසි ජනමත විචාරණයක් නැතිව. තමන්ට ඡන්ද තුනෙන් දෙකක් තිබුණ නිසා. ඡන්දෙන් තුනෙන් දෙකක් නොවෙයි, අපට ඡන්දෙන් හයෙන් පහක් තිබුණත් එහෙම කෙරුවෙ නැහැ. ජනමත විචාරණයකින් තමුන්නාන්සේලාගෙන් ඇහුවා. අපට සියයට පනස් තුනක් ඡන්ද ලැබුණ. සියෙන් පණහකට වැඩිය ඡන්ද ලැබෙන්න ඕනෑ ජනමත විචාරණයක් සම්පූර්ණ වෙන්න. ජනමත විචාරණය කියන්නේ මොකක්ද කියල කිසි කෙනෙක් දන්නෙ නැහැ ලංකාවෙ, අප මේක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුල් කරන තෙක්.

ඊට ප්‍රථම ජනමත විචාරණයක් තියන්න බලයක් තිබුණේ නැහැ. ඉන්දියාවෙ ජනමත විචාරණ නැහැ. එංගලන්තෙ නැහැ. ලෝකෙ රටවල් රාශියක නැහැ. අපි ප්‍රථමයෙන් ලංකාවට ගෙනාවෙ, ආසියාවට ගෙනාවෙ ජනමත විචාරණයක්, හය නැතුව. සියෙන් පණහක් ඡන්දෙ දෙන්න ඕනෙ ජනමත විචාරණයක් සාර්ථක වෙන්න. කෙලින්ම ප්‍රශ්නයක් අහන්න ඕනෙ; කැමතිද ? කැමති නැද්ද ? ව්‍යවස්ථාවක් දන්න බැහැ ජනමත විචාරණයකට. ව්‍යවස්ථාවෙ තියෙනව වගන්ති රාශියක්. එක ප්‍රශ්නයක් අහන්න පුළුවනි. පාර්ලිමේන්තු කාලය දික් කරන්නද ? නැද්ද ? එතකොට කළගෙඩියට හෝ ලාම්පුවට ඡන්දෙ දෙන්න ඕනෙ. ප්‍රශ්න කිහිපයක් ඇතුළු ජනමත විචාරණයක් තියන්න බැහැ. මේ ප්‍රශ්නයෙ ප්‍රශ්න කිහිපයක් තියෙනව. අදම ප්‍රශ්න දහයක් දොළහක් අරන් තියෙනව. ඒ නිසා ජනමත විචාරණයට සුදුසු නැහැ. උසාවියට ගියහම උසාවිය කියයි මේ වගන්තියට ජනමත විචාරණයක් ඕනෙ කියල. වගන්ති ඔක්කොම ගැන නොවෙයි. වගන්ති බාග වෙලාවට පණහක් පමණ ඇති ව්‍යවස්ථාවෙ. එයින් එකක් නැත්නම් දෙකක් වෙනුවෙන් ජනමත විචාරණයක් තියන්න ඕනෙ නම් ඒවා අහක් කර ගන්නව. ඒ තීරණය අනුව ව්‍යවස්ථා සකස් කරල පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාම තුනෙන් දෙකක් ඡන්දය වුවමනා වෙනව, ඇතැම් ව්‍යවස්ථාවලින් ආණ්ඩුක්‍රමය සංශෝධනය කරන්න. තුනෙන් දෙකක් ඡන්දය ලබා ගෙන ස්ථිර කරල නීතිගත කරන්න. ඒකට කිසි කෙනෙකුගෙ ආධාර වුවමනා කරන්නේ නැහැ. මන්ත්‍රීවරුන්ගෙ ආධාර විතරයි. අද මන්ත්‍රීවරු ඔක්කොම එකඟවෙලා තියෙනව. අද ඇමති මණ්ඩලය ඔක්කොම එකඟ වෙලා තියෙනව. අපේ පක්ෂයේ විධායක මණ්ඩලය එකඟ වෙලා තියෙනව. අප සම්මේලනයක් තියල සම්මේලනයෙන් අහනවා. ඒකෙන් පිට යන්න වුවමනාවක් නැහැ.

අප කරපු දේ වැරදි නම් මන්ත්‍රී තරගෙදි අපව අහක් කරන්න පුළුවන්. ඒකට සම්පූර්ණ බලය තියෙනව. නුමුත් ව්‍යවස්ථාවත් සම්බන්ධව බලය තියෙන්නෙ පාර්ලිමේන්තුවෙ කණ්ඩායමකට පමණයි. වෙන කාටත් නැහැ. අපට බල කරන්න බැහැ. බල කරල අප බය වුනොත් එහෙනම් ප්‍රජාතන්ත්‍රවාදය එතනින් ඉවරයි. ඒක මතක තියාගන්න ඕනෙ. බල කරල, සත්‍යග්‍රහ කරල, වර්ජනය කරල, හර්තාල් කරල, මේ නීතිය ගේන්න එපා කියා පිරිසක් ගිනි තියාගෙන කිව්වත්, මමයි අපේ ආණ්ඩුවයි නම්, ඒකට ගය වෙන්නෙ නැහැ කියල මා කියන්න සතුටුයි. ගයවෙලා මේ පනත අහක් කරගත්තොත් ප්‍රජාතන්ත්‍රවාදය එයිත් ඉවරයි. ප්‍රජාතන්ත්‍රවාදය ඉවර කරන්න මගේ කිසිම බලාපොරොත්තුවක් නැහැ. ඒ නිසා කතා කරන්න පුළුවන්. දේශනා කරන්න පුළුවන්. ලියන්න පුළුවනි. සභාවල් පවත්වන්න පුළුවනි. පාර්ලිමේන්තුවෙ ජන්දෙන් විරුද්ධ වෙන්න පුළුවනි. අහිංසාවාදයෙන් ඕනැම විරුද්ධභාවයක්, විරුද්ධ ප්‍රකාශයක්, මතයක් ප්‍රකාශ කරන්න පුළුවනි. ඒකට අපි සම්පූර්ණ ඉඩ දෙනව. නුමුත් සමහර අය කියනව වාගෙ නීති විරෝධී ක්‍රියාවකින් ආණ්ඩුව බය කරන්නට, ආණ්ඩුවට බල කරන්නට, තුවක්කු හදනව නම් කරුණාකරල ඒ අදහස් අත්අරින්න. ඒකට ඉඩ දෙන්නෙ නැහැ. බය වෙන්නෙ නැහැ. ඒකට මැදිවෙන්නෙ නැහැ. ඒකට යටත් වෙන්නෙ නැහැ. එහෙම යටත් වුනොත් මේ ලංකාවේ මහජනයාට, තමුන්නාන්සේලාට, බලය නැතිවෙනව, ප්‍රජාතන්ත්‍රවාදය එතනින් ඉවරයි. එතකොට මාර්ගය පැදෙනව ඒකාධිපතිවරයෙකුට, ආඥාදායකයෙකුට, මිලිටරි ආණ්ඩුවකට. ඒකට එක්සත් ජාතික පක්ෂය තිබෙන තුරු අප ඉඩ දෙන්නෙ නැහැ. අපට පුළුවන් තෝරාදෙන්න මේ ප්‍රශ්න ඔක්කොම. නායක ස්වාමීන් වහන්සේලාට ප්‍රශ්න තියෙනව දානය වළඳන්න. බොහොම සන්තෝෂයි ඔබ වහන්සේලා ඔච්චර විනයට ගරු කරන එක ගැන. දානයට වෙලාවට යන්නට ඕනෙ, එකොළහ පසුවුනාම, එකොළහමාර වෙනකන් ඉන්න පුළුවන් කියල ප්‍රකාශ කළා. අන්න එහෙමයි අප ගරු කරන්නෙ ස්වාමීන් වහන්සේලාට, විනයට ගරු කරන නිසා, විනය අනුව ජීවත් වෙන නිසා. එහෙම ජීවත්වෙන්නෙ නැත්නම් අපි වාගෙයි. අපේ හුඟාක් අඩුපාඩු තියෙනව. හුඟාක් තන්හාව තියෙනව, ඊර්ෂ්‍යාව තියෙනව, ස්වාමීන් වහන්සේලා එහෙම නැහැ කියල මා බලාපොරොත්තු වෙනව, විශ්වාස කරනව.

එතකොට සමහර ප්‍රශ්න ගැන මා හිතන්නෙ අපේ මුදල් ඇමතිතුමා උත්තර දෙයි. එකොළහමාර වෙනකන් වෙලා තියෙනව අප දෙන්නට. මා කැමතියි මේ ප්‍රශ්නයට ඉතිහාසය මතක් කරන්න. මේක අද ඊයෙ තිබුණ ප්‍රශ්නයක් නොවෙයි. ඇතිවුනෙ අවුරුදු හැටකට, හැට පහකට ප්‍රථම. 1912 දී ලංකා ජාතික සංගමය ආරම්භ කෙරුව. ලංකාවට ඒ කාලෙ ඩොනමෝර් ආණ්ඩුක්‍රමයක් ලැබුණ. ඉන්දියාවෙ ජාතික සංගමය ඊට අවුරුදු හතළිහකට

ඉස්සෙල්ල ආරම්භ කරල තිබුණ. ඒ අනුව ලංකා ජාතික සංගමය ආරම්භ කළා. ඒකෙ සභාපති පොන්නම්බලම් අරුණාචලම්. දෙමළ මහත්මයෙක්. පොන්නම්බලම් රාමනාදන්ගෙ සහෝදරයා. 1918 දෙසැම්බර් මාසෙ ලංකා ජාතික සංගමය ආරම්භ කිරීමට ඒ යෝජනාව ගෙනාවෙ මගෙ පියා. ඒ. ඩබ්ලිව්. ජයවර්ධන. ස්ථිර කෙරුවෙ ඒ. ඒ. ද සිල්වා. එෆ්. ආර්. සේනානායක. ඩී. එස්. සේනානායක. ඩී. බී. ජයතිලක. ප්‍රැන්සිස් ද සොයිසා යන මහත්වරු ඔක්කොම සිටියා ඒ ජාතික සංගමයෙ. අවුරුදු දෙකක් යන්න ප්‍රථම 1920 දී ප්‍රථම වරට ඉංග්‍රීසි ආණ්ඩුව අපට ව්‍යවස්ථාදායක සභාවෙ මන්ත්‍රීවරු විසිදෙනෙක් තෝරන්න බලය දුන්නා. ඊට ඉස්සෙල්ල හිටියෙ එක්කෙනයි. මුළු ලංකාවෙ උගත් ලාංකික ආසනය කියල මුළු ලංකාවට එක මන්ත්‍රීවරයෙක් පත් කිරීමට මන්ත්‍රී තරඟයක් ඇති වුනා මුළු ලංකාවෙ.

ඒ ඡන්ද විමසීමේදී පොන්නම්බලම් රාමනාදන් ඉදිරිපත් වුනා. ඊට විරුද්ධව ඉදිරිපත් වුනා මාකස් ප්‍රනාන්දු. පොන්නම්බලම් රාමනාදන් මහතා ඉන්දියාවට ගිහිල්ල හිටිය. ලංකාවෙ උසස් නීතිඥයෙක් හැටියට වැඩ කරල. ඇටෝර්නි ජෙනරල් හැටියට වැඩ කරල විශ්‍රාම අරන් ඉන්දියාවෙ හිටිය. මගෙ සීයයි, මගෙ පියාගෙ සහෝදරයොයි ඉන්දියාවට ගිහින් එතුමාට ආරාධනා කරල ගෙනල්ල තරඟය දිනාගත්ත. හෙක්ටර් ජයවර්ධන ගොඩක් උත්සාහ අරගෙන දිනාගත්ත. රාමනාදන් මහත්මය මහජනයා තෝරපු ලංකාවෙ ප්‍රථම මන්ත්‍රීවරයා හැටියට කටයුතු කළා. 1915 දී සිංහල මුස්ලිම් කෝලාහලය කාලෙ එතුමා එංගලන්තෙට ගිහිල්ල ව්‍යවස්ථාදායක සභාවෙ කථා කරල ඉංග්‍රීසි ආණ්ඩුව එක්ක හැප්පිලා, පේද්‍රිස්තුමා බේරන්න උත්සාහ ගත්තා. සිංහල මිනිස්සු එතුමා ගැන බොහොම ආදරයක් භක්තියක් ඇතිව සිටියා. එංගලන්තයට ගිහිල්ල එනකොට, මේක මතක තියාගන්න. වරායෙ ඉඳන්, එතුමා හිටියෙ වෝඩ් පෙදෙසෙ, මගේ ගේ ලඟ. වෝඩ් පෙදෙසෙ ඒ කාලෙ අශ්ව කරත්ත තිබුණ. මේ අශ්වයෝ අස් කරල ඩී. එස්. සේනානායක, එෆ් ආර්. සේනානායක, ඩී. බී. ජයතිලක, ගුණසිංහ ආදී සිංහල නායකයෝ, එතුමාගෙ කරත්තෙ ඇදගෙන ආව. මං ලඟ පින්තූරයක් තියෙනව. වරායෙ ඉඳන් වෝඩ් පෙදෙසට එනකන්. එච්චර සිංහල මිනිස්සුන්ගෙ ආදරයක් තිබුණ පොන්නම්බලම්තුමාට. ඊට පස්සෙ තමයි ජාතික සංගමය ආරම්භ වූයේ.

එක්කෙනෙක් හිටිය ව්‍යවස්ථාදායක සභාවට විසිදෙනෙක් පත්වුනා. බටහිර ප්‍රදේශයට ආසනයක් තිබුණා. ඒ ආසනයට අරුණාචලම් මහත්මය එන්න කැමතිවුනා. නුමුත් ප්‍රමාද වුනා. කල් දැම්ම. ඒ කල් දානවිට ජේම්ස් පීරිස් ඉදිරිපත් වුනා. ශ්‍රීමත් ජේම්ස් පීරිස්. එවිට එතුමා ලංකා ජාතික සංගමයෙ සභාපති හැටියට පත් වෙලා හිටිය. අරුණාචලම් වෙනුවට, එතුමා ඉදිරිපත්

වුනා. අරුණාචලම් මහතා මේ ගැන සිත කලකිරිල සිංහල මිනිස්සු අපට විරුද්ධයි කියල එතුමාත් අපේ දෙමළ කණ්ඩායමත් ලංකා ජාතික සංගමයෙන් අස්වුනා. අස්වෙලා එක්සත් ජාතික පක්ෂය 1946 ආරම්භ කරන තෙක් නැවතත් ද්‍රවිඩ පිරිස ලංකා ජාතික සංගමයට හෝ ලංකා පොදු ජන පක්ෂයකට බැඳුනෙ නැහැ. ලංකා ජාතික සංගමයෙත්, එක්සත් ජාතික පක්ෂයෙත් හිටියා දෙමළ මිනිස්සු, නමුත් සමූහයක් හැටියට, කණ්ඩායමක් හැටියට, බැඳුනෙ නැහැ. මේ ප්‍රශ්නෙ ක්‍රම ක්‍රමයෙන් දියුණුවෙන්න පටන් ගත්තා. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය එන කාලෙ පොන්නම්බලම් මහත්මය පටන් ගත්ත පණහට පණහෙ ඉල්ලීම. එතුමා කිව්වෙ දැන් සර්වජන ඡන්දය ලැබිල තියෙනව. දේශපාලන බලය ක්‍රම ක්‍රමයෙන් පාර්ලිමේන්තුවට නැත්නම් ව්‍යවස්ථාදායක සභාව අතට එනව. එතකොට සිංහල මිනිස්සුන්ට තමයි බලය තියෙන්නේ. අපට තැනක් නැහැ. ඒ නිසා පණහට පණහයි කියන්නෙ මන්ත්‍රීවරුන්ගෙන් සියට පණහක් සිංහල. සියෙන් පණහක් සුළු ජාතීන්. ද්‍රවිඩ. යාපනේ ද්‍රවිඩ. ඉන්දියාවෙ ද්‍රවිඩ. මුස්ලිම්. ලංසි ආදී සියට පණහක්. එතකොට පුළුවන් එක මට්ටමේ වැඩ කරන්න. තරාදියකට දල දෙපැත්තම එක බර හැටියට පුළුවන්. එතකොට පණහට පණහ කියල යෝජනාවක් ගෙනාව. ඒක ඩොනමෝර් ව්‍යවස්ථාව අනුව මන්ත්‍රීවරු පිළිගත්තෙ නැහැ. ඒක ප්‍රතික්ෂේප වුනා. එද ඉඳන් ද්‍රවිඩ උදවිය උත්සාහ කලා පාර්ලිමේන්තුවෙ බලය ලබාගන්න. ඒකත් හරිගියෙ නැහැ. ඒගොල්ල එක මන්ත්‍රී තරහයකදී යාපනේ මන්ත්‍රී තරහ වර්ජනය කෙරුව. එතකොට ඔක්කොම සිංහල මිනිස්සු පත්වුනා කැබිනට් මණ්ඩලයට. සෝල්බරි ආණ්ඩු ක්‍රමයේදීත් මේ වර්ජන ව්‍යාපාරය ගෙනිහිල්ල අපට නිදහස ලැබුණ.

## සුළු ජාතීන්ගේ තැන

එතකත් ප්‍රශ්නෙ තිබුණේ, කොහොමද පාර්ලිමේන්තුවෙ සුළු ජාතීන්ට තැනක් ලැබෙන්න ? සර්වජන ඡන්දය ලැබුණාම තනි සිංහල බලය කොහොමද පුළුවන් නැති කරන්නෙ කියන එකයි. නමුත් කට්ටියක් බැඳුන එක්සත් ජාතික පක්ෂයට 1947 දී. සුන්දරලිංගම් මහතා ආදී උදවිය. පොන්නම්බලම් මහත්මයත් ටික කලක් ගිහිල්ල බැඳුණ. එතුමා බැඳුනහම එතුමාගෙන් පිරිසක් වෙන්වෙලා ගියා. එක්දහස් නවසිය හතළිස් හයේ, හතේ, ඒ පිරිස තමයි චෙල්වනායගම් මහත්මයාගෙ පිරිස. චෙල්වනායගම් මහත්මය කිව්ව පොන්නම්බලම් මහත්මය ආණ්ඩු කරන හැටි හොඳ නැහැ. ඒ නිසා අප වෙන්වෙලා යනවා, අපට තැනක් නැහැ මේ ආණ්ඩුව යටතෙ. අපි ඒ නිසා ෆෙඩරල් ක්‍රමයක් ඉල්ලනව කියල. ඒ කියන්නෙ අපට මධ්‍යම ආණ්ඩුවෙ බලයක් නැත්නම් අපේ පළාතේ අපේ ආණ්ඩුවක් පිහිටුවමු කියල ෆෙඩරල්

ක්‍රමයක්. නුමුත් ඒකීය ආණ්ඩුවක් යටතෙ අපෙ පලාතට විශේෂ බලය ලබාගෙන පෙඩරල් ක්‍රමයක් ඉල්ලමු කියල පෙඩරල් පක්ෂය ආරම්භ කළා. ඊට පස්සෙ තමයි ඒගොල්ලො ක්‍රියා කෙරුවෙ. බණ්ඩාරනායක මහත්මය 1956 ගෙනාවා සිංහල පමණක් යෝජනාව. ඒ වෙලාවෙ කොල්වින් ආර්. ද සිල්වා මහත්මයා ප්‍රකාශ කෙරුව එක භාෂාවක්, ජාති දෙකක්. භාෂා දෙකක්, එක ජාතියක්. එක භාෂාවක් ගෙනාවොත් එහෙනම් අනික් භාෂාව පාවිච්චි කරන ද්‍රවිඩ, මුස්ලිම්, ඉන්දියන් ද්‍රවිඩ උදවිය බාගවෙලාවට ජාති දෙකක් හැදීමට උත්සාහ ගනියි කියා. ඒ ගොල්ලන්ටත් තියෙනව වැදගත් භාෂාවක්. ඒ භාෂාවෙත් ඒ ගොල්ලන්ටත් තියෙනව හොඳ සාහිත්‍යයක්. ඒගොල්ල කැමතිවෙන්නෙ නැහැ, එක භාෂාවක් යටතෙ ඉන්න. සිංහල මිනිස්සු සිංහල භාෂාව බිලිදීමට කැමති නැහැ. නමුත් ඒ ගොල්ලන්ගෙ භාෂාව උවමනා කියල එක භාෂාවෙන් ජාති දෙකක් හැදෙයි කියල කොල්වින් ආර්. ද සිල්වා මහත්මය කිවුව. අන්න එහෙම වුනා. ඒ එක භාෂාවක් පිළිගන්නට පස්සෙ අර පෙඩරල් පක්ෂය කිව්වා අපට පෙඩරල් ක්‍රමය උවමනා නැහැ. අපිට ඕනෙ සම්පූර්ණ වෙන ජාතියක්, වෙන රටක්. ඊලාම් කියන රට. උතුරු පලාතේ ද්‍රවිඩ උදවිය ඉන්නව සීයෙන් හැත්තෑ පහක්, අසූවක් විතර. නැගෙනහිර පලාතේ ඉන්නව, දන් ඉන්නව පණහට පණහක් විතර. ඒ නිසා මේ පලාත් දෙක එක් කරල ඊලාම් නමින් නිදහස් රාජ්‍යයක් ඇති කරමු කියල 1970 ට අවුරුදු දෙකකට විතර පස්සෙ මේ යෝජනාව ගෙනල්ල පෙඩරල් පක්ෂය. ඊලාම් පක්ෂය. ද්‍රවිඩ එක්සත් පෙරමුණ හැටියට ක්‍රියාත්මක වුණා.

ඒගොල්ලො ක්‍රියා කෙරුවෙ අහිංසා මාර්ගයෙන්. වෙල්වනායගම් මහත්මය කැමති වුණේ නැහැ හිංසා මාර්ගයෙන් වැඩ කරන්න. අහිංසා මාර්ගයෙන් වර්ජන ව්‍යාපාර, තැපැල් මුද්දර අච්චු ගහල, නිදහස් රාජ්‍යයක් හැටියට වැඩ කරන්න බලාපොරොත්තුවෙන්. හර්තාල් කරල, කොළඹට ඇවිල්ල ඒ උදවිය හැදුවෙ ඉන්දියාවෙ ජාතික සංගමය වාගෙ බලයක් ලබාගන්න හර්තාල් අහිංසා මාර්ගයෙන්. නුමුත් ක්‍රම ක්‍රමයෙන් ලංකාවෙ පමණක් නොවෙයි, ලෝකයෙ ත්‍රස්තවාදී ව්‍යාපාරය දියුණුවෙන්න පටන් ගත්ත. ඒක අපේ රටෙත් දියුණුවෙන්න පටන් ගත්ත.

ඉන්දියාවෙ, පන්ජාබයේ, එනකොට බංගලා දේශයේ, මිසෝරාම්, නාගලන්තෙ කේරළයේ, අයර්ලන්තයේ, ප්‍රංශ රටෙ, ජර්මනියෙ, ස්පාඤ්ඤ රටෙ, මැලේසියාවෙ, බුරුම රටෙ, මුළු ලෝකයේම ත්‍රස්තවාදී ව්‍යාපාරයන් පටන් ගත්ත. ඒක අලුත් වසංගතයක්. ඒ කිසිකෙනෙක් කියල නෙවෙයි හැදුනෙ. ඒක දෙවෙනි යුද්දෙට පස්සෙ හැදුන අලුත් මතයක්. ලංකාවටත් බෝවුනා. 1977 මන්ත්‍රී තරඟය ඇතිවුනහම අපට මෙක තේරුණා. ද්‍රවිඩ එක්සත් පෙරමුණ සිටිය එනකොට විපක්ෂෙ. වෙල්වනායගම් මහත්මය එනකොට මැරිල

අවාසනාවකට. අමිර්තලිංගම් එච්චර මොලේ පාවිච්චි කරපු උදවිය නොවෙයි. තරුණයන්ගේ බලයට යටත්වෙලා ඒ මහතා කොහොමහරි අපි එක්ක සාකච්ඡා කරල කිවුව අපි නිදහස් ස්වාධීන ඊලාම් ඉල්ලන්නෙ නැහැ. අපට අපේ වැඩකටයුතු භාරගන්න බලයක් දෙන්න කියල. ඒ නිසා නමුත්තාන්සේලා දකින්න ඇති මේ ව්‍යවස්ථා මාලාවෙ තියෙනව ප්‍රශ්න පහක්ද, හතරක්ද.

එකක් තමා දිසා සංවර්ධන මණ්ඩල ඇති කිරීම. හැම දිසාවකම, දේශයකම මහජනයා තෝරන මණ්ඩල ඇති කිරීම. ඒ මණ්ඩලයට දිසා ඇමතිවරයෙක් පත් කරන්න. මෙතෙක් කාලයක් දිසා මණ්ඩල තිබුණෙ නැහැ. ඩඩ්ලි සේනානායක හැදුව ඇති කරන්න..නුමුත් විරුද්ධ වුනා. දඹරාවෙ හාමුදුරුවෝ අපවත් උනා. එතුමා ඒ අදහස අත් හැරියා. ඒක අත්ඇරපු එක වැරදියි. මම පුළුවන් තරම් උත්සාහ ගන්න අත්හරින්න එපා කියල. නුමුත් එතුමා ඒක අත් හැරිය. ප්‍රථම වරට ලංකාවෙ අපි දිසා මණ්ඩල ඇති කෙරුව එක්දහස් නවසිය අසූවේද අසූ එකේද. එතකොට අපි කිවුව රක්ෂාවල් සම්බන්ධ තමන්ගෙ ජන අනුපාතය අනුව පත් කරනව කියල. විශ්වවිද්‍යාලයට ඇතුල්වීමත් ජන අනුපාතය අනුව කරනව කියල. ඉඩම් ජන අනුපාතය අනුව දෙනව කියල. දිසා මණ්ඩල සහ තව තියෙනව. ප්‍රතිපත්ති තුනක්ද හතරක්ද අපේ. ප්‍රකාශනයේ ඇතුල් කරල අපි ඒව ඔක්කොම ක්‍රියාවෙ යොදවනව. භාෂාව ගැන. දෙමළ භාෂාව ජාතික භාෂාවක් හැටියට නීතිගත කරනව කියල. අපි ඒය ජාතික භාෂාවක් කළා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්. ඉඩම් සම්බන්ධවත්, විශ්ව විද්‍යාල සම්බන්ධවත්, රක්ෂාව සම්බන්ධවත් ඒ අනුව ක්‍රියා කළා. විශ්වවිද්‍යාල ගැන ප්‍රශ්නයක් නැහැ. දැන් ඉඩම් සම්බන්ධවත් නැහැ. එතකොට රක්ෂාවල් සම්බන්ධවත් නැහැ. අවාසනාවකට මෙ කෝලහලය නිසා දෙමළ මිනිස්සු ගන්නත් අප බයයි, ආණ්ඩුවෙ සේවයට. දිසා මණ්ඩල ඇති කළා අවුරුදු එකක් දෙකක් ඒව හොඳට ක්‍රියා කළා.

අපි නො දැනම මේ ත්‍රස්තවාදී ව්‍යාපාරය විශේෂයෙන්ම යාපනේ පළාතෙ නැගෙනහිර පළාතෙ බිහිවෙන්න පටන් ගත්ත පැතිරෙන්න පටන් ගත්ත, ලොකු වෙන්න පටන් ගත්ත. අන්තිම කාලෙ ඒ දිසා මණ්ඩලයෙ දෙමළ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් මට ඇවිල්ල කිව්ව වැඩි කාලයක් යන්න ඉස්සෙල්ල විශාල කෝලාහලයක් ඇතිවෙනව. තවත් බලතල මෙ දිසා මණ්ඩලවලට දෙන්න කියල. අපි මේව ඒ කාලෙ සාකච්ඡා කළාම, ලේසි වුනේ නැහැ කරන්න. ඇටෝර්නි ජෙනරාල්තුමා කිවුව මේක කරන්න බැහැ කියල. ඒ නිසා තමයි දැන් මේ පළාත් සභාවක් කරන්න බලාපොරොත්තු වෙන්නෙ. අපි දිසා මණ්ඩලවලට මන්ත්‍රී තරඟ තිබ්බම ත්‍රස්තවාදීන් එදා පොලිස් නිළධාරීන් තුන් දෙනෙකුට

මැරුව, අමිර්තලිංගම් මහත්මයාගෙ සභාවකදි. ඒ පොලිස් නිලධාරීන් තුන්දෙනාගෙ මෘතදේහ ගෙනාවා පොලීසිය තියෙන තැනට. ඒක වැරදියි, නුමුත් ඒ කාලෙ දන්නෙ නැහැ මේ කාරණා, පොලීසියේ විශේෂ උදවිය ගිහිල්ල හිටිය රාශියක් රාජකාරිවලට හරියට නුවර පෙරහැරට ඉන්නව වගෙ.

ඒ කට්ටිය අතරෙ හිටිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂෙ අය. එද ඒ එගොල්ලො කෝලාහල කළා, යාපනේ කිට්ටුව. යාපනේ නගර ශාලාව පිච්චුව. පොත් පත් පිච්චුව. දෙමළ මිනිස්සුන්ටත් හිරිහැර කෙරුව. අහිංසක මිනිස්සුන්ට. ඒකෙන් විශාල තරහක් ඇතිවුනා දෙමළ ජනයා අතර යුද හමුදව, පොලීසිය එක්ක, අපේ ආණ්ඩුව එක්ක. නුමුත් දිසා මණ්ඩල වැඩ කරන්න පටන් ගත්ත. බොහොම කරදරයෙන් අපි ඒ මන්ත්‍රී තරගය තිබ්බෙ. ඇතැම් ඡන්ද පොළවලට සෙනග ආවෙත් නැහැ. නමුත් ඒව තිබ්බ. යාපනේ දිනාගත්ත ද්‍රවිඩ සංගමය. අවුරුදු එකක්ද දෙකක්ද වැඩ කෙරුව හොඳට. මෙහෙම වැඩ කරද්දි ඒ අය හිතුව 82 දි අපි මේවයින් අස්වෙන්න ඕනෙ, මේවයෙ ඉඳල ප්‍රයෝජනයක් නැහැ, කියල මා හිතන්නෙ ත්‍රස්තවාදීන් බල කරන්න ඇති.

## ද්‍රවිඩ ජාතිකයන්ගේ සැකය

දෙමළ සංගමය, අමිර්තලිංගම්, ඒගොල්ලො අස්වුනා. 1983 ජූලි මාසේ අපේ යුද්ධ හමුදවෙ දහතුන්දෙනෙක් බෝම්බ පුපුරල මැරුණ, අපි දන්නෙත් නැහැ කවුද කෙරුවෙ ඒ කාලෙ කියල. ප්‍රභාකරන් කියනව එයා කෙරුව කියල, දන්නෙ නැහැ ඇත්තද ? බොරුද ? කියල. දහතුන් දෙනෙක් මැරුණ. ඒ මරණයට පස්සෙ ලංකාවෙ හැම පළාතෙම කෝලාහල ඇති වුනා. කොළඹ, මහනුවර, වතුයායවල්වල නුවර. අහිංසක මනුෂ්‍යයො මැරුණා. කවුරු කෙරුවද දන්නෙ නැහැ, නුමුත් මා හිතන්නෙ ඒක කුමන්ත්‍රණයක්. අර මැරිච්ච යුද්ධ හමුදවෙ දහතුන්දෙනාව අපට එගෙ වළලන්න තිබුණා. ආදහනය කරන්න තිබුණ. නුමුත් අපි හිතුව කොළඹට ගේන්න, ගෞරවයක් වශයෙන්. අපේ ගෞරවය පෙන්වන්න. අපට ගම්වලට යවන්න තිබුණ. නුමුත් අප හිතුව ගම්වලට ගෙනිච්චොත් එහෙම ගම් දහතුනේ කෝලාහල ඇතිවෙයි කියල. ඒ නිසා කොළඹ පහට ඉස්සෙල්ල ගෙනල්ල යුද්ධ ගෞරවය අනුව ආදහනය කරන්න. යාපනේ කෝලාහල ඇතිවුනා ඒ වෙලාවෙ. හමුදවයි ඒ පළාතෙ වැසියොයි අතර. මේ මෘතදේහ දහතුන ගෙන ඒම කෝලාහල නිසා ප්‍රමාද වුනා. හත වුනා එන්න කොළඹට, රත්මලානට, අහස්යාත්‍රාවෙන්. එනකොට විශාල සේනාවක් රැස්වෙලා හිටිය කනත්තට. සේනාවක් රැස්වෙලා වලවල් කපල තිබුණ. යුද්ධ හමුදව හිටිය. මා හිතන්නෙ අපේ විරුද්ධකාරයො පටන් ගන්න කෝලාහල කරන්න. මේ උදවිය මෙහාට ගේන්නෙ නැහැ, ගම්වලට අරිනව කියල අප අහස් යාත්‍රාවෙන් ගම්වලට ඇරිය. දෙමව්පියන්ට එහෙම එන්න කියල, නුමුත් අර

විශාල සේනාව අවුස්සල විරුද්ධකාරයො කතත්තෙ ඉදත් මරදතට ගියා ඔක්කෝම කඩ කැඩුව. දෙමළ මිනිස්සුන්ගෙ කඩවල් කඩල, පුවවල පතුවෙන්දයි ලංකාවෙ තදින් කෝලාහල ඇතිවුනෙ.

මේකෙත් අර ද්‍රවිඩ උදවිය තවත් අමනාප වුනා. තවත් තරහවුනා. සිංහලයොත් එක්ක. ඇයි අපි මොකක්ද කෙරුවෙ ? ඇයි අපිට ගහන්නෙ ? අපිව මරන්නෙ ? අද වතතුරු එහෙම තමන්ගෙ ගේ පිච්චුව නම්, තමන්ගෙ කඩේ පිච්චුව නම් ඒ ද්‍රවිඩ මනුෂ්‍යයන්ගේ තවමත් තියෙනව හිතේ සැකයක් අපේ ලංකාව ගැන. හොද මිත්‍රතාවයෙන් හිටපු වැල්ලවත්තෙ, කොල්ලුපිටියෙ, ජන්දදායකයො, මගේ ජන්දදායකයො, අපට ජන්දෙ දුන්න, විපක්ෂයට නොවෙයි. ඒ උදවිය විරුද්ධ වෙලා හිටිය සිංහල මිනිස්සුත් එක්ක බැහැ අපිට සාමයක් ආරක්ෂා කරන්න කොයි වෙලාවෙ මේව නැතිවෙයිද ? එහෙම උනහම අපට ආරක්ෂාවක් නැහැ. පොලීසියෙන් ආරක්ෂාවක් නැහැ, යුද්ධ හමුදාවෙන් නැහැ. අපි දන්නව සමහරු තඩු දල තියෙනව. ඇතැම් පොලිස් නිලධාරින් අර කෝලාහලකාරයන්ට උදවු දුන්න කියල. තමුන්නාන්සේලා අතරෙ කෝලාහලයක් ඇතිවුනොත් අහිංසක උදවියට ගහනව නම් පොලීසිය ඒ පැත්ත ගන්නව නම් මොකක්ද තියෙන ආරක්ෂාව ? මොකක්ද මෙ රටෙ තත්ත්වෙ ? මොකක්ද මේ රටෙ තියෙන සාමය ?

## පෙඩරල් පක්ෂය අයින්වුනේ ඇයි ?

අන්න එහෙම අර පෙඩරල් පක්ෂයත් අපෙන් අයින් වුනා. උතුරු පළාතේ මෙ ත්‍රස්තවාදී ප්‍රශ්නෙ දියුණුවෙන්ට පටන් ගත්ත. ඒ දියුණුවීමට එක හේතුවක් තමයි තමිල්නාඩුවෙන් ලැබෙන ආධාර. එය අපට පුළුවන් කෙළින් කියන්න. තමිල්නාඩුවෙ ඉන්නව කෝටි පනහකට වැඩි ගණනක් ද්‍රවිඩ ජාතිකයන්. මෙහෙ දෙමළ මිනිසුන්ට ගැහැවහම, අහිංසක මිනිසුන්ට කොළඹ, නුවර, උඩරට, එහෙ ගිහිල්ල වෙඩි තිබ්බහම ත්‍රස්තවාදීන් වෙඩි තියල අපිත් වෙඩි තියල අහිංසක මිනිස්සු මැරුණහම අරිනව ආරංචිය තමිල්නාඩුවට, හැතැප්ම විස්සයි තියෙන්නෙ අපි දෙගොල්ල අතරෙ දුර. ලක්ෂයක් විතර ගිහිල්ල එහෙ පදිංචි වෙලා ඉන්නව මෙහෙදී අනාථ වුන උදවිය, ඒගොල්ලෝ ඇවිස්සෙනවා, ඇවිස්සිලා කියනවා, අපේ යුතුකම් ගැන කථා කරන්නේ නැහැ, අපේ අයිතිවාසිකම් ගැන කථා කරන්නේ නැහැ. දෙමළ මිනිස්සුන්ට සිංහලයන් එක්ක ඉන්න බැහැ, ආණ්ඩුවත් හිරිහැර කරනවා, ඒ නිසා අපට ඊලාම්, පෙඩරල් ආණ්ඩුක්‍රමයක් උවමනා කරනවා. මෙ ඉඩි අමින්ගේ ආණ්ඩුව වාගේ වැඩ කරන ආණ්ඩුව එක්ක අපට ඉන්න බැහැ, කියා. මේක ලොකු ප්‍රශ්නයක් තමිල්නාඩුවට. තමිල්නාඩුව, හුහක් දුරට නිදහස් ආණ්ඩුවක්, මධ්‍යම ආණ්ඩුවට කීකරු වෙන්නේ නැහැ. එද හිට අප සාකච්ඡා කරනවා ඉන්දියාවෙ ආණ්ඩුවත් එක්ක.

ගාන්ධි මැතිනිය එක්ක, රජීව් ගාන්ධි එක්ක, පාර්තසාරති එක්ක, අප තීරණයකට බැස්සා 1985 දී ලංකාවේ දේශපාලන පක්ෂ සම්මේලනයේදී සාකච්ඡා කරලා පලාත් සභා ඇතිකළ යුතුයි කියල ඉතින් අප හිතනවා මේක විසඳෙයි කියලා. නුමුත් ඒකත් ස්ථිර කරන්න බැරිවුනා. 1986 දී තිම්පු සාකච්ඡා ඇතිවුණා. දිල්ලි සාකච්ඡා ඇති වුනා. ස්ථිර තීරණයක් කරන්න බැරිවුනා.

ගාන්ධි මැතිනිය මැරුණා, රජීව් ගාන්ධිගෙන් අපට දැන් ආධාර ලැබෙනවා. අපට එතුමා කියන්නේ දෙමළ මිනිස්සුන්ගේ හිතේ බයක් තියෙනවා බය තියෙන්නේ ආණ්ඩුවේ සහ ආණ්ඩුවේ සේවකයන්, පොලීසිය, යුද්ධ හමුදාව, යාපනේ සහ නැගෙනහිර පළාතේ ඉන්නවට. ඒගොල්ලන්ගේ වැඩිදෙනෙක් ඉන්න පළාත් මේගොල්ල අපට හිරිහැර කරයිද, අපට 1983 වාගේ ඒ නිසා අපට උවමනා අපේ පාලන වැඩ කටයුතු බාරගන්න. අපේ ආරක්ෂාව අපම තියාගන්නම, අපි මධ්‍යම ආණ්ඩුව යටතේ වැඩ කරන්නම් කියලා ඒගොල්ලො කැමතිවුණා.

දැන් ඒ ගැනයි අප කථා කරන්නේ අපි මධ්‍යම ආණ්ඩුවේ බලය විමධ්‍යගත කරනවා. විමධ්‍යගත වීම පරණ ක්‍රමයක්, අපේ රටෙත් තිබුණා, රජ්ජුරුවන් යටතේ, රජ්ජුරුවෝ පත් කෙරුවා, දිසාවේවරු, මම ගියාම සබරගමුවට මා කිව්වේ මේ සබරගමුවේ සිටියේ ඇහැලේපොල දිසාව, රජ්ජුරුවන්ගේ පත්වීමක් මම හිතන්නෙ, මාතලේ හිටියේ රත්වත්තේ දිසාව, ඇහැලේපොලට පස්සෙ මහවෙල දිසාව හිටියා. ඒගොල්ලන්ට සම්පූර්ණ බලය තිබුණා. එල්ලුම්ගහට විතරයි නියම කරන්න බැරි. හිරේටත් අරින්න පුළුවනි. දැන් ඇහැලේපොළ දිසාව, මහවෙල දිසාව වෙනුවෙන් මහජනයා පත්කරන කෙනෙක් තෝරනවා.

## උතුරු පළාතට එකම ඇමතිවරයෙක්

ඒ නියෝජිතයන් මහජනයයි පත් කරන්නෙ. උතුරු පළාතට, එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන ඇමතිවරයෙක් පත්වෙන්න පුළුවන්. බාගවේලාවට පළවෙනි ජන්දෙන් පත් නොවුනත් නැගෙනහිර පළාතේ පළවෙනි ජන්දෙන් පත් වෙන්න පුළුවන්. ඇයි ? සිංහල, මුස්ලිම්, අපට පක්ෂ දෙමළ මිනිස්සු ජන්දෙ දුන්නොත් සියෙන් හැත්තෑවක් අසූවක් ජන්දෙ ලැබෙනව ඒ එක්කහු වුන කණ්ඩායමට. දේවනායගම් මහත්මයා නැගෙනහිර පළාතෙ, රාජදොරේ මහත්මය ඒ පළාතෙ, පද්මනාදන් මැතිනිය නැගෙනහිර පළාතෙ, නවරත්නරාජා මහතා ත්‍රිකුණාමලය පළාතෙ. අප ඉදිරිපත් කරනව අපේ නියෝජිතයින් අපේක්ෂකයින්, මත්ත්‍රී තරඟයක් ඇතිවුනාම, නැගෙනහිර පළාත ගැන අපට බයක් වෙන්න උවමනාවක් නැහැ. එක්සත් ජාතික පක්ෂයයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි එක්සත් වුනොත් — එක්සත් නොවුනත් පුළුවන්, එක්සත් වුනොත්

අපට පුළුවන් පලාත් සභාවෙ නැගෙනහිර පලාතේ සභාපතිවරු ආදීන් පත් කරගන්න. මන්ත්‍රී තරගයෙන් පත්වෙන්නෙ. ජනාධිපතිතුමා නොවෙයි, විපක්ෂයෙන් නොවෙයි. උතුරු පලාත ගැන කියන්න බැහැ දන්නම. නමුත් නැගෙනහිර පලාතෙ මගෙ විශ්වාසයක් තියෙනව. පුළුවන් අපේ සභාව පත් කරන්න කියල. අනික් සභා ගැන භයක් වෙන්න උවමනාවක් නැහැ. තව තියෙනවා එකක්. ඒවයෙ එක්සත් ජාතික පක්ෂය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හෝ අනික් පක්ෂ කණ්ඩායම් සටන් කරල අපේ රටේ කෙනෙක් —ද්‍රවිඩ කෙනෙක් — වෙන්න පුළුවන්. අපේ පක්ෂෙ අය. නුමුත් අපේ දේශපාලන පක්ෂයට අයිති කෙනෙක් පත්වෙනව. භයක් වෙන්න උවමනාවක් නැහැ. උතුරු පලාත ගැන විතරයි තමුන්නාන්සේලාට භයක් වෙන්න තියෙන්නෙ, ප්‍රශ්න අහල තියෙනව ඒව රොනී ද මෙල් මහත්මය තමුන්නාන්සෙලාට කියල දෙයි.

එයින් එකක් තම ඉන්දියාව. තමිල්නාඩුව අපිත් එක්ක සටන් කරයිද ? යුද්ධ හමුදාව එවයි ද ? කියල. අදත් පුළුවන්නෙ එවන්න, හෙටත් පුළුවන්, අනිද්දත් පුළුවන්. චෝල රජ්ජුරුවන්ගෙ කාලෙ ඉදන් එවනව. ඒක මට නවත්වන්න බැහැ. මේ සභාව මාර්ගයෙන් නවත්වන්න බැහැ. මහා සංඝයා වහන්සේලාටත් කාටවත් බැහැ ඒක නවත්වන්න. විශාල බලවත් රාජ්‍යයක් තියෙනව ඉන්දියාවෙ. කෝටි අසූවක් ඉන්නව. මේ මුළු ආසියාවට ගහන්න පුළුවන් ඒගොල්ලන්ට උවමනානම්. තවත් බලවත් වෙනව ඒ ගොල්ලො. පරමාණු බෝම්බයත් සොයා ගෙන. අප ඒ විශාල රට එක්ක ඉන්න ඕනෙ, මිත්‍රභාවයෙන් ඉන්න ඕනෙ. අන්න ඒක කරන්නයි මගේ බලාපොරොත්තුව.

අද රජීව් ගාන්ධි සම්පූර්ණයෙන්ම ආධාර දෙනව අපේ වැඩ කටයුතුවලට. අප එකඟ වුණොත් ද්‍රවිඩ සංගමය එක්ක, එතකොට තමිල්නාඩුව අපට පක්ෂ වෙනව. ඉන්දියාවෙ මධ්‍යම ආණ්ඩුව අපට පක්ෂ වෙනව. ලෝකයේ අනික් ආණ්ඩු අපට පක්ෂ වෙනව. ලංකාවෙ කවුරු කවුරුත් එක්කහු වුනොත් ත්‍රස්තවාදීන්ගෙ විරුද්ධකම් තවත් වැඩි කාලයක් යන්නෙ නැතුව පරාජයට පත් කරන්න පුළුවන්. අන්න ඒකයි මගෙ අරමුණ. ඒකට තමුන්නාන්සෙලා ආධාර දෙනව නම් දෙන්න. නොදෙනව නම් නොදෙන්න. අපේ මාර්ගයෙ අපි යනවා. අපියි කපල තියෙන්නෙ ඒ මාර්ගය. අපියි පාලම හදල තියෙන්නෙ. අපියි කැලෑව එළි කරල තියෙන්නෙ. අපයි ගල් දල පාර හදල තියෙන්නෙ. අපි යනව නුවරට. තමුන්නාන්සේලා අපත් එක්ක එන්න. දැන් ස්වාමින්වහන්සේලා දනෙ වළඳන්න යන නිසා මගෙ කථාව ඉවර කරනව. අපි මෙව තවත් දුරට කථා කරනව මහා සභාවෙදි. රොනී ද මෙල් මහත්මය දැන් තමුන්නාන්සේලාට කථා කරයි, ඉතිහාසය කියන්න, මේ ප්‍රශ්න ගැන.

මෙ පලාත් සභා ගැන. විස්තර මම මහා සභාවෙදි කථා කරත්තම්. අප ඉතිහාසය දැනගත්ත ඕනෙ. ඉතිහාසයෙත් තමයි මේ ඔක්කොම ප්‍රශ්න ඇතිවෙලා තියෙත්තෙ. කොහොමද මේව ඇතිවුණෙ ? මම එය විසදත්තම්. මොකක්ද ලෙඩේ ? යම් කෙනෙක් ලෙඩකිත් අමාරුවෙ වැටිල ඉත්තව තම් වෙද මහත්තය ඉස්සෙල්ල හොයත්තෙ මොකක්ද මේ ලෙඩේ හේතුව කියල. ඒ හේතුවටයි බෙහෙත් දෙත්තෙ. එතකොට ලෙඩෙත් නැතිවෙනව. ඒ හේතුව සොයාගෙන බෙහෙත් දෙත්තයි අප මෙ යෝජනා කරත්තෙ කියල මතක් කරත්ත සතුටුයි. මම ආරාධනය කරනව රොනී ද මෙල් මහත්මයට තමුත්තාත්සෙලාට කථා කරත්ත කියල.

අහිංසාවාදයෙන් ඕනෑම
විරුද්ධ මතයක්
විරුද්ධභාවයක් ප්‍රකාශ
කරන්න පුළුවන්

REFERENCE

සැකසුම ලක්ෂ්මි පීරිස්
ජනාධිපති කාර්යාලයේ ප්‍රකාශනයකි.
මුද්‍රණය : රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව